# රණවිරුවා

2023 ඔක්තෝබර් • 260 කලාපය



74 වන
සංවත්සරය
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
1949 - 2023



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර



# කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ පැවති උපාධි ප්‍රදානෝත්සවය







ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ කළමනාකරණ, ඉංජිනේරු, තාක්ෂණ විද්‍යා, වාණිජ සහ කලා ඇතුළු විවිධ අධ්‍යයන විෂයන්ගේ අධ්‍යයන කටයුතු සාර්ථකව නිමකරන ලද උපාධි අපේක්ෂකයින් සඳහා වූ උපාධි ප්‍රදානෝත්සවය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී ඉකුත් ඔක්තෝබර් මස 04 වන දින පැවැත්විණ.

මෙම උත්සවයේදී උපාධි අපේක්ෂකයින් සඳහා "දර්ශනපති", "ශාස්ත්‍රපති" සහ "ශාස්ත්‍රවේදී" යන උපාධි පිරිනැමුණු අතර, එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහභාගී විය. එහිදී, ජනාධිපතිතුමන් සියලුම උපාධිධාරීන් වෙත සිය සුබපැතුම් පිරිනමා ඔවුන්ගේ අධ්‍යයන ක්ෂේත්‍රයන් මගින් ලැබූ විශිෂ්ට ජයග්‍රහණ ඇගයීමටද ලක්කළේය.

එම උත්සව අවස්ථාවට ජනාධිපති කාර්යය මණ්ඩල ප්‍රධානී සහ ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යේෂ්ඨ උපදේශක සාගල රත්නායක මහතා, ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික), කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ කුලපති ජෙනරාල් එස්එච්එස් කෝට්ටේගොඩ (විශ්‍රාමික), ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු, නාවික හා ගුවන් හමුදාධිපතිවරු, පොලිස්පති ඇතුළු තවත් විශාල පිරිසක් සහභාගී වූහ.

## දක්ෂිණ අධිවේගී මාර්ගයේ අවහිරතා ඉවත් කිරීමේ කටයුතු නිරීක්ෂණය කෙරේ...

පසුගියදා ඇති වූ ධාරානිපාත වර්ෂාව හේතුවෙන් දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදූව සහ පින්නදූව අන්තර් හුවමාරුව අතර කිලෝමීටර් 102 කණුව අසල පස් කන්දක් කඩාවැටිණ. එහිදී, එය ඉවත් කිරීම සඳහා 61 වන පාබල සේනාංකය යටතේ ස්ථාපිත 2(සෙව) ගැමුණු හේවා බළඇණියේ භටපිරිස් සිය දායකත්වය ලබාදුන්හ. ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ද යුද්ධ හමුදා භටපිරිස් විසින් සිදුකරනු ලැබූ එම ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම සඳහා එක්වූහ.





## ගංවතුරින් විපතට පත්වූවන්ගේ තතු සොයා බැලීමට යුද්ධ හමුදාධිපති එක්වේ

අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් ඇති වූ ගංවතුරින් විපතට පත් මාතර දිස්ත්‍රික්කයේ ජනතාවට යුද්ධ හමුදාව විසින් සිදුකරන සහන සැලසීමේ කටයුතු නිරීක්ෂණය සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් ඔක්තෝබර් 07 වන දින සංචාරයක නිරත වූයේය.

අධික වර්ෂාව හේතුවෙන් මාතර දිස්ත්‍රික්කයේ මාලිම්බඩ සහ අත්තුඩාව යන ප්‍රදේශයන්හි වත්මන් තත්වය පිළිබඳව 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ඒජේඑන් රණසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී විසින් යුද්ධ හමුදාධිපති වෙත එහිදී විස්තර කරන ලදී. අනතුරුව, යුද්ධ හමුදාධිපති මාතර දිස්ත්‍රික් ලේකම්වරයා හමුවී මානුෂීය ආධාර ලබාදීමේ කටයුතු අඛණ්ඩව සිදුකිරීම පිළිබඳවද සොයාබැලීය. තවද, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම්වරයාද හමුවූ හෙතෙම යුද්ධ හමුදාව විසින් ආපදාවට පත්වූවන්ට පිසූ ආහාර ලබාදීම සඳහා එම කාර්යාල පරිශ්‍රයේම පවත්වාගෙන යන මුළුතැන්ගෙයද නිරීක්ෂණය කළේය. එමගින් දිනකට 3000 කට අධික පිරිසකට පිසූ ආහාර ලබාදීමේ කටයුතු සිදුකෙරුණු අතර, යුද්ධ හමුදාධිපති එහි භටපිරිස් සමගද සුහද කතාබහක නියැළිණ.

මෙම නිරීක්ෂණ චාරිකාව සඳහා ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එච්කේඑස් පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ, 613 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් කේඒඩීඑන්ආර් කන්නන්ගර ආර්එස්පී අයිජී ඇතුළු නිලධාරීහු පිරිසක්ද එක්වූහ. මෙම සංචාරය අතරතුර යුද්ධ හමුදාධිපති මාලිම්බඩ ප්‍රදේශයේද නිරීක්ෂණය සඳහා පැමිණි අතර, එහිදී ජල මට්ටම ඉහළ යාම හේතුවෙන් අත්තුඩාව වැව් බැම්ම කැඩියාම වැළැක්වීම සඳහා යුද්ධ හමුදා භටපිරිස් අඛණ්ඩව වැලි කොට්ට යොදා සිදුකරන ලද ආරක්ෂිත ක්‍රියාමාර්ගද නිරීක්ෂණය කළේය.










ශ්‍රී ලංකාවාසීන් දශක තුනකට අධික කාලයක් පුරා ත්‍රස්තවාදයෙන් පීඩාවිඳි යුගය අවසන් කරමින් මව්බිමට තිරසාර සාමය උදාකරදීම වෙනුවෙන් "ජාතියේ ආරක්ෂකයා" වශයෙන් පෙරමුණ ගෙන කටයුතු කරනු ලැබූ අභිමානවත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ගෙවුණු ඔක්තෝබර් මස 10 දිනට වසර 74 ක් සපිරිණ. එය සමරනු වස් පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේදී අභිමානවත්ව සංවිධානය කෙරුණු සැමරුම් උත්සවයට ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූහ.

මෙවර යුද්ධ හමුදා දින පෙළපාලියේ අණදෙන නිලධාරී ලෙස යුද්ධ හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී සහ දෙවන අණදෙන නිලධාරී ලෙස බ්‍රිගේඩියර් එස්පී මලවරගේ ආර්එස්පී යූඑස්පී අයිජී කටයුතු කරනු ලැබූහ. යුද්ධ හමුදාවේ සියලු රෙජිමේන්තු නියෝජනය කරමින් නිලධාරීන් 85 දෙනකු සහ සෙසුනිලයන් 650 දෙනකුගේ සහභාගත්වයෙන් පැවති එම සම්මාන පෙළපාලිය මගින් යුද්ධ හමුදාධිපති වෙත සම්ප්‍රදායානුකූල ගෞරවාචාරය පිරිනමන ලදී. මෙම උත්සවයට සුවිශේෂත්වයක් එක්කරමින්, යුද්ධ හමුදාවේ අභිමානය වෙනුවෙන් විශිෂ්ට මෙහෙවරක නිරත වූ යුද්ධ හමුදා සාමාජිකයින් 43 දෙනකු වෙත යුද්ධ හමුදාධිපති ප්‍රශංසනාත්මක ලාංඡන පැළඳවීම ද ප්‍රධාන ආරාධිත අමුත්තා අතින් සිදුකෙරිණ. එම යුද්ධ හමුදා සාමාජිකයන්ගේ නිර්භීතභාවය, අවංකභාවය මෙන්ම ජීවිත පරිත්‍යාගයෙන් හඳිසි අවශ්‍යතාවයන් හිදී සිදුකළ ජාතික මෙහෙවර ඇගයීමට ලක්කරමින් මෙම ලාංඡන ඔවුන් වෙත පිරිනමනු ලැබීය.








යුද්ධ හමුදාධිපති එදින සංවත්සර පෙළපාලිය අමතමින් හිටපු යුද්ධ හමුදාධිපතිවරුන්, දිවංගත සහ රණකම්ිනයට පත් වීරෝදාර රණවිරුවන්, සේවයේ නියුතු නිලධාරීන්, සෙසුනිලයන් සහ සිවිල් කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් එදාමෙදා තුර යුද්ධ හමුදාවේ උන්නතිය වෙනුවෙන් ඉටුකළ කාර්යභාරය සිහිපත් කරමින් ඔවුන් වෙත සිය ගෞරවය පුදකළේය. අනාගතයේදීත් මව්බිමේ අභිවෘද්ධිය වෙනුවෙන් සියලු යුද්ධ හමුදා සාමාජිකයන්ගේ කැපවීම අඛණ්ඩව අපේක්ෂා කරන බවද දැනුම් දුන්නේය. එමෙන්ම, සියලු ශ්‍රී ලාංකිකයන්ගේ යහපැවැත්ම තහවුරු කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට යුද්ධ හමුදාවක් වශයෙන් ඉටුකළ යුතු කාර්යය සැමවිටම කැපවීමෙන් යුක්තව ඉටුකළ යුතු බව ද එහිදී එතුමන් අවධාරණය කළේය. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සම්පත් කළමනාකරණයෙහිලා ආදර්ශයක් වීමට නිරන්තරයෙන් උත්සාහ කරන අතර, ආර්ථික පුනර්ජීවනය සඳහා වන ජාතික ප්‍රයත්නයන් උදෙසා උපරිම සහයෝගය ලබාදෙන බව ද හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය.





# කතරගම කිරිවෙහෙර පුදබිමේදී යුද්ධ හමුදා ධජයන්ට සෙත් පතයි

74 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව යුද්ධ හමුදා ධජයන්ට සෙත් පැතීමේ ආශිර්වාද පූජාවක් පසුගිය ඔක්තෝබර් මස 02 වන දින ඓතිහාසික කතරගම කිරිවෙහෙර අභියසදී හා කතරගම දේවාල පරිශ්‍රයේදී යුද්ධ හමුදාධිපති ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහිදී, යුද්ධ හමුදා ධජයන් පෙරටු කරගත් නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් ද මෙම ආශිර්වාද පූජාව සඳහා එක්වූහ.



එම අවස්ථාවේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් කතරගම ඓතිහාසික පුදබිමේ සංවර්ධන කටයුතු සඳහා මෙන්ම කතරගම දේවාලයේ සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය පරිත්‍යාගයක් ද සිදුකරන ලදී.

පූජනීය කිරිවෙහෙර පරිශ්‍රයේ පළමු මහලේ ටයිල් අතුරා අර්ධ වශයෙන් ඉදිකරන ලද විහාර මන්දිරයේ ඉතිරි කටයුතු ද යුද්ධ හමුදාධිපතිගේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද අතර, ඒ සඳහා යුද්ධ හමුදා හටපිරිස් දායකත්වය ලබාදෙනු ලබති.



# 74 වන යුද්ධ හමුදා සංවත්සරයට ආශිර්වාද එක්කෙරේ





74 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව සංවිධානය කෙරුණු කිතුනු ආශිර්වාද දේව මෙහෙයක් කොළඹ රදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ඔක්තෝබර් 03 වන දින සන්ධ්‍යාවේ බොරැල්ල, සියලු සාන්තුවරුන්ගේ දේවස්ථානයේදී පැවැත්විණ.

එම අවස්ථාවට යුද්ධ හමුදා ක්‍රිස්තියානි සංගමයේ සභාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී වීඑස්වී යූඑස්පී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ප්‍රධානත්වය දැරීය. දේව මෙහෙය අවසානයේදී, ජනතාවගේ අධ්‍යාත්මික සුවය, සංහිඳියාව සහ සාමය ඇතිකිරීම උදෙසා එම දේවස්ථානය විසින් සිදුකරනු ලබන ආගමික සේවාව අගය කරමින් යුද්ධ හමුදාධිපති විසින් රදගුරුතුමන් වෙත මූල්‍ය පරිත්‍යාගයක්ද සිදුකරන ලදී.





# කොල්ලුපිටිය ජුම්මා පල්ලියේ විශේෂ ඉස්ලාමීය ආගමික වැඩසටහනක්

74 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව සිදුකරනු ලබන ආශිර්වාද වැඩසටහන් මාලාවේ තවත් එක් ආශිර්වාද පූජාවක් පසුගිය ඔක්තෝබර් 04 වන දින උදෑසන කොල්ලුපිටිය, ජුම්මා මුස්ලිම් පල්ලියේදී පැවැත්විණි. එහිදී, යුද්ධ හමුදා සේවයේ නියුතු මුස්ලිම් නිලධාරීන් සහ සෙසු නිලයන් විසින් ඉස්ලාමීය ආගමික වතාවත් සිදුකර යුද්ධ හමුදා සංවත්සරයට ආශිර්වාද එක්කරනු ලැබිය.



බ්‍රිගේඩියර් ටීඑම්එෆ් කිච්ලන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, යුද්ධ හමුදා මුස්ලිම් සංගමයේ ලේකම් ලුතිනන් කර්නල් ටීඑම්පී ජලාල් සහ කොල්ලුපිටිය ජුම්මා මුස්ලිම් පල්ලියේ භාරකාර මණ්ඩලයේ සාමාජිකයින් විසින් එහිදී උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සපැමිණි යුද්ධ හමුදාධිපති උණුසුම් අයුරින් පිළිගත්හ.

මෙම ආගමික උත්සවය අවසානයේදී ඉස්ලාමීය පූජනීය සිද්ධස්ථානයේ සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය පරිත්‍යාගයක් ද සිදුකළ යුද්ධ හමුදාධිපති, රට තුළ පවතින සහජීවනය, සමගිය සහ සංහිඳියාව පිළිබඳව මෙන්ම යුද්ධ හමුදාවේ ඉදිරි දැක්ම පිළිබඳව ද මවුලවිතුමන්ලා සමගින් සුහදව අදහස් හුවමාරු කරගත්හ. උත්සව අවස්ථාවට සිවිල් ඉස්ලාම් භක්තික බැතිමතුන් සමගින් යුද්ධ හමුදාවේ සේවයේ නියුතු ඉස්ලාම් භක්තික සාමාජිකයින් පිරිසක්ද සහභාගී වූහ.

# හින්දු ආගමික ආශිර්වාද ලබාගැනේ






ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අභිමානවත් 74 වන සංවත්සර දිනයට සමගාමීව පැවති හින්දු ආගමික ආශිර්වාද පූජාව ද කොළඹ 06, මයුරපති ශ්‍රී බද්‍රකාලි අම්මාන් කෝවිල් පරිශ්‍රයේදී පසුගිය ඔක්තෝබර් 05 වන දින පැවැත්විණි.

යුද්ධ හමුදා හින්දු සංගමයේ සභාපති බ්‍රිගේඩියර් කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් එම අවස්ථාවට ප්‍රධාන ආරධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති සහභාගී විය.

එහිදී, යුද්ධ හමුදාවට ආශිර්වාද පතා යුද්ධ හමුදා ධජයන්ට ආශිර්වාද එක්කරන ලදී. ආගමික වතාවත්වලින් අනතුරුව යුද්ධ හමුදාධිපති විසින් එම කෝවිලේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රධාන පූජක පෙරියස්වාමි සුන්දරලිංගම් වෙත මූල්‍ය පරිත්‍යාගයක්ද සිදුකරන ලදී.





## යුද්ධ හමුදා මූලස්ථානයේදී සර්ව රාත්‍රික ආශීර්වාද

# පිරිත් සජ්ඣායනයක්



**74** වන යුද්ධ හමුදා සංවත්සරයට ආශීර්වාද පතා සංවිධානය කෙරුණු සර්ව රාත්‍රික "පිරිත් සජ්ඣායනයක්" ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේදී පසුගිය ඔක්තෝබර් මස 05 වන දින පැවැත්විණ. යුද්ධ හමුදාවේ අභිවෘද්ධිය වෙනුවෙන් ආශිර්වාද එක්කරමින් පැවැත්වුණ ආගමික උත්සවයන්හි අවසන් අංගය එය විය. ඒ සඳහා කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ මහා නායක ආචාර්ය ඉත්තෑපාන ධම්මාලංකාර නායක ස්වාමීන් වහන්සේ, රුක්මලේ ධම්ම විජයාලෝක විහාරාධිපති සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති ආචාර්ය අලුත්නුවර අනුරුද්ධ හිමියන්, කෝට්ටේ රජ මහා විහාරයේ සහ ඇලන් මෙතිනියාරාමයේ විහාරාධිපති පූජ්‍ය උඩුවේ ධම්මාලෝක හිමි සහ තවත් හිමිවරු කිහිප නමක් වැඩම කළහ.

යුද්ධ හමුදා බෞද්ධ බල මණ්ඩලයේ සභාපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ ආරාධනයකට අනුව එම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ප්‍රධානත්වය දැරූහ. මෙම සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනය සඳහා යුද්ධ නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් එක්වූහ.




# විරෝදාර රණවිරුවන් සිහිපත් කෙරේ



මව්බිමේ ඒකීයභාවය වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන්ගේ අමිල මෙහෙවර සිහිපත් කිරීමේ රණවිරු සැමරුම් උත්සවය බත්තරමුල්ල රණවිරු ස්මාරකය අභියසදී පසුගිය ඔක්තෝබර් 06 වන දින සන්ධ්‍යාවේ පැවැත්විණි.



74 වන යුද්ධ හමුදා සංවත්සරය නිමිති කොටගෙන පැවැත්වුණ මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.

මීට වසර 14 කට ප්‍රථම අප වීරෝදාර රණවිරුවන් ත්‍රස්තවාදය තුරන් කරමින් රට එක්සේසත් කිරීමට දැක්වූ නිර්භීත දායකත්වය ඇගයීමට ලක්කරමින් රට තුළ සාමය ස්ථාපිත කිරීම වෙනුවෙන් තම වටිනා ජීවිත පරිත්‍යාග කළ දහස් සංඛ්‍යාත රණවිරුවන්ගේ වීරත්වයට යුද්ධ හමුදාව වෙතින් දක්වනු ලබන ගෞරවාචාරය සංකේතවත් කරමින් මෙම රණවිරු සැමරුම් උත්සවය පැවැත්වේ.



හිරු නැගෙනා මොහොතෙදීත් හිරු බසිනා මොහොතෙදීත් රට වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන් වෙනුවෙන් හමුදා සම්ප්‍රදායානුකූලව වැයෙන යුද්ධ හමුදා තූර්යවාදක බියුගල් නාදය ගුවනට මුසුවෙද්දී එදින උත්සවයේ සමාප්තිය සනිටුහන් වූයේ ඊට සහභාගී වූ සැමගේ හදවත් තුළ රැඳී ගෞරවනීය මතක ආවර්ජනය අතරේය.





# දැනුම දිනුමට සත්කාරයක්





74 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් යුද්ධ හමුදා පවුල්වල සිසුන් සඳහා පාසල් උපකරණ බෙදාදීමේ උත්සවයක් ඉකුත් ඔක්තෝබර් මස 11 වන දින දියත් කරන ලදී.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මියගේ ආරාධනයෙන් එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය. මෙම ව්‍යාපෘතිය මගින් පාසල් උපකරණ ඇතුළත් ත්‍යාග පාර්සල් 122 ක් සිසුන් වෙත බෙදාදෙන ලද අතර, එහිදී තෝරාගත් ප්‍රතිලාභීන් පිරිසක් සඳහා ලංකා බැංකුවේ ළමා ඉතුරුම් ගිණුම් ද ආරම්භ කරනු ලැබීය.

තවද, යුද්ධ හමුදා සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි තුෂාරි වනිගසේකර මහත්මිය වෙත ඔවුන්ගේ යෝගට් ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම සඳහා මූල්‍ය අනුග්‍රහයක් සහ යෝගට් සීල් යන්ත්‍ර දෙකක් ද යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ සුරතින් පරිත්‍යාග කෙරිණ.

එමෙන්ම විශේෂ අවශ්‍යතා ඇති තම දරුවාට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් සලසා ගැනීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ සැරයන් මේජර්වරයකු වෙත රුපියල් 200,000/= ක මූල්‍ය පරිත්‍යාගයක් පිරිනැමීමද එහිදී සිදුවිය.



# උසස්වීම් ලැබූ මේජර් ජෙනරාල්වරුන් වෙත යුද්ධ හමුදාධිපතිගේ සුරතින් නිල ලාංඡන

ඉකුත් ඔක්තෝබර් මස 10 දිනට යෙදුනු 74 වන යුද්ධ හමුදා සංවත්සර දිනයට සමගාමීව බ්‍රිගේඩියර් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 07 දෙනකු මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූහ. එම නිලධාරීන් වෙත යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් ඉකුත් ඔක්තෝබර් මස 09 වන දින සංකේතාත්මකව නිල ලාංඡන පළඳවනු ලැබීය.

මේජර් ජෙනරාල් ආර් ඇල්විටිගල යූඑස්පී, මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී, මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්පීඑම් විජේසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, මේජර් ජෙනරාල් ඩබ්ලිව්පී කාරියවසම්, මේජර් ජෙනරාල් කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සහ මේජර් ජෙනරාල් එච්එච්කේඑස්එස් හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී යන නිලධාරීහු එලෙස යුද්ධ හමුදාධිපතිගේ සුරතින් නිල ලාංඡන හිමිකරගනු ලැබූහ. එහිදී, එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ආමන්ත්‍රණය කරමින් රටේ ආරක්ෂාව සහ සෞභාග්‍යය වෙනුවෙන් ඉදිරියේදී වඩාත් කැපවීමෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ද යුද්ධ හමුදාධිපති ඔවුන්ව දැනුම්වත් කළේය.



තවද, 74 වන යුද්ධ හමුදා සංවත්සර දිනයට සමගාමීව උසස්වීම් ලැබූ ආඥාපති ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) මේජර් ජෙනරාල් ඩීඒ අමරසේකර යූඑස්පී වෙත ඉකුත් ඔක්තෝබර් මස 10 වන දින යුද්ධ හමුදාධිපති ගේ සුරතින් නිල ලාංඡන පළඳවා සංකේතාත්මක අසිපත පිරිනමනු ලැබීය.



උසස්වීම් ලැබූ මේජර් ජෙනරාල් කේඑච්එම්එස් වික්‍රමරත්න ආර්එස්පී සහ අධ්‍යක්ෂ ජෙනරාල් සුබසාධන මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එස්සීකේ වනසිංහ ආර්එස්පී යූඑස්පී වෙතද ඉකුත් ඔක්තෝබර් මස 16 වන දින යුද්ධ හමුදාධිපති විසින් නිල ලාංඡන පළඳවනු ලැබීය.



# ආසියානු ක්‍රීඩා උළෙලේ විශිෂ්ටයින්ට නිල උසස්වීම්

චීනයේ හැන්ග්ෂෝ ප්‍රදේශයේ පසුගියදා පැවති "19 වන ආසියානු ක්‍රීඩා උළෙලේ" දක්ෂතා දැක්වූ යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ ඉකුත් ඔක්තෝබර් 11 වන දින උදෑසන යුද්ධ හමුදා මූලස්ථානයේදී ඇගයුමට පාත්‍රවූහ. යුද්ධ හමුදා මූලස්ථානය වෙත පෙරහැරකින් කැඳුව ආ ඔවුන් එහිදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් ඇගයීමට ලක්කර ඔවුන් වෙත නිල උසස්වීම්ද ලබාදෙන ලදී.

19 වන ආසියානු ක්‍රීඩා උළෙලේදී යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් හෙල්ල විසිකිරීම, මීටර් 400 X 4 සහය දිවීම සහ ක්‍රිකට් (කාන්තා) යන ඉසව්වලින් යුද්ධ හමුදාවට සහ මව්බිමට කීර්තියක් අත්කර දෙමින් පදක්කම් දිනාගැනීමට සමත් වූහ. මෙම තරගාවලිය සඳහා යුද්ධ හමුදාව නියෝජනය කරමින් මලල ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 8 ක් සහ කාන්තා ක්‍රිකට් ක්‍රීඩිකාවන් 4 දෙනකු සහභාගී වූහ. යුද්ධ හමුදා මූලස්ථානයේ පැවති මෙම උත්සව අවස්ථාව සඳහා ක්‍රීඩා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් පීඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී ද සහභාගී විය.










# අන්තර් රෙජිමේන්තු ක්‍රීඩා ශූරතාවලිය - 2023

"අන්තර් රෙජිමේන්තු ක්‍රීඩා ශූරතාවලිය - 2023" හි ත්‍යාග ප්‍රදානෝත්සවය යුද්ධ හමුදාධිපති ගේ ප්‍රධානත්වයෙන් පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී ඉකුත් ඔක්තෝබර් 26 වන දින පැවැත්විණ.

2023 වර්ෂයේ දක්ෂතම ක්‍රීඩා තරු තෝරාගැනීමේ අරමුණින් රට පුරා විවිධ රෙජිමේන්තු නියෝජනය කරනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සහභාගීත්වයෙන් පැවති මෙම තරගාවලිය ඉසව් 40 ක් යටතේ පැවැත්විණ. යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මළල ක්‍රීඩා හැකියාවන් ඉහළ නංවා ඔවුන්ව ජාතික හා ජාත්‍යන්තර තලයට ඔසවා තැබීම මෙම අන්තර් රෙජිමේන්තු ක්‍රීඩා ශූරතාවලියේ අරමුණයි.



මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සැපැමිණි යුද්ධ හමුදාධිපති ක්‍රීඩා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් පීඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය, ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය සහ ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධව නිර්මාණය කරන ලද යුද්ධ හමුදා ක්‍රීඩා විද්‍යුත් ඇල්බමය එළිදැක්වීමද සිදුවිය.



පසුගියදා චීනයේ හැංචෝ ප්‍රදේශයේ පැවති 19 වන ආසියානු ක්‍රීඩා උළෙලේදී ජාත්‍යන්තර ජයග්‍රහණ ලබාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් මුදල් පරිත්‍යාග කිරීමද එහිදී යුද්ධ හමුදාධිපති අතින් සිදුවිය.

# පාකිස්ථාන යුද්ධ හමුදා විද්‍යාපීඨයේ විසිරයාමේ උත්සවයකට යුද්ධ හමුදාධිපති එක්වේ



පාකිස්ථාන යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඉෆ්තිකාර් හසාන් චවුද්‍රි (Major General lftikhar Hassan Chaudhary) ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු, ඉකුත් ඔක්තෝබර් මස 21 වන දින පකිස්ථානයේ කාකුල් (Kakul) හි යුද්ධ හමුදා විද්‍යාපීඨයේ පැවති කෙඩෙට් නිලධාරී විසිරයාමේ පෙළපාලියෙහි ගෞරවනීය ආරාධිතයකු ලෙස සහභාගී විය.



යුද්ධ හමුදාධිපති මීට වසර කිහිපයකට පෙර එම විද්‍යාපීඨයේ වත්මන් සේනාවිධායක සමගින් එම විද්‍යාපීඨයේම පාඨමාලාවක් ද හදාරා තිබීම විශේෂත්වයකි. එහිදී, කෙඩෙට් නිලධාරීන් විසින් විසිරයාමේ පෙළපාලිය අතරතුරදී යුද්ධ හමුදාධිපති වෙත හමුදා සම්ප්‍රදායානුකූල සම්මාන මුරයේ ගෞරවාචාරයද පිරිනමනු ලැබීය.

එම විද්‍යාපීඨයේ පුහුණුව ලබන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෙඩෙට් නිලධාරීන් දෙදෙනකු ද මෙම විසිරයාමේ පෙළපාලියට එක්ව සිටියහ. යුද්ධ හමුදාධිපති එහිදී ඔවුන් දෙදෙනා සහ විදේශීය කෙඩෙට් නිලධාරීන් සමග සුහදව අදහස් හුවමාරු කරගත් අතර, මේජර් ජෙනරාල් ඩීපී වෙලගෙදර ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී අයිජී ගේ පුතුණුවන්ද එම විසිරයන ලද කෙඩෙට් නිලධාරීන් අතර වීම විශේෂත්වයකි. එම උත්සව අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය සහ හමුදා සම්බන්ධීකරණ නිලධාරී ද සහභාගී වූහ.



# පාකිස්ථාන හමුදාවේ දායකත්වය යුද්ධ හමුදාධිපතිගේ පැසසුමට



ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පසුගියදා පාකිස්ථානයේ නිල සංචාරයක නිරත විය. එහිදී, පාකිස්ථානයේ යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් අසීම් මුනීර් එන්අයි (එම්) (General Asim Munir NI (M)) හමුවිය. දෙරට හමුදා ප්‍රධානීන් අතර පැවති මෙම සුහද හමුවේදී ද්විපාර්ශ්වික ආරක්ෂක සබඳතා තවදුරටත් වර්ධනය කරගැනීමේ හැකියාව පිළිබඳව ද සාකච්ඡා කෙරිණ. යුද්ධ හමුදාධිපති එහිදී කලාපීය සාමය, ආරක්ෂාව සහ ස්ථාවරත්වය සඳහා පාකිස්ථාන හමුදාවේ වෘත්තීමයභාවය සහ දායකත්වයද ඇගයීමට ලක්කළේය.

ත්‍රිවිධ හමුදාවේ ආරක්ෂක හා පුහුණු ක්ෂේත්‍රයන්හි මෙරට සහ පාකිස්ථාන සන්නද්ධ හමුදාවන්ගේ මිත්‍රශීලීභාවය, ඓතිහාසික සබඳතා, සහයෝගීතාව සහ අවබෝධය පිළිබඳව ද එහිදී පාකිස්ථාන හමුදා ප්‍රධානී විසින් අවධාරණය කළේය. දෙරට හමුදාවන් අතර පවතින හුවමාරු වැඩසටහන් සහ විශේෂිත පුහුණු පාඨමාලාවන් තවදුරටත් වැඩිදියුණු කිරීමේ හැකියාව පිළිබඳව ද එහිදී සාකච්ඡා කෙරිණ.



# විශ්‍රාමික යුද්ධ හමුදාධිපති ගේ අවසන් කටයුතු හමුදා ගෞරවාචාර මධ්‍යයේ



අභාවප්‍රාප්ත ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 16 වන යුද්ධ හමුදාධිපති ජෙනරාල් එල්පී බලගල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී අයිජී ගේ අවසන් කටයුතු පසුගිය ඔක්තෝබර් 28 වන දින සන්ධ්‍යාවේ බොරැල්ල පොදු සුසාන භූමියේදී සිදුකෙරිණ. එහිදී, හමුදා ගෞරවාචාර මධ්‍යයේ අවසන් කටයුතු සිදුකෙරුණු අතර, එම ශෝකාකුල අවස්ථාව සඳහා හිටපු හමුදාධිපතිවරු, ආරක්ෂක ලේකම්, යුද්ධ හමුදාධිපති, සේවයේ නියුතු සහ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් සහ ඔවුන්ගේ භාර්යාවන් රැසක් සහභාගී වූහ.

යුද්ධ හමුදාධිපති විසින් නිකුත් කරන ලද විශේෂ නියෝග I (Special Part I Order) අවමංගල්‍ය සභාව ඉදිරියේ ප්‍රකාශ කිරීමෙන් අනතුරුව, හමුදා නිලධාරියකුට ලැබිය හැකි ඉහළම ගෞරව උපහාරය ලබාදෙමින් යුද්ධ හමුදා සාමාජිකයින් විසින් වෙඩි මුර ගුවනට මුසු කරමින් දිවංගත හමුදාධිපතිතුමන් වෙත අවසන් ගෞරවාචාර පුදකරනු ලැබූහ. පසුව, හිරු නැගෙනා මොහොතේදිත් හිරු බැස යන මොහොතේදිත් වැයෙන යුද්ධ හමුදා බියුගල් නලා හඬ මධ්‍යයේ එතුමන්ගේ අවසන් ගමන සිදුවෙද්දී යුද්ධ හමුදාවටත්, රටටත් එතුමන් සිදුකළ අනුපමේය සේවය ඇගයීමට ලක්කරමින් ගෞරවාචාර වෙඩි මුරයක්ද පුදකරනු ලැබීය.

වසර 39 කට අධික සේවා කාලයක් සපිරූ දිවංගත ජෙනරාල් එල්පී බලගල්ල විශ්‍රාමික යුද්ධ හමුදාධිපතිතුමා 2000 සිට 2004 වර්ෂය දක්වා යුද්ධ හමුදාධිපති ධුරය හොබවන ලදී. ඉහළම වෘත්තීයභාවයක් මෙන්ම උපරිම කැපවීමකින් යුතුව කටයුතු කළ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වූ එතුමන් ත්‍රස්තවාදයට එරෙහිව තීරණාත්මක අවධියේදී යුද්ධ හමුදාධිපති ධුරයේ මෙන්ම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ධුරය ද හොබවමින් මව්බිම වෙනුවෙන් සිය දායකත්වය ලබාදුන් පරිනත යුද සෙන්පතියෙකි.

# සුහද හමුවක මතක සටහන්



ශ්‍රී ලංකාව, භූතානය, මාලදිවයින, නේපාලය සහ බංගලාදේශය යන රටවල් නියෝජනය කරමින් ඉන්දියාවේ නවදිල්ලි නුවර පිහිටි කෙන්යානු මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කර්නල් බැසිල් මුවාම්බින්ගු මුවාකලේ (*Colonel Basil Mwambingu Mwakale*) ඉකුත් ඔක්තෝබර් මස 17 වන දින මෙරට නිල සංචාරයක නිරත වෙමින් යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවිය.

ශ්‍රී ලංකාව, නේපාලය සහ බංගලාදේශය යන රටවල් නියෝජනය කරමින් ඉන්දියාවේ නවදිල්ලි නුවර පිහිටි ජර්මානු තානාපති කාර්යාලයේ නියෝජ්‍ය ආරක්ෂක උපදේශක ලුතිනන් කර්නල් ඇන්ඩ්‍රේ නිඩ්හෝෆර් (*Lieutenant Colonel Andre Niedhoefer*) සහ ආරක්ෂක උපදේශක කපිතාන් ජෙරල්ඩ් කෝච් (*Captain Gerald Koch*) ඉකුත් ඔක්තෝබර් 16 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවිය.





ශ්‍රී ලංකාවේ කොරියානු තානාපතිනි මියොන් ලී මහත්මිය (*Ms Miyon LEE*) ඉකුත් ඔක්තෝබර් 06 වන දින ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති සමඟ සුහද සාකච්ඡාවක නිරතවූවාය. එහිදී තානාපතිතුමිය, මෙරට යුද්ධ හමුදාව විසින් ඉටුකරනු ලබන ජාතික මෙහෙවර පිළිබඳව සිය ප්‍රසාදය පළ කළාය.

ධූරයෙන් නික්ම යන ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කපිතාන් විකාස් සූද් (*Captain Vikas Sood*) ඉකුත් ඔක්තෝබර් මස 16 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවිය. එම සුහද හමුවේදී, ද්විපාර්ශවීය කරුණු සහ හමුදා සංවිධාන දෙක අතර දිනෙන් දින වර්ධනය වන සබඳතා පිළිබඳව දෙදෙනා අදහස් හුවමාරු කර ගත්හ.





සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නව අධ්‍යක්ෂ ජෙනරාල් එයාර් වයිස් මාර්ෂල් ආර්එස් බියන්විල ඩබ්ලිව්එස්වී යූඑස්පී එම්බීඊ (එක්සත් රාජධානිය) එන්ඩීසී (ඉන්දියා) පීඑස්සී ඉකුත් ඔක්තෝබර් මස 17 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවිය.

එහිදී, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වත්මන් තත්ත්වය සහ දැනට සිදුකරනු ලබන කාර්ය භාරය පිළිබඳව නව අධ්‍යක්ෂ ජෙනරාල් විසින් යුද්ධ හමුදාධිපති දැනුවත් කරන ලදී.

# ගජබා රෙජිමේන්තුවේ 40 වන සංවත්සරය අභිමානවත් අයුරින් සැමරේ



නිර්භීත සහ වීරත්වයෙන් යුත් පාබල රෙජිමේන්තුවක් වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ගජබා රෙජිමේන්තුව ඉකුත් ඔක්තෝබර් මස 14 වන දින සිය අභිමානවත් 40 වන සංවත්සරය සැමරීය.

වර්ෂ 1983 දී දිවංගත මේජර් ජෙනරාල් විජය විමලරත්න විසින් ආරම්භ කරනු ලැබූ මෙම රෙජිමේන්තුවේ 40 වන සංවත්සර සැමරුම් උත්සවය සාලියපුර ස්ථාපිත රෙජිමේන්තු මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති සහ ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ ගෞරවාචාර මධ්‍යයේ එම අවස්ථාවට එක්වූ යුද්ධ හමුදාධිපති, මේජර් ජෙනරාල් විජය විමලරත්න ගේ පිළිරුව වෙත පුෂ්පෝපහාර පුදකරන්නටද අමතක නොකළේය.



එහිදී, ගජබා රෙජිමේන්තුවේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එච්ටීඩබ්ලිව් විදානනන්ද ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් යුද්ධ හමුදාධිපති උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව නිලධාරීන් 19 සහ සෙසුනිලයන් 427 දෙනකුගෙන් සැදුම්ලත් පෙළපාලියේ ගෞරවාචාරය යුද්ධ හමුදාධිපති වෙත පිරිනමනු ලැබිය.



එහිදී, යුද්ධ හමුදාධිපති විසින් හටපිරිස් ආමන්ත්‍රණය කරමින් මානුෂීය මෙහෙයුමේදී එම රෙජිමේන්තු සාමාජිකයන්ගේ දායකත්වය, එම ප්‍රවීණයන් මවබිම වෙනුවෙන් සිදුකළ කැපකිරීම සහ ගජබා රෙජිමේන්තුවේ වසර 40 ක ගමන් මග පිළිබඳ මතකාවර්ජනය කරනු ලැබිය. එමෙන්ම, රෙජිමේන්තුවේ දිවංගත වීරෝදාර රණවිරුවන් වෙත සිය ගෞරවාචාරය පුදකරමින් රණක්ෂිතයට පත්වූ රණවිරුවන් හට ඉක්මන් සුවය ද ප්‍රාර්ථනා කරනු ලැබිය.




උත්සවයේ සමාප්තිය සනිටුහන් කරමින් සියලු නිල දිවා භෝජන සංග්‍රහයකටද එක්වූ යුද්ධ හමුදාධිපති සුඛෝපභෝගී කාමර 6 ක් සහ පිහිනුම් තටාකයක් ඇතුළු නවීන පහසුකම්වලින් සමන්විත එම රෙජිමේන්තු පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකළ 'King Keterian the Legacy Suite' නම් මහල් 6කින් යුත් ගජබා රෙජිමේන්තු නිවාඩු නිකේතනය ද සිය සුරතින් විවෘත කළේය.

# සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාවක්


ගජබා රෙජිමේන්තුවේ 40 වන සංවත්සරයට සමගාමීව අනුරාධපුර, සාලියපුර පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පසුගිය ඔක්තෝබර් මස 12 සහ 13 දෙදින තුළ සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනයක් පැවැත්විණි. එම පුණ්‍ය අවස්ථාව සඳහා ගජබා රෙජිමේන්තුවේ නිර්මාතෘතුමන්ගේ භාර්යාව වන මානෙල් මංගලිකා විමලරත්න මහත්මිය, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය, දිවංගත සහ රණක්ෂිතයට පත් ගජබා රෙජිමේන්තු සාමාජිකයන්ගේ පවුල්වල සාමාජිකයින්, විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයන්, නිලධාරීන්, සෙසුනිලයන් ඇතුළු ආරාධිතයන් රැසක් සහභාගී වූහ.

මෙහිදී, මහා සංඝරත්නය විසින් දිවංගත සහ රණක්ෂිතයට පත් සියලුම රණවිරුවන්ට සහ රෙජිමේන්තුවේ අනාගත අපේක්ෂාවන් වෙනුවෙන් ආශිර්වාද එක්කළහ. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, ආරක්ෂක සේනා ආඥාපතිවරු, සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු, ගජබා රෙජිමේන්තුවේ මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් සම්බන්ධ වූහ.

2009 මැයි මාසයේදී මානුෂීය මෙහෙයුමේ අවසානය තෙක් බෙදුම්වාදී ත්‍රස්තවාදයට එරෙහිව සිදුකළ සියලුම ප්‍රධාන යුද මෙහෙයුම් සඳහා සක්‍රීයව දායක වූ කීර්තිමත් ගජබා රෙජිමේන්තුව මව්බිම ආරක්ෂා කිරීම වෙනුවෙන් පරාර්ථකාමී සේවයක නිරත වී සිටියි. මව්බිමේ ඒකීයභාවය සුරක්ෂිත කිරීම උදෙසා සිදුකළ මානුෂීය මෙහෙයුමේදී එම රෙජිමේන්තුවේ විරෝදාර නිලධාරීන් 171 දෙනෙක් සහ සෙසුනිලයන් 4067 දෙනෙක් සිය දිවි පූජාකර ඇති අතර නිලධාරීන් 307 දෙනෙක් සහ සෙසුනිලයන් 5646 දෙනකු රණක්ෂිතයටද පත්ව ඇත.















# දිවිපිදු විරුවන් සැමරේ





මවුබිමේ ඒකීයභාවය වෙනුවෙන් ගජබා රෙජිමේන්තුවේ දිවිපිදූ වීරෝදාර රණවිරුවන්ගේ අමිල මෙහෙවර සිහිපත් කිරීමේ රණවිරු අනුස්මරණ උත්සවයක් එම රෙජිමේන්තු 40 වන සංවත්සරයට සමගාමීව සාලියපුර ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථාන රණවිරු ස්මාරකය අභියසදී ඉකුත් ඔක්තෝබර් 13 වන දින පැවැත්විණ.

යුද්ධ හමුදාධිපති සහ ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උත්සවයට වීරෝදාර රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින්, ගජබා රෙජිමේන්තුවේ සේවා මුක්ත භට සංගමයේ සාමාජිකයින්, ජ්‍යේෂ්ඨ නිලධාරීන්, සෙසු නිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.

සුදු වතින් සැරසී එම උත්සව අවස්ථාවට සම්බන්ධ වූ මාතෘභූමිය වෙනුවෙන් දිවිපිදූ ගජබා රෙජිමේන්තුවේ වීරෝදාර රණවිරුවන්ගේ දූ පුතුන්, මව්වරුන් සහ බිරින්දෑවරුන් විසින් තම ආදරණීය යුද විරුවන්ගේ නම් ඉතාමත් ඕනෑකමකින් යුක්තව නිරීක්ෂණය කළ මොහොත ඉතා සංවේදී ජනක දර්ශණයක් විය. 2009 මැයි මාසයට පෙර මෙරටට සාමය උදාකරලීම සඳහා ත්‍රස්තවාදයට එරෙහිව සටන් කළ ගජබා රෙජිමේන්තුවේ නිලධාරීන් 171 දෙනකු සහ සෙසු නිලයින් 4067 දෙනකු මාතෘභූමිය ආරක්ෂා කිරීම සඳහා සිය ජීවිත පරිත්‍යාග කොට ඇත.



# 40 වන ගජබා සංවත්සරය

එදා තිස් වසරක් පැවති ත්‍රස්තවාදී ගිනිදැල් මානුෂීය මෙහෙයුමකින් නිවා දමා ජාතියට නිදහස් හසරැල් උදාකරදී මුළු ශ්‍රී ලංකාවම ඒකජත්‍ර කිරීමේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව දැක්වූ දායකත්වය කොතරම්දැයි කියා නිමකළ නොහැක. යුද්ධය අවසන්වීමෙන් අනතුරුව ජාතිය ගොඩනැගීමේ ව්‍යාපෘතිවලදී ද ශ්‍රී ලංකා යුද්ධ හමුදාව පුහුණු විනයගරුක ශ්‍රම බලකායක් ලෙසින් දැක්වූ දායකත්වය අතිමහත්ය. ඒසේම, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අද වනවිට ජාතියට ඉටු කරන්නේ සුළුපටු සේවයක් නොවේ. 1949 වර්ෂයේ දී ආරම්භ කළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අද වනවිට වසර 74ක් පුරාවට ශ්‍රී ලංකා මාතාවගේ අභිවෘද්ධිය සහ ස්වෛරීභාවය වෙනුවෙන් සේවය කර ඇත.

මෙලෙස සුවිශේෂී සේවාවක් කළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අද වනවිට රෙජිමේන්තු 25 කින් සමන්විතය. ඒ අතරින් සුවිශේෂීම රෙජිමේන්තුවක් වන ගජබා රෙජිමේන්තුවේ 40 වැනි සංවත්සරය ඔක්තෝම්බර් 14 දිනට යෙදී තිබිණ.

ගජබා රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සුවිශේෂීම රෙජිමේන්තුවක් ලෙස හැඳින්වීමට ද හේතුවක් ඇත. ඒ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා, ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) සහ වර්තමාන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මෙන්ම වත්මන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් විකුම් ලියනගේත් ගජබා රෙජිමේන්තුව නියෝජනය කරන සැබෑ රණකාමීන් වීම නිසාය.

1983 වර්ෂයේදී 1 වන රජරට රයිෆල් බලඇණිය හා 1 වන විජයබාහු පාබල රෙජිමේන්තුව ඒකාබද්ධ කර නව ඒකකයක් ස්ථාපනය කරන ලදී. මෙම බලඇණිය රජරට පුරාණ රජවරුන්ගේ රාජධානියෙහි පිහිටවූ බැවින්, ඒ සඳහා සුදුසු නාමයක් ලබාදීමේදී යුද්ධ ශිල්පයේ නිපුණ රණශූරයකු වූ "ඇතකුට සමාන ශක්තිමත් හස්තයක් ඇති" යන අරුත ඇති ලංකා ඉතිහාසයේ රණශූරත්වයෙන් කෙළ පැමිණි රජකු වූ ගජබා නරේන්ද්‍රයාණන්ගේ නාමයෙන් "ගජබා" නමින් නම්කොට, 1 වන බලඇණිය ගජබා රෙජිමේන්තුව නමින් 1983 ඔක්තෝම්බර් මස 14 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එක්විය. මෙහි ප්‍රථම අණදෙන නිලධාරී වශයෙන් එවකට ලුතිනන් කර්නල් විජය විමලරත්න පත්කරන ලදී. අරාලි තුඩුවේදී එල්ටීටීඊය විසින් ඇටවූ පීඩන බෝම්බයකට ගොදුරු වී ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව සමගින් ජීවිතක්ෂයට පත් වූ මේජර් ජෙනරාල් විජය විමලරත්න ගජබා රෙජිමේන්තුවේ පියා වශයෙන් පිදුම් ලබයි.



**වත්මන් ආරක්ෂක ලේකම්**
ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික)



**වත්මන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී**
ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්



**වත්මන් යුද්ධ හමුදාධිපති**
ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ

1983 ඔක්තොම්බර් මස 14 වන දින 2 වන (ස්වේච්ඡා) රජරට රයිෆල් බලඇණිය හා 3 වන (ස්වේච්ඡා) රජරට රයිෆල් බලඇණිය ඒකාබද්ධ කර ගොඩනගන ලද 2/3 වන (ස්වේච්ඡා) රජරට රයිෆල් බලඇණිය දෙවන ස්වෙච්ඡා ගජබා රෙජිමේන්තුව නමින් ත්‍රිකුණාමලය ෆෙඩ්රික් බලකොටුව තුළ ස්ථාපිත කරන ලදී.

ගජබා රෙජිමේන්තුව බලඇණියක් වශයෙන් උපත ලැබුවද, ගජබා සෙබළුන් ලෙස හඳුනාගැනීම සඳහා සිරස්ක ලාංඡනයක් සහ උදාන පාඨයක අවශ්‍යතාවය ඇතිවූ බැවින් මෙම නව බලඇණිය වෙනුවෙන් සිරස්ක ලාංඡනයක් නිර්මාණය කිරීම සඳහා මහත් කැපවීමෙන් කටයුතු කළ රෙජිමේන්තුවේ නිර්මාතෘ එවකට ලුතිනන් කර්නල් විජය විමලරත්න ගේ සංකල්පයක් අනුව, උදාන පාඨය වශයෙන් "සමගිය ශක්තියයි" යන්න භාවිතා කරන ලදී.

සිරස්ක ලාංඡනය සඳහා ගජබා රජු යුද්ධ කටයුතු සඳහා භාවිතා කළ කෙටේරිය, පළිහ සහ බෙහෙත් අග ඇතුළත් කර කලාත්මකව නිර්මාණය කිරීමෙන් අනතුරුව, සිරස්ක ලාංඡන පැළඳවීම 1984 මාර්තු මස 30 වන දින සාලියපුර කඳවුරේදී උත්සවාකාරයෙන් සිදුවිය.

1984 වර්ෂය මැද භාගයේදී 1 වන ගජබා රෙජිමේන්තුව යාපනය ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරි සඳහා පිටත්ව ගොස් එහි මූලස්ථානය පලාලි කඳවුරේ ස්ථානගත වූ අතර, අනෙකුත් භටපිරිස් අනුඛණ්ඩ වශයෙන් යාපනය හා කිලිනොච්චිය ප්‍රදේශ ආවරණය වන පරිදි රාජකාරි භාරගන්නා ලදී.

තනි බලඇණියක් ලෙස යාපනය අර්ධද්වීපයේ හා කිලිනොච්චි ප්‍රදේශයේ පුරා රාජකාරි කළද 1 වන ගජබා රෙජිමේන්තුව නැවත රාජකාරි භාරදීමේදී එම රාජකාරි ආවරණය කිරීම සඳහා ප්‍රබල බලඇණි දෙකක් යෙදවීමට සිදුවිය. ඒ අනුව යාපනය ප්‍රදේශයේ තනි බලඇණියක් ලෙස රාජකාරි කළ අවසන් බලඇණිය වශයෙන් 1 වන ගජබා රෙජිමේන්තුව ඉතිහාසගත විය.

1985 පෙබරවාරි මස 13 වන දින කෝකිලායි අනුඛණ්ඩයේ රාජකාරීන්හි යොදවා සිටි ගජබා භටපිරිස් වෙත ත්‍රස්තවාදීන් විසින් එල්ල කළ රාත්‍රී ප්‍රහාරයකදී එය වළක්වා ඊට පැමිණි සියලු ත්‍රස්තවාදීන් විනාශ කිරීමට සමත් වූ අතර, ත්‍රස්තවාදීන් විසින් ආර්පීජී අවි භාවිතා කරන බැව් ප්‍රථම වරට අනාවරණය වූයේ මෙහිදී අත්අඩංගුවට ගත් එම අවි වලිනි.

මෙහිදී, අනුඛණ්ඩ භාර නිලධාරි වශයෙන් සිටි ලුතිනන් ආර්පීපීඑස් විජේසිංහ ගේ නායකත්වය සහ අණදීම හමුදාවේ විශේෂ ඇගයීමකට ලක්විය. යුද්ධ හමුදා මූලස්ථානය විසින් ඔහු සතුරා අභිමුඛයෙහි දක්වන ලද රණශූරත්වය, නිර්භීතභාවය හා නායකත්වය අගයකිරීමක් ලෙස ලුතිනන් සිට කපිතාන් දක්වා ක්ෂේත්‍ර උසස්වීමක් ලබාදුන් අතර, පසුව රණශූර පදක්කමද පිරිනැමීය. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත් නිලධාරියකු සතුරා අභිමුවේ දක්වන ලද වීරත්වය ඇගයීමක් ලෙස ක්ෂේත්‍ර උසස්වීමක් ලැබූ ප්‍රථම නිලධාරිවරයා ලෙස කපිතාන් ආර්පීපීඑස් විජේසිංහ යුද්ධ හමුදා ඉතිහාසයට එක්විය.

1985 ජූලි මස 20 වන දින 1 වන ගජබා රෙජිමේන්තුවේ 300 කින් පමණ සමන්විත භට කණ්ඩායමකට ක්‍රියාන්විතයේදී කුඩා කණ්ඩායම් යෙදවීමේ නව යුද්ධ උපක්‍රම භාවිතා කිරීම සඳහා සාලියපුර කඳවුරේදී පුහුණුවක් ලබාදුන් අතර, පසුව ඔවුන් මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසල වෙතින් ප්‍රතිත්‍රස්ත යුද්ධ උපක්‍රම පිළිබඳ විශේෂ යුද්ධ පුහුණුවක් හදාරා ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම සඳහා විශේෂ සේවා කණ්ඩායම් ලෙස රාජකාරීන්හි යොදවන ලදී. එවකට ලුතිනන් කර්නල් විජය විමලරත්න සෙන්පතිඳුන්ගේ දුර දක්නා නුවණ තුලින් බිහිකරන ලද මෙය, පසුව කණ්ඩායම් වශයෙන් ත්‍රිකුණාමලය, කිලිනොච්චිය හා වව්නියාව යන දිස්ත්‍රික්කයන්හි සිදු කරන ලද ක්‍රියාන්විතයන් වලදී සතුරාට අමතක නොවන ප්‍රහාර රැසක් දියත්කර ඇති බගට යුද්ධ ඉතිහාසය අදටත් සාක්ෂි දරයි.

1987 වසරේ මැද භාගයේදී යාපනය අර්ධද්වීපය බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ගෙන් මුදවා ගැනීමේ අරමුණින් යුද්ධ හමුදාව විසින් දියත් කරන ලද දැවැන්ත ක්‍රියාන්විතයක් වන වඩමාරච්චි මෙහෙයුම සඳහා ගජබා රෙජිමේන්තුවේ 1 වන බලඇණිය හා 3 වන බලඇණිය ඉදුරාම නම දායකත්වය ලබාදී යුද්ධ හමුදාවේ

**ත්‍රස්තවාදය මව්බිමෙන් තුරන් කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් 1983 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලසීමාව තුළ දියත් කරන ලද සියලුම ක්‍රියාන්විත සඳහා සිය උපරිම දායකත්වය ලබාදී ඇති අතර, ගජබා රෙජිමේන්තුවට අයත් සාමාජිකයින් අතරින් නිලධාරීන් 175 ක් සහ සෙසුනිලයින් 4075 දෙනකු මව්බිමේ නිදහස වෙනුවෙන් සිය ජීවිත පුද කර ඇත. එමෙන්ම, නිලධාරීන් 180 ක් සහ සෙසුනිලයින් 4030 දෙනකු එහිදී රණක්ෂිතයට පත්ව තිබේ. එවන් කැපකිරීමක් කරන්නට වෙනත් කවුරුන් හෝ මෙ මව්බිම තුළ බිහිව නැත. එතරම්ම ගජබා විරුවන් මව්බිම වෙනුවෙන් කැපකිරීම් කර ඇත. ඒ ඔවුන්ගේ විශිෂ්ටත්වයයි**

ධෛර්ය හා ශක්තිය උපරිම මට්ටමකට ගෙන ඒමට සමත්විය. මෙහිදී, 1 වන ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී වශයෙන් සිටි එවකට කර්නල් විජය විමලරත්න ප්‍රථම වතාවට බලසේනාධිපතිවරයකු වශයෙන් අණදුන්නේය.

වඩමාරච්චි මෙහෙයුම අවසානයේ නැවත සාලියපුර කඳවුරට පැමිණි ඒකක භටපිරිස් මෙහෙයුමේදී ත්‍රස්තවාදීන්ගෙන් අත්පත් කරගත් බර අවි ප්‍රදර්ශනය කරමින් අනුරාධපුර මහජන ක්‍රීඩාංගණයේ සිට උඩමළුව දක්වා සරඹ පෙළපාලියකින් ගමන් කොට ජය ශ්‍රී මහා බෝ සමිඳුන් වෙත වන්දනීය උත්තමාචාරය පිරිනමන ලදී. මෙම අවස්ථාවට විශාල ජනකායක් රැස්ව සිටි අතර, ඔවුහු මල්මාලා පළඳවා භටපිරිස් වෙත උපහාර දැක්වූහ.

1990 වසරේ ජූනි මාසයේදී රජය හා බෙදුම්වාදී ත්‍රස්තවාදීන් සමඟ ඇති කරගත් සාම සාකච්ඡා අසාර්ථක වීමත් සමඟ යාපනය කොටුවේ ස්ථානගතවී සිටි ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 6 වන බලඇණියට අයත් භටපිරිස් ත්‍රස්තවාදීන් විසින් වටලා සිටි අවස්ථාවේදී ත්‍රිවිධ බලය නමින් ක්‍රියාන්විතයක් දියත් කරන ලද අතර ගජබා රෙජිමේන්තුවේ 1 වන බලඇණිය, 4 වන බලඇණිය හා 6 වන බලඇණියට අයත් භටපිරිස් මේ සඳහා දායක වූහ.

ගජබා රෙජිමේන්තුවේ නිර්මාතෘ, රෙජිමේන්තු අධිපති හා යාපනය 21 වන බලසේනාධිපති ලෙස රාජකාරීන්හි නියුතුව සිටි එවකට බ්‍රිගේඩියර් විජය විමලරත්න 1992 අගෝස්තු මස 08 වන දින යාපනය අරාලි තුඩුවේදී ත්‍රස්තවාදීන් විසින් අටවන ලද පීඩන බෝම්බයකට හසුවී රට වෙනුවෙන් දිවි පිදීම ගජබා රෙජිමේන්තු ඉතිහාසයේ ඉතා ශෝකජනක මතක සටහනක් එක්කළ සිදුවීමකි.

යාපනය නගරය හා අනෙකුත් ප්‍රදේශ ඇතුළු අර්ධද්වීපයම ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදවාගැනීම සඳහා දියත්කළ රිවිරැස මෙහෙයුමේදී සහ 1997 මාර්තු මස මුල් කාලසීමාවේදී ක්‍රියාත්මක කරන ලද ජයසිකුරු ක්‍රියාන්විතයට ගජබා රෙජිමේන්තුවේ සියලුම නිත්‍ය බලඇණි සහභාගී වූ අතර, වව්නියාව නගරයේ ඕමන්තෙයි සිට පුලියන්කුලම්, කනගරායන්කුලම් හා මාන්කුලම් දක්වා ප්‍රදේශය මුදවාගැනීමේදී පෙරමුණගෙන ක්‍රියාකොට ජයග්‍රහණ රැසක් අත්කර ගැනීමට සමත් වූහ.

පළමු වරට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමසාධක හමුදා රාජකාරීන් සඳහා ගජබා රෙජිමේන්තුවට අයත් සියලු නිත්‍ය හා ස්වේච්ඡා බලඇණිවලින් සමන්විත වනසේ නිලධාරීන් 35 ක් සහ සෙසුනිලයින් 23 දෙනකුගෙන් සමන්විත සාමසාධක බලඇණියක් 2006 ජුනි මස 05 වන දින සිට 2006 දෙසැම්බර් මස 19 දින දක්වා හයිටි රාජ්‍යයේ රාජකාරීන් සඳහා පිටත්ව යන ලදී.

2007 ක් වූ ජනවාරි මස 16 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් යුද්ධ හමුදා මූලස්ථාන සරඹ භූමියේදී ජනාධිපති වර්ණ සහ රෙජිමේන්තු වර්ණ ගජබා රෙජිමේන්තුවට ප්‍රදානය කරන ලදී.

ත්‍රස්තවාදයෙන් මව්බිම බේරාගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ වඩමාරච්චි, ත්‍රිවිධ බලය, අකුණුපහර, ජයසිකුරු, සත්ජය, රිවිරැස ආදී වූ දැවැන්ත ක්‍රියාන්විතවලදී මෙන්ම නැගෙනහිර සහ වන්නි මානුෂීය මෙහෙයුම්වලදී ගජබා රෙජිමේන්තු සාමාජිකයින් රණබිමේදී දක්වන ලද සුවිශේෂී වීරක්‍රියාවන් ඇගයීමට ලක් කරමින් පරම වීර විභූෂණ පදක්කම් 04ක්, වීරෝදාර විභූෂණ පදක්කම් 03ක්, වීර වික්‍රම විභූෂණ පදක්කම් 65ක්, රණ වික්‍රම පදක්කම් 774ක්, රණශූර පදක්කම් 3829 ක්, විශිෂ්ට සේවා විභූෂණ පදක්කම් 12ක්, උත්තම සේවා පදක්කම් 682 ක් වීරෝදාර ගජබා නිලධාරීන් සහ සෙසුනිලයන් වෙත ප්‍රදානය කර ඇත.

ත්‍රස්තවාදය මව්බිමෙන් තුරන් කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් 1983 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලසීමාව තුළ දියත් කරන ලද සියලුම ක්‍රියාන්විතයන් සඳහා සිය උපරිම දායකත්වය ලබාදී ඇති ගජබා රෙජිමේන්තුවට අයත් සාමාජිකයින් අතරින් නිලධාරීන් 171 ක් සහ සෙසුනිලයින් 4067 දෙනකු මව්බිමේ නිදහස වෙනුවෙන් සිය ජීවිත පුද කර ඇති අතර, නිලධාරීන් 307 ක් සහ සෙසුනිලයින් 5646 දෙනකු එහිදී, රණක්ෂිතයට පත්ව ඇත. එවන් කැපකිරීමක් කරන්නට වෙනත් කවුරුන් හෝ මෙ මව්බිම තුළ බිහිව නැත. එතරම්ම ගජබා විරුවන් මව්බිම වෙනුවෙන් කැපකිරීම් කර ඇත. ඒ ඔවුන්ගේ විශිෂ්ටත්වයයි.

ගජබා රෙජිමේන්තුවේ 40 වැනි සංවත්සරයට අපෙන් සුබ පැතුම්...!



ලුතිනන් දිලංක ගුණතිලක
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

# කපිතාන් සාලිය අලදෙණියගේ ස්මාරකයක් විවෘත කෙරේ





3 (ස්වේච්ඡා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් රණවිරු කපිතාන් සාලිය අලදෙණිය පීඩබ්ලිව්වී අනුස්මරණය කිරීම සඳහා කොස්ගම, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථාන පරිශ්‍රය තුළ ඉදිකරන ලද නව ස්මාරකයක් එහි නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ටීකේආර් සිල්වා කේඑස්පී ගේ ආරාධනයෙන් ස්වේච්ඡා බලසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් ඉකුත් ඔක්තෝබර් මස 04 වන දින විවෘත කරන ලදී.

කපිතාන් සාලිය අලදෙණිය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යුද ඉතිහාසයේ "පරම වීර විභූෂණ" (PWV) සම්මානයෙන් පිදුම් ලැබූ ප්‍රථම හමුදා සාමාජිකයා වන අතර, එය සෙබළකුගේ උත්තරීතර පරිත්‍යාගය අගයමින් මරණින් පසු පිරිනමන ඉහළම පදක්කම ලෙස සැලකේ.

එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් සමග කොකාවිල්හි පැවති දරුණු සටනේදී සතුරන්ට යටත් නොවී රට වෙනුවෙන් දිවි පිදූ ඉතිහාස කතාව සේනාවිධායක විසින් මෙම ඓතිහාසික අවස්ථාවේදී සිහිපත් කළේය. කපිතාන් සාලිය අලදෙණියගේ ආදරණීය මෑණියන් වන ඉන්ද්‍රානි අලදෙණිය මහත්මිය සහ එවකට අණදෙන නිලධාරී බ්‍රිගේඩියර් අබය වීරකෝන් (විශ්‍රාමික) කේඑස්පී ZOOM සන්නිවේදන තාක්ෂණය ඔස්සේ මෙම උත්සවයට එක්වීම විශේෂත්වයකි. ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ භටපිරිස් මෙම ස්මාරකය ඉදිකිරීම සඳහා ශ්‍රම දායකත්වය ලබාදුන්හ.

# යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි රණවිරු සෙවණ රාගම සංචාරයක





රාගම රණවිරු සෙවණෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන විරුවන්ගේ සුවදුක් විමසීම සඳහා 74 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීහු පිරිසක් ඉකුත් සැප්තැම්බර් 27 වන දින සංචාරයක නිරත වූහ.

# යුද්ධ හමුදාවේ මූලිකත්වයෙන් ඉදිකළ 771 වන නව නිවස විවෘත කෙරේ

යුද්ධ හමුදාවේ ඉල්ලීමකට අනුව ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) හටපිරිස්හි සම්බන්ධීකරණය මත ඕස්ට්‍රේලියාවේ *'Imagine Compassion International Ltd'* ආයතනය වෙතින් ලබාදුන් මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් යාපනය උරුම්පිරායි ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුලක් වෙනුවෙන් නව නිවසක් ඉදිකර දෙනු ලැබීය. මෙම නිවාසය යුද්ධ හමුදාව මඟින් ඉදිකරනු ලැබූ 771 වන නිවසයි.





මෙම උත්සව අවස්ථාවේදී, ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ පීඑස්සී සහ 52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් නිවාසලාභී පවුල වෙත නව නිවසේ යතුරු භාරදෙනු ලැබූහ. නව නිවස ඉදිකිරීම සඳහා 11 කාරක ඉංජිනේරු රෙජිමේන්තුව සහ 5 ඉංජිනේරු සේවා බලකා හටපිරිස් ශ්‍රම දායකත්වය ලබාදුන්හ.

# ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ සහකාර ආරක්ෂක උපදේශක යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ සංචාරයක



යාපනය අර්ධද්වීපයේ සංචාරයක නිරත වූ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ සහකාර ආරක්ෂක ලුතිනන් කර්නල් පුනීත් සුෂිල් පසුගියදා යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ සංචාරයක නිරතවෙමින් එහි ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ හමුවී සාකච්ඡාවක නිරතවිය.

මෙම සංචාරය අතරතුරේදී ලුතිනන් කර්නල් පුනීත් සුෂිල් ඉන්දීය සාම සාධක හමුදාවේ දිවිපිදූ රණවිරුවන් සිහිකරමින් ඉදිකර ඇති රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වීමටද එක්විය.

# "විරු ගී නද - 2023"
## මව්පිය උපහාර ගී සැඳෑව





ආරක්ෂක සේනා (වන්නි) බලප්‍රදේශයේ රාජකාරී නියුතු සොල්දාදුවන්ගේ ඒකාකාරී මනසට සුවයක් වන්නට ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී ඩීඑස්ඩී යූඑස්පී එන්ඩීයූ ගේ මගපෙන්වීම යටතේ මනෝවිද්‍යා මෙහෙයුම් අංශය සංවිධානය කරන ලද "ජීවන ගමනේ මව්පිය ගුණ වරුණ", "විරු ගී නද - 2023" මව්පිය උපහාර ගී සැඳෑව පසුගිය ඔක්තෝබර් 15 වන දින එම මූලස්ථාන ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ රයිෆල් බලකායේ අධිරිද්ම සංගීත කණ්ඩායම, සිසාරා සෙලිබ්‍රිටි ප්‍රසංග වේදිකාවේ සංගීතය සපයන ලදී. එහිදී, මව්කුසින් බිහිවන පුංචි බිළිඳකු ජීවන ගමනේ විවිධ කඩඉම් පසුකිරීම සහ මව්පිය හා දරු සෙනෙහස පිළිබඳව අර්ථවත් ගීත ගායනා කරමින් මව්පිය උපහාර ගී සැඳෑව ඉතා අලංකාර ලෙස පවත්වන්නට කටයුතු සංවිධානය කර තිබුණි.



# අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් පරිත්‍යාග රැසක්





අඩු ආදායම්ලාභී පවුල්වලට සහනයක් ලබාදීම සහ අඩු වරප්‍රසාද ලත් දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීමේ අරමුණින් 12 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ භටපිරිස් ඉකුත් සැප්තැම්බර් 23 වන දින සත්කාරක කටයුතු රැසකට දායක වූහ. ඒ යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉරාල්කුලම් ප්‍රදේශයේ වෙසෙන පවුල් 50 ක් සඳහා රුපියල් 7600.00 බැගින් වටිනා වියළි සලාක මලු 50 ක්ද ඉරල්කුලම් රජයේ මිශ්‍ර පාසලේ ඉගෙනුම ලබන දරුවන් 41 දෙනකුට සහ පෙරියවඩිඩුවාන් පාසලේ ඉගෙනුම ලබන ළමුන් 17 දෙනකු සඳහා රුපියල් 200,000.00 වටිනා පාසල් උපාංග කට්ටලද බෙදාදෙන ලදී. නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්කේයූපී ගුණරත්න ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් ඉරාල්කුලම් රජයේ මිශ්‍ර පාසලේදී පැවැති මෙම උත්සවයට 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 232 වන පාබල බලසේනාවේ සිවිල් සම්බන්ධීකරන නිලධාරී, 12 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවෙහි අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන් සෙසු නිලයින්, රැසක් සහභාගී වූහ.

# 4 වන ගැමුණු හේවා බලකායේ බලඇණි පුහුණු පාඨමාලාව ඇරඹේ





4 වන බලඇණිය ගැමුණු හේවා බලඇණිය පසුගිය සැප්තැම්බර් මස 18 වන දින පූනානි බලඇණි පුහුණු පාසලේදී සිය බලඇණි පුහුණුව ආරම්භ කරන ලදී. එහි ආරම්භක දේශනය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්කේයූපී ගුණරත්න ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී සහභාගී විය. එහිදී, ආඥාපතිවරයා විසින් සෙබළකු ලෙස මෙම පුහුණුවේ වටිනාකම මෙන්ම පුහුණුවීම් කටයුතු සාර්ථක කරගැනීමේ වැදගත්කමද අවධාරණය කළේය.

23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ සුපරීක්ෂාකාරී අධීක්ෂණය යටතේ මෙම සාමූහික පුහුණුව 2023 සැප්තැම්බර් මස 18 දින සිට 2023 නොවැම්බර් මස 06 දින දක්වා වැඩ කරන දින 45 ක් පුරා පැවැත්වේ.

මෙම අවස්ථාවට 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී පීඑස්සී, එම පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක ලුතිනන් කර්නල් ඊඩීටීපීර් බණ්ඩාර ඇතුළු උපදේශකවරුද සහභාගී වූහ.

# 1 බලකාය අභිමානවත් 74 වන යුද්ධ හමුදා සංවත්සරය සමරමින්





යුද්ධ හමුදාවේ අභිමානවත් 74 වන සංවත්සරයට සමගාමීව 1 බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්බී අමුණුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කළ සැමරුම් උත්සවයක් ඉකුත් ඔක්තෝබර් 10 වන දින පැවැත්විණ. එහිදී, රුක් රෝපණ වැඩසටහනක්ද ක්‍රියාත්මක කළ අතර, සියලු නිල දිවා භෝජන සංග්‍රහයක්ද එම උත්සව කටයුතු අතරට එක්ව තිබිණි.





# කනිෂ්ඨ නාවික මාණ්ඩලික පාඨමාලා නිලධාරීන් මුලතිව් සංචාරයක

කනිෂ්ඨ නාවික මාණ්ඩලික පාඨමාලා අංක 33 හදාරනු ලබන යුද්ධ, ගුවන් සහ නාවික නිලධාරීන් 17 දෙනකු සහ උපදේශක නිලධාරීන් 05 දෙනකු ඉකුත් සැප්තැම්බර් 23 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) හි අධ්‍යයන සංචාරයක නිරත වූහ.



එහිදී, එම පාඨමාලා නිලධාරීන් වෙනුවෙන් එම ආරක්ෂක සේනා මූලස්ථානයේ කාර්යභාරය සහ බලප්‍රදේශය පිළිබඳ ඉදිරිපත් කිරීමක් ප්‍රමානි 1 (ක්‍රියා) ලුතිනන් කර්නල් ටීඑම්ඩීඩීඑස් මීගොල්ල ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී විසින් සිදුකළ අතර, එම අවස්ථාවට ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ද සහභාගී විය. ඉන් අනතුරුව ඔවුහු 68 වන පාබල සේනාංක බලප්‍රදේශයේ ඇති සබ්මැරීන් අංගනය හා විජයග්‍රාහී සැමරුම් ස්මාරකය වෙත ද සංචාරය කළහ. එම අවස්ථාවට 68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ද එක්විය.

## විරු දිරියෙන් නිසට සෙවණක්





64 වන පාබල සේනාංකය යටතේ ඇති 643 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් සීඩී වික්‍රමනායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී ගේ ඉල්ලීමකට අනුව පරිත්‍යාගශීලීන් කිහිප දෙනකුගේ අනුග්‍රාහක දායකත්වය මත මුතියන්කඩ්ඩුකුලම් ග්‍රාමසේවා වසමට අයත් ජීවනගර් ග්‍රාමයෙහි පදිංචි ආබාධිත ළමුන් දෙදෙනකු සිටින දිළිඳු පවුලක් වෙත නිවසක් ඉදිකරදීමට කටයුතු කෙරිණි. තවද, එම නිවස සඳහා අවශ්‍ය බඩු භාණ්ඩ සියල්ලක්ද එහිදී පිරිනැමීම විශේෂත්වයකි.

ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධනය ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පසුගිය ඔක්තෝබර් 13 වන දින පැවති එම නිවස භාරදීමේ අවස්ථාවට 64 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්එස් දේවප්‍රිය යූඑස්පී එන්ඩීසී, 641 හා 642 වන පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු, මේජර් ටීඑස් බොහොරාන් (විශ්‍රාමික) ඇතුළු පරිත්‍යාග ශීලීන්ද සහභාගී වූහ. 8 වන කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරීගේ අධීක්ෂණය යටතේ එහි භටපිරිස් මෙම නිවස නිවස ඉදිකිරීම සඳහා දායකත්වය ලබාදුන්හ.

# ලෝක ළමා දිනය වෙනුවෙන් දූ පුතුනට සත්කාරයක්





ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපතිගේ පූර්ණ අධීක්ෂණය යටතේ ලෝක ළමා දිනය නිමිත්තෙන් ඉකුත් ඔක්තෝබර් 03 වන දින දියතලාව කළුරුගමුව මිහිඳු විද්‍යාලයේ දරුවන් සහ ආචාර්ය මණ්ඩලය වෙනුවෙන් සත්කාරක වැඩසටහන් ත්‍රිත්වයක් පවත්වන ලදී. එය බණ්ඩාරවෙල සිංහ සමාජයේ පූර්ණ අනුග්‍රහයෙන් එම විද්‍යාල පරිශ්‍රයේ හා දියතලාව යුද්ධ හමුදා ගොල්ෆ් සමාජ ශාලාවේදී පැවැත්විණ. එහිදී, එම විද්‍යාලයේ දූ දරුවන් වෙනුවෙන් පෞරුෂ සංවර්ධනය හා නායකත්ව ගුණාංග පිළිබඳ හරවත් දේශනයක් ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) කර්නල් ප්‍රමානි කර්නල් ඩබ්ලිව්ජ්පේ හේමචන්ද්‍ර ආර්එස්පී පීඑස්සී විසින් පවත්වන ලද අතර, ප්‍රාථමික අංශයේ දූ දරුවන් වෙත චිත්‍ර ඇඳීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාදී චිත්‍ර ඇඳීමේ වැඩසටහනක් ගොල්ෆ් සමාජ ශාලාව සහ පෝලෝ ක්‍රීඩා පිටිය අසලදී පවත්වන ලදී. තවද, එම විද්‍යාලයේ සියලුම දරුවන් සහ ආචාර්ය මණ්ඩලය වෙත දිවා ආහාර වේලක් ලබාදීමද මෙහිදී සුවිශේෂී අවස්ථාවක් විය.

# ක්ෂණික ක්‍රියාන්විත යතුරුපැදි පුහුණු පාඨමාලාව



ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපතිගේ අදහසකට අනුව එම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ පාලනය වන සේනාංක සහ බලසේනා හි 35 දෙනකුගෙන් යුත් ක්ෂණික ක්‍රියාන්විත යතුරුපැදි බණ්ඩයක් සඳහා දින 14 ක පුහුණු පාඨමාලාවක් පැවැත්විණ. එම පාඨමාලාව අවසානයේ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්වීඑම්එන්ඩීකේබී නියංගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියු පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ඔක්තෝබර් 10 වන දින පැවැත්විණ.

ධාවන පැදි පැදීමේ කුසලතා, ශිල්පීය ක්‍රම සහ උපක්‍රම පුහුණු කර වැඩිදියුණු කිරීම, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරී තත්වය තුළ ඉක්මනින් ප්‍රතික්‍රියා දැක්වීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ මූලික සටන් කුසලතා වැඩිදියුණු කිරීම යන කරුණු මුල්කරගෙන සිදුකළ මෙම පාඨමාලාව විශේෂ බලකා ප්‍රවීණ පුහුණු උපදේශකයින් පිරිසක් විසින් මෙහෙයවනු ලැබූහ.



# සංචාරයක මතක සටහන්





මූල්‍ය කළමනාකරණ ශාඛාවේ අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ ලෙස රාජකාරී භාරගත් මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් ඔක්තෝබර් 26 වන දින යුද්ධ හමුදා යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ සංචාරයක නිතරවිය. එහිදී හෙතෙම එම මණ්ඩලයේ නිලධාරීන් සහ සෙබළුන් සමඟ සුහද කතාබහකද නිරතවූහ. එම සංචාරය සිහිවීම වස් යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් පීආර් සමරවීර විසින් අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ වෙත සමරු තිළිණයක්ද පිළිගන්වන ලදී.



## 23 වන ගැමුණු හේවා බලකායෙන් සමාජ සත්කාරයක්

552 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ උපදෙස් මත 23 වන ගැමුණු හේවා බලකාය විසින් මුහමාලේ ඉලනත්තේන්ඩුල පෙරපාසලේ ඉගෙනුම ලබන දරු දැරියන් 14 දෙනකු සඳහා පෝෂ්‍යදායී දිවා ආහාර වේලක් ලබාදීමට කටයුතු කරන ලදී.

## ශිෂ්‍යත්ව විභාගයට මුහුණදෙන දරුවන්ට අත්වැලක්

22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ උපදෙස් මත 221, 222 හා 223 යන පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරුන් විසින් 5 වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා ඉලක්කගත ප්‍රශ්නපත්‍ර කට්ටල බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 18 වන දින සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන මගින් 5 ශ්‍රේණියේ සිසුන් 1555 දෙනකුට ප්‍රතිලාභ හිමි වූ අතර, කොළඹ රාජකීය විද්‍යාලයේ හා ශ්‍රී ජයවර්ධනපුර ගංගොඩවිල පැරණි විද්වත් මිතුරු සංගමයේ ආදි ශිෂ්‍ය මිතුරු මිතුරියන් හා ප්‍රසාද් ලොකුබාලසූරිය මහතාගේ 'පහට පහක්' සංකල්පය යටතේ මෙම මහඟු සමාජ සත්කාරය සඳහා දායකත්වය හිමිවිය.



221 වන පාබල බලසේනාවේ බලසේනාධිපති හා 20 වන ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී විසින් පදවි ශ්‍රීපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජයන්ති වැව ප්‍රාථමික විද්‍යාලයේදී මෙම එක් වැඩසටහනක් සංවිධානය කොට තිබිණ. එසේම, 222 වන පාබල බලසේනාවේ බලසේනාධිපති හා 5 වන ස්වේච්ඡා ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරී විසින් කන්තලේ සීනිපුර එම ඒකක කඳවුරු පරිශ්‍රයේදී අනික් වැඩසටහන සංවිධානය කොට තිබිණ. එහිදී, කන්තලේ අධ්‍යාපන කලාපයේ පාසල් 29 කට අයත් සිසු සිසුවියන් 1072 කට මෙම ප්‍රශ්නපත්‍ර කට්ටල බෙදාදුන්හ. තවද, ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මැදවච්චිය මහා විද්‍යාලයේ සහ මොරවැව විද්‍යාලයේ සිසුන් 307 දෙනකු සඳහා ප්‍රශ්නපත්‍ර කට්ටල බෙදාදීම 223 වන පාබල බලසේනාවේ බලසේනාධිපති හා 6 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.



## ලෝක ළමා දිනයට සමගාමීව තවත් ප්‍රජාසත්කාරයක්

ලෝක ළමා දිනයට සමගාමීව ඉනිය වාල්පු ඉස්ලාම් ළමා නිවාසයේ දරුවන් වෙත ආහාර වේලක් ලබාදීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 01 වන දින 68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. එහිදී, විශේෂ අවශ්‍යතා සහිත එම ළමුන්ගේ දක්ෂතා ඉදිරිපත් කිරීමේ අවස්ථාවක්ද කැලිප්සෝ සංගීතය වැඩසටහනක්ද පැවැත්විණ.

## දිරිය දරුවන් හට පාසල් උපකරණ පරිත්‍යාගයක්

521 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් එම්එච්ආර් ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය මත ඕස්ට්‍රේලියාවේ ශාක්‍යමුණි විහාරස්ථානයේ මූල්‍ය දායකත්වයෙන් වෙල්වැටිතුරෙයි කරවෙඩ්ඩි ශ්‍රී නාරද විද්‍යාලයේ සිසුන් සඳහා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 18 වන දින පැවැත්විණ. 11 වන විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් සංවිධානය කළ මෙම උත්සව අවස්ථාව සඳහා අතිපූජ්‍ය පණ්ඩිත් හක්මන සුමනසිරි හිමිපාණන්, පූජ්‍ය ශාස්ත්‍රපති පණ්ඩිත ගබ්වෙල වජිර හිමිපාණන්, යාපනය ශ්‍රී නාග විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය මීගහජදූරේ සිරිවිමල හිමිපාණන්, 52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 521 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ඇතුළු පිරිසක් සහභාගී වූහ.



## 68 වන පාබල සේනාංකයෙන් අක්ෂි සායනයක්

යුද්ධ හමුදාව හා ප්‍රදේශයේ සිවිල් වැසියන් අතර, සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් යුතුව පවත්වනු ලැබූ අක්ෂි සායනයක් ඉකුත් අගෝස්තු 13 වන දින 68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ අධීක්ෂණය යටතේ පැවැත්විණ. එහිදී, එම බලප්‍රදේශයේ වෙසෙන වයස අවුරුදු 40 ට වැඩි අයවලුන්ගේ ඇසේ සුදු පරීක්ෂාකර ළඟ පෙනීමේ දුර්වලතාවය ඇති අයවලුන් හට කියවීමේ කන්නාඩි ද ලබාදෙන ලදී. මෙම අක්ෂි සායනයට ආචාර්ය වී සර්වේෂ්වරන් මහතා විසින් මූල්‍ය අනුග්‍රාහකත්වය සපයා තිබුණි.



## 74 වන යුද්ධ හමුදා දිනය වෙනුවෙන් ආගමික වැඩසටහන් රැසක්



යුද්ධ හමුදාවේ 74 වන සංවත්සරයට සමගාමීව ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපතිගේ උපදෙස් මත ඉකුත් සැප්තැම්බර් 29 වන දින එම මූලස්ථානයේදී බෝධිපූජා පිංකමක් සංවිධානය කෙරිණ. යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී බ්‍රිගේඩියර් කේජේඑන්එම්පීකේ නවරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසකගේ සහභාගීත්වයෙන් මෙම පිංකම පැවැත්විණ. තවද, එයට සමගාමීව යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ හට පිරිස් නයනතිව් දූපතේ පිහිටි පූජනීය නාගදීප රජමහා විහාරස්ථානයේ වැඩසිටින භික්ෂූන් වහන්සේලා වෙත දහවල් දානය ද පිළිගන්වනු ලැබූහ.

## 23 වන පාබල සේනාංකයේ අලුත් සහල් මංගල්‍යය



23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ අදහසකට අනුව එම සේනාංක මූලස්ථාන සෙනින් විසින් යල කන්නයේ අක්කර 23 ක ප්‍රමාණයක් අස්වද්දන ලද අතර, එහි අලුත් සහල් මංගල්‍යය ඉකුත් සැප්තැම්බර් 29 වන දින එම සේනාංකයට අයත් සිද්ධපුර කුඹුරේදී පැවැත්විණ.

එහි සේනාංකාධිපති ගේ ප්‍රධානත්වයෙන් පුරාණ චාරිත්‍රයන්ට අනුව කිරි උතුරවා ආගමික වතාවත් සිදුකර පැවති මෙම කටයුත්තට එම සේනාංකයේ නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.





## ජ්‍යෙෂ්ඨ නායකත්ව සංස්කරණ පාඨමාලා අංක 47

යුද්ධ හමුදාවේ බලලත් නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨකොණොනිත්ගේ පුද්ගලික හා සාමූහික නායකත්ව දැනුම වර්ධනය කර යුද්ධ හමුදා අණපනත් හා නියෝග තුලින් ඔවුන්ගේ බුද්ධි මට්ටම ඉහළ නංවමින් තම යටත් පිරිස කාර්යක්ෂමව මෙහෙයවීම සඳහා අවශ්‍ය දැනුම වර්ධනය කිරීම අරමුණු කරගෙන සටන් පුහුණු පාසල - අම්පාර වෙතින් පවත්වන ලද "ජ්‍යෙෂ්ඨ නායකත්ව සංස්කරණ පාඨමාලාව අංක - 17" ඉකුත් ඔක්තෝබර් 13 වන දින අවසන් විය.

මෙම පාඨමාලාව සඳහා නිත්‍ය සහ ස්වේච්ඡා ඒකක වෙතින් සිසුන් 53 දෙනකු සහභාගී වූ අතර, අවසන් දේශනය පුහුණු පාසලෙහි අණදෙන නිලධාරී කර්නල් එම්කේජීඩී චන්ද්‍රමාල් විසින් සිදුකරන ලදී. එහිදී, පාඨමාලාවේ විශිෂ්ට සාමාර්ථයක් ලබාගනිමින් ප්‍රථම ස්ථානය 1 වන සන්නද්ධ බුද්ධි බලකායට අයත් සෙ/778232 සැරයන් බංඩාර ආර්එම්සීඑස් හිමිකරගත්තේය.

## අභිමානවත් සංවත්සරය සමරමින්



1 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ එකම රයිෆල් බලඇණිය ලෙස 1956.10.01 වන දින ආරම්භ කරන ලදී. එසේ අරඹි එම අභිමානවත් රෙජිමේන්තුවේ 67 වන සංවත්සරය ඉකුත් ඔක්තෝබර් 01 වන දිනට යෙදී තිබිණ. එහිදී, අණදෙන නිලධාරී මේජර් ටීකේඊ මඩවල යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා චරිත්‍රවලට අනුකූලව ආගමික වතාවත් සහ සාම්ප්‍රදායික අංග රැසක් සමගින් සංවත්සරය සැමරූ අතර, ඊට සියලු නිලයෝ සාමූහිකව එකතු වූහ.





# ජයපුරම් මහා විද්‍යාලයේ සිසුන්ට සම්මන්ත්‍රණයක්

යුද්ධ හමුදාවේ 74 වන සංවත්සරයට සමගාමීව 552 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ඩීඑස්එස් රුදලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ මෙවර ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනීසිටීමට නියමිත සිසුන් සඳහා සම්මන්ත්‍රණයක් ඉකුත් ඔක්තෝබර් 08 වන දින ජයපුරම් මහා විද්‍යාලයේදී පැවැත්විණ.

2 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව විසින් සංවිධානය කරන ලද එම වැඩසටහන සඳහා එම ඒකක බලප්‍රදේශයේ පාසල්වල 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් 253 දෙනකු සහභාගී වූ අතර, ඔවුන් සඳහා පෝෂ්‍යදායි දිවා ආහාර වේලක්ද ලබාදෙන ලදී.

## පාසල් දූ දරුවන් හට පාවහන් බෙදාදීමේ වැඩසටහනක්

ලෝක ළමා දිනය සහ යුද්ධ හමුදාවේ 74 වන සංවත්සරයට සමගාමීව 552 වන පාබල බලසේනාවේ සහ 22 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ භට පිරිස් ඉකුත් ඔක්තෝබර් 02 වන දින ගොනාරිමුනෙයි විනායගයෝමෙඩ දමිළ මිශ්‍ර පාසලේ සිසුන් වෙත පාවහන් බෙදාදීමේ වැඩසටහනකට එක්වූහ. මේ සඳහා මූල්‍ය දායකත්වය කොළඹ 07 රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍යයින් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්වතුන් විසින් දරන ලදී. තවද, එහිදී එම සිසුන්ගේ දෙමව්පියන් වෙත පොල් පැළ බෙදාදීමටද කටයුතු කෙරිණ.



## 563 පාබල බලසේනා බලප්‍රදේශයේ ළමුන් වෙත පරිත්‍යාගයක්



මහකච්චිකොඩිය විද්‍යාලය, ඇටඹගස්කඩ විද්‍යාලය, නෙඩුන්කුලම විද්‍යාලය, ශ්‍රී ධර්මරතන පිරිවෙන, කුඩාකච්චිකොඩිය විද්‍යාලය සහ මහමයිලන්කුලම විද්‍යාලයේ පාසල් ළමුන් සඳහා පොත් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 18 වන දින පැවැත්විණ. 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ සහ 563 වන පාබල බලසේනාවේ වැඩබලන බලසේනාධිපතිගේ මඟපෙන්වීමෙන් ලිඳවැව අමරජෝති හිමියන්ගේ සම්බන්ධීකරණයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති සනත් එදිරිවීර සහ විශේෂඥ වෛද්‍ය රම්‍යාද සිල්වා යන මහත්ම මහත්මීන් ගේ අධාර මත මෙම මාහැඟි කටයුත්ත සිදුවිය. මෙම අවස්ථාව සාර්ථක කරගැනීම සඳහා 11 වන ගැමුණු හේවා බලඇණියේ භට පිරිසක්ද සහභාගී වූහ.



# යුද්ධ හමුදා

## සේවා වනිතා ඒකකයේ 39 වන වාර්ෂික මහසභා රැස්වීම





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 39 වැනි වාර්ෂික මහා සභා රැස්වීම ඉකුත් ඔක්තෝබර් මස 16 වන දින එම ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

එහිදී, සෙ/කිපු018813 ලාන්ස් කෝප්‍රල් හේරත් එච්එම්කේඑල්කේ ගේ ශ්‍රවණාබාධිත දියණියක් වෙත ශ්‍රවණාධාර උපකරණ කට්ටලයක් සහ 9 ඉංජිනේරු සේවා බලකායේ මියගිය සෙ/239832 කෝප්‍රල් ආනන්ද එච්පීඑල් රණවිරුවාගේ බිරිඳ විසින් පවත්වාගෙන යනු ලබන ස්වයං රැකියාවක් සඳහා ජුකී මහන මැෂිමක් ද පරිත්‍යාග කෙරිණි.

මහාචාර්ය හේමමාලි ගුණතිලක මහත්මිය විසින් එම වැඩසටහන අතරතුරදී *'Diversity and Inclusion'* යන මැයෙන් කාලීන දේශනයක්ද පැවැත් වූවාය. සේවා වනිතා ඒකකයේ ජ්‍යේෂ්ඨ සාමාජිකාවෝ රැසක් එම අවස්ථාවට එක්වූහ.



# රණවිරු දූ දරුවන්ට ඉගෙනුමට දිරියක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය සහ විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව එක්ව ලෝක ළමා දිනය වෙනුවෙන් සංවිධානය කළ වැඩසටහනක් බෝයගනේ විජයබාහු පාබල රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ඉකුත් ඔක්තෝබර් මස 01 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එම අවස්ථාවට විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනී හිමාලි පුස්සැල්ල මහත්මිය, එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවෝ ඇතුළු එම ප්‍රදේශයේ ළමා නිවාසවල නේවාසිකව සිටින ළමුන් 100 දෙනකුද සහභාගී වූහ.



එහිදී, එම රෙජිමේන්තු කඳවුරු පරිශ්‍රයේ නවතමයෙන් ඉදිකරන ලද *'Archers'* ප්‍රකාශන අංශය විවෘත කිරීමද එම උත්සවයට සමගාමීව ප්‍රධාන අමුත්තිය අතින් සිදුකෙරුණිය. ලෝක ළමා දින වැඩසටහනේදී ඊට සහභාගී වූ ළමයින් ඔවුන්ගේ කලා කුසලතා පැමිණ සිටි පිරිස වෙත ඉදිරිපත් කරනු ලැබූ අතර, ඉන් අනතුරුව ඊට එක්වූ කුරුණෑගල මලියදේව පිරිමි සහ මලියදේව බාලිකා ළමා නිවාස, පොල්ගහවෙල කිරි මුදියන්සේ පිරිමි ළමා නිවාසය, කුරුණෑගල ස්පුට්නික් බාලිකා ළමා නිවාසය, මැල්සිරිපුර ආලෝකා පිරිමි ළමා නිවාසය යන ළමා නිවාසවල ළමුන් 100 දෙනකු වෙත අත්‍යාවශ්‍ය භාණ්ඩ ඇසුරුම් පාර්සල් ද ප්‍රදානය කෙරිණ.

තවද, එම උත්සව අවස්ථාවෙන් පසුව විජයබාහු පාබල රෙජිමේන්තුවේ සිවිල් සේවක මහතුන්ගේ පවුල්වල පාසල් අධ්‍යාපනය ලබන ළමුන් 20 දෙනකු සඳහා *DSI* ආයතනය මගින් පිරිනමන ලද පාවහන් සහ පාසල් උපාංග ඇතුළත් රුපියල් 15,000.00 වටිනාකමකින් යුත් තෑගි වවුචර ලබාදීමටද යුද්ධ හමුදා සේවා වනිතා සභාපතිනිය එක්වූවාය. පැමිණ සිටි ළමුන් සඳහා එහිදී දිවා භෝජන සංග්‍රහයක්ද පිරිනැමුණු අතර, එම අවස්ථාවට සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක සහ විජයබාහු පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති, යුද්ධ හමුදා විධායක ජෙනරාල් ද එක්වූහ.

# ලෝක ළමා දිනයට සමගාමීව විශේෂ වැඩසටහනක්



2023 වර්ෂයේ ලෝක ළමා දිනයට සමගාමීව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් විරු කැකුළු පෙරපාසල - මැනිංවුන් හි අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් විශේෂ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 05 වන දින එම පෙරපාසල් පරිශ්‍රයේදී පැවැත්විණ. එහිදී, පෙරපාසල් දූ දරුවන් විසින් ඉතා අලංකාරවත් අන්දමින් ඔවුන්ගේ නැටුම්, ගැයුම් වැයුම් ආදී කලා හැකියාවන් සහ නිර්මාණාත්මක වැඩසටහන් ඉදිරිපත් කරන ලදී. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය විසින් පෙරපාසල් දූ දරුවන් හට පාසල් උපකරණ ලබාදීමද එහිදී සිදුකෙරිණ.

# මූලාධාර ප්‍රදාන උත්සවය හා වාර්ෂික මහසභා රැස්වීම







අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ 2022 විභාගයෙන් සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබූ ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවට අයත් සාමාජිකයින්ගේ දූවා දරුවන් වෙනුවෙන් මූලාධාර ප්‍රදානය කිරීම හා විශේෂ අවශ්‍යතා සහිත රණවිරු දූ දරුවන් හට රෝදපුටු පිරිනැමීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 23 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය මෙන්ම ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ඊට ප්‍රධාන අමුත්තිය ලෙස එක්වූවාය. තවද, එදිනම එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහසභා රැස්වීමද පැවැත්විණ.

# "සෞභාග්‍යා" අත්කම් හා වෙළඳ භාණ්ඩ ප්‍රදර්ශනය

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිගේ අධීක්‍ෂණය යටතේ කෘෂි හා පශු සම්පත් බලකා සේවා වනිත ශාඛාවේ සභාපතිනි ශාන්ති අබේසේකර මහත්මියගේ අදහසකට අනුව දිරිය ලියන් බලගැන්වීමේ අරමුණින් ඉකුත් සැප්තැම්බර් 22 වන දින සිට සැප්තැම්බර් 24 වන දින දක්වා පනාගොඩ බෝධිරාජාරාම පාසල් ක්‍රීඩාංගණයේදී "සෞභාග්‍යා" නමින් අත්කම් නිර්මාණ හා වෙළඳ භාණ්ඩ ප්‍රදර්ශනයක් අති උත්කර්ෂවත් අයුරින් පවත්වන ලදී.





දීප ව්‍යාප්තව සිටින්නා වූ රණවිරු බිරින්දෑවරු සහ සිවිල් දිරිය කාන්තාවන්ට දේශීය මෙන්ම විදේශීය වෙළඳපල ඉලක්ක කරගනිමින් සිය ස්වයං රැකියා සාර්ථක කර ගැනීමට අත්වැලක් සැපයීම මෙහි ප්‍රධාන අරමුණ විය. මෙමගින් සාධාරණ මිල ගණන් යටතේ පාරිභෝගිකයින් හට කෘෂි නිෂ්පාදන, අත්කම් නිර්මාණ, පාසල් උපකරණ සහ ආහාර වර්ග ආදී දෑ මිලදී ගැනීමට හැකියාව ලැබිණ. එහිදී, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය, රෙජිමේන්තු සේවා වනිතා ශාඛා, ප්‍රාදේශීය සිවිල් කාන්තාවන් සහ මහිලා සමිතිවල සහභාගීත්වයෙන් ව්‍යාපාර දියුණු කරගැනීම පිළිබඳ වැඩමුළු ද පැවැත්විණ.

# ගජබා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ 15 වන වාර්ෂික මහ සභා රැස්වීම සාර්ථකව





ගජබා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ 15 වන වාර්ෂික මහ සභා රැස්වීම යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් සැප්තැම්බර් 17 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. එහිදී රණවිරුවන්, සිවිල් සේවක මහතුන් හා ඔවුන්ගේ පවුල්වල ජීවන මට්ටම උසස් කිරීම අරමුණු කර ගනිමින් ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිත සුභසාධන ව්‍යාපෘතීන් පිළිබඳව සාකච්ඡා කෙරිණ.

# සංඥා බලකා සේවා වනිතා ශාඛාවෙන් ලේ දන්දීමේ වැඩසටහනක්



සංඥා බලකායේ 80 වන සංවත්සරයට සමගාමීව එම බලකා සේවා වනිතා ශාඛාව මගින් ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 06 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නාලිනි රත්නායක මහත්මියගේ මඟපෙන්වීම යටතේ විවිධ රෙජිමේන්තුවලට අයත් යුද්ධ හමුදා සාමාජිකයින් 100 කට අධික පිරිසක් මෙම උදාර කර්තව්‍යය සඳහා සහභාගී වූහ. මෙම වැඩසටහන සාර්ථකව සිදුකර ගැනීමට මහරගම අපේක්ෂා රෝහලේ ලේ බැංකුවේ වෛද්‍යවරු සහ කාර්ය මණ්ඩලය විසින් ලබාදුන්නේ මහඟු සහයෝගයකි.

# පාබල හමුදා සේවා වනිතා ශාඛාවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහනක්





පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි උත්පලා හෙට්ටිආරච්චි මහත්මියගේ අධීක්ෂණය මත එම රෙජිමේන්තුවේ දිවංගත සහ සේවයේ නියුතු රණවිරුවන්ගේ දරුවන් දිරිගැන්වීමේ අරමුණින් ඔවුන් වෙත ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහනක් එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ඉකුත් ඔක්තෝබර් 14 වන දින ක්‍රියාත්මක කෙරිණ. මෙම වැඩසටහනේදී 2022 අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් විශිෂ්ට දක්ෂතා දැක්වූ සිසු සිසුවියන් වෙත රු. 20,000.00 ක වටිනාකමකින් යුත් ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරිණ.

එහිදී දරුවන් හතර දෙනකු හෝ ඊට වැඩි ප්‍රමාණයකින් සමන්විත පවුල්වල ආර්ථික දුෂ්කරතාවයන් සඳහා සහන සැලසීමේ අරමුණින් පළමු මාසය සඳහා රුපියල් 10,000 ක් සහ ඊළඟ මාස දෙක සඳහා රු. 20,000 ක මූල්‍යමය දිරිගැන්වීම් පරිත්‍යාග කෙරිණි. මෙම වැඩසටහන අතරතුර, වෛද්‍ය රම්මි රූබන් විසින් "අන්තර් පුද්ගල චිකිත්සාව" පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක්ද පවත්වන ලදී. මෙම සැසිය මගින් සෞඛ්‍ය සම්පන්න සබඳතා ගොඩනගා ගැනීම, අන්තර් පුද්ගල ගැටලු විසඳීම සහ දවසේ වැඩකටයුතු සාර්ථක කරගැනීමට වටිනා අවස්ථාවක් සහ මඟපෙන්වීමක් ලබා දෙන ලදී.

# ගැමුණු හේවා සේවා වනිතා ශාඛාවෙන් ලෝක ළමා දිනයට සමගාමීව වැඩසටහනක්





ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි වෙලගෙදර මහත්මියගේ ප්‍රධානත්වයෙන් එහි සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් ලෝක ළමා දිනය වෙනුවෙන් ඉකුත් සැප්තැම්බර් 29 වන දින නන්පේරියල් වතුයායේ පිහිටා ඇති ඉතා දුෂ්කර පාසලක් වන විවේකානන්ද පාසල තුළ අඩුපාඩුවක්ව පැවති පුස්තකාලයක් ඉදිකර ඒ සඳහා අවශ්‍ය පොත්පත් පරිත්‍යාග කරන ලදී. එහිදී, එම දරුවන්ගේ විනෝදාස්වාදය වෙනුවෙන් විනෝද ක්‍රීඩා පැවැත්වීම සහ ත්‍යාග පිරිනැමීම සිදුකරන ලදී. තවද, ගැමුණු හේවා බලකායට අයත් සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන් ගේ දූ දරුවන් හට රුපියල් 30000.00 ක මුදලක් වැයකොට ළමුන් දෙදෙනකු වෙනුවෙන් උපැස් යුවල දෙකක් සහ පාසල් උපකරණ පරිත්‍යාග කිරීමද එහිදී සිදුවිය.

# රණක්ෂිතයට පත් විරුවන්ගේ සුවදුක් විමසමින්





විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි හිමාලි පුස්සැල්ල මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ අනුරාධපුර අභිමංසල I සුවසහන නිකේතනයෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ චිත්ත ධෛර්යය ඉහළ නැංවීම සහ ඔවුන්ගේ සුවදුක් සොයාබැලීම සඳහා ඉකුත් සැප්තැම්බර් 23 වන දින එහි සංචාරයක නිරතවූහ. එහිදී, එම රණවිරුවන් විසින් සිදුකරනු ලබන ඉදල් නිෂ්පාදන ගොඩනැගිල්ල නවීකරණය කර ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා භාරදෙන ලද අතර, එම නේවාසික රණවිරුවන් වෙත තෑගි බෙදාදීමට හා තේ පැන් සංග්‍රහයක්ද පිරිනැමීමටද කටයුතු කෙරිණ.

# කමාන්ඩෝ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවෙන් දූ දරුවන් වෙනුවෙන් වැඩසටහනක්



කමාන්ඩෝ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව මගින් ලෝක ළමා දිනයට සමගාමීව ඉකුත් ඔක්තෝබර් 01 වන දින කඩවත රම්මුතුගල විහාරයේ ශ්‍රී විමලවංශ ළමා සංවර්ධන මධ්‍යස්ථානයෙහි නේවාසික ළමුන් 19 දෙනකු වෙනුවෙන් මාහැඟි කටයුත්තක් ක්‍රියාත්මක කරන ලදී. එහිදී විශේෂ සංගීත වැඩසටහනක් පැවැත්වීම, ත්‍යාග ප්‍රදානය කිරීම සහ රාත්‍රී ආහාරය පිළිගැන්වීම සිදුවිය. මෙම අවස්ථාවට කමාන්ඩෝ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නිමාලි රණතුංග මහත්මිය ඇතුළු එම සේවා වනිතා සාමාජිකාවෝ පිරිසක් එක්වූහ.

# සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා සාමාජිකාවන් අනුරාධපුර අභිමංසල සුවසහන නිකේතනයේ සංචාරයක



සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි රජිතා ජයසූරිය මහත්මිය විසින් අනුරාධපුරය අභිමංසල සුවසහන නිකේතනයෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසීම සඳහා ඉකුත් සැප්තැම්බර් 26 වන දින සංචාරයක නිරත වූවාය. එහිදී, එම නිකේතනයෙන් කළ ඉල්ලීමකට අනුව විදුලි කේතල් 15 ක් පරිත්‍යාග කිරීමටද එම සේවා වනිතා ශාඛාව විසින් කටයුතු කරන ලදී.

# ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් 5 ශ්‍රේණියේ හපනුන්ට අත්වැලක්

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා සිසු සිසුවියන් සූදානම් කිරීමේ අරමුණින් ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ මූලිකත්වයෙන් ඉකුත් සැප්තැම්බර් 23 වන දින පනාගොඩ එම බලකා රෙජිමේන්තු මූලස්ථානයේදී "පහට පහක්" නමින් වැඩසටහන පැවැත්විය. මේ සඳහා කොළඹ රාජකීය විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රසාද් ලොකුබාලසූරිය මහතාගේ අනුග්‍රාහකත්වය හිමිවිය.



තවද, ලෝක ළමා දිනය නිමිත්තෙන් ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සුරංගි අමරපාල මහත්මියගේ මඟපෙන්වීම මත එම බලකා සාමාජිකයින්ගේ දරු දැරියන් වෙනුවෙන් ළමා වැඩසටහනක්ද පසුගිය ඔක්තෝබර් මස 07 වන දින ක්‍රියාත්මක කරනු ලැබීය. විනෝදාත්මක ක්‍රීඩා සහ ක්‍රියාකාරකම් සමගින් පැවති මෙම වැඩසටහන සඳහා සහභාගී වූ සියලුදෙනා වෙනුවෙන් ත්‍යාගද පිරිනැමුණි. සිසු සිසුවියන් වෙනුවෙන් පැවති සංගීත සංදර්ශනයක්ද දිවා භෝජනයක්ද එම වැඩසටහනට එකතුව තිබිණ.

# සෙබළියන්ගේ ප්‍රයෝජනය සඳහා නව රූපලාවන්‍යාගාරයක්





ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) යුද්ධ හමුදා ජනපදයේ ඉදිකළ අංගසම්පූර්ණ රූපලාවන්‍යාගාරයක් සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි තුෂාරි වනිගසේකර මහත්මිය විසින් ඉකුත් සැප්තැම්බර් 21 වන දින විවෘත කරනු ලැබුවාය. මෙම නව රූපලාවන්‍යාගාරය මගින් එම යුද්ධ හමුදා ජනපදයේ සේවයේ නියුතු සියලුම විරු ලියන්ගේ රූපලාවන්‍ය කටයුතු සහනදායී මිල ගණන් යටතේ නිසි ප්‍රමිතියකට අනුව සිදුකර ගැනීමට හැකිවනවා සේම, විවාහ මංගල උත්සව සඳහාද වට්ටම් සහිතව සේවාවන් ලබාගත හැකිවේ. මෙම අවස්ථාවට සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ පිරිසක්ද සහභාගී වූහ.

## යුධෝපකරණ බලකායේ සේවා වනිතා ශාඛාව මගින් සමාජ සත්කාරක වැඩසටහනක්





යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි බින්දුනි මාග්‍රට් රණසිංහ රණවක මහත්මියගේ උපදෙස් මත 4 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ අණදෙන නිලධාරීගේ අධීක්ෂණය යටතේ වත්තේගම "සුරස" ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ දී පසුගියදා වැඩසටහනක් සංවිධානය කරන ලදී. එහිදී, ළමුන් 28 දෙනකු සඳහා තෑගි පාර්සල්, වියළි සලාක පාර්සල් සහ දිවා ආහාරය ප්‍රදානය කිරීම සිදුකෙරිණ.

එසේම, ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා පුහුණු පාසලේ 32 වැනි සංවත්සරය නිමිත්තෙන්ද, වත්තේගම "සුරස" ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ළමුන් සඳහා වියළි සලාක පාර්සල් සහ තේ පැන් සංග්‍රහයක් පිරිනැමීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් මස 21 වන දින සිදුකරන ලදී. මානසික හා ශාරීරික දුබලතාවයන්ගෙන් පෙළෙන විවිධ වයස් කාණ්ඩවල ළමුන් 80 දෙනකු වෙනුවෙන් එහිදී සහන සැලසිණ.

## විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා වාර්ෂික මහ සභා රැස්වීම



විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ 16 වන වාර්ෂික මහ සභා රැස්වීම ඉකුත් සැප්තැම්බර් 26 වන දින එම බලකා නිලධාරී නිවස්නයේදී එහි සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තියන් වශයෙන් එම බලකා සේවා වනිතා ශාඛාවේ හිටපු සභාපතිනියන් වන චන්ද්‍රිකා පෙරේරා සහ ප්‍රියදර්ශනී සිරිනාග යන මහත්මීහු ද සහභාගී වූහ.

## පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් අපේක්ෂා රෝහල වෙත පරිත්‍යාගයක්

පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාව සහ එම බලකා පුහුණු පාසල සමඅනුග්‍රාහක දායකත්වය යටතේ මහරගම අපේක්ෂා රෝහල වෙත පළතුරු හා ද්‍රව්‍ය පිරිනැමීමේ විශේෂ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 14 වන දින පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ප්‍රියන්තිකා ද සොයිසා මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී. එම අවස්ථාවට පොලිස් හේවා බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු එම බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ පිරිසක්ද සහභාගී වූහ.



# පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් ලෝක ළමා දින වැඩසටහනක්






යුද්ධ හමුදා පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ආචාර්ය හිමාලි නියංගොඩ මහත්මියගේ අදහසකට අනුව එම බලකායේ බලකාධිපති ඇතුළු සියලුම නිලයින්ගේ පූර්ණ සහයෝගය මත කොළඹ සෙන්ටේනියල් සිංහ සමාජය හා අනෙකුත් අනුග්‍රාහක භවතුන්ගේ පරිත්‍යාග සමගින් කොල්ලුපිටිය ශාන්ත මයිකල් විද්‍යාලයෙහි දූ දරුවන් උදෙසා ඉකුත් ඔක්තෝබර් 10 වන දින වැඩසටහනක් සංවිධානය කෙරිණ. 2023 ලෝක ළමා දිනය තේමාකර ගනිමින් පැවැත්වූ එම වැඩසටහන මගින් විද්‍යාලයේ දරුවන් හට පාසල් උපකරණද බෙදාදුන් අතර මැජික් සංදර්ශනයක්, සංගීත ප්‍රසංගයක්, මානසික සංවර්ධනය පිළිබඳ දේශනයක් මෙන්ම දිවා භෝජන සංග්‍රහයක් ද එදින වැඩසටහනට ඇතුළත්ව තිබිණ.

# කාන්තා බලකා සේවා වනිතා ශාඛාවෙන් තවත් සමාජ මෙහෙවරක්

කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනී ශ්‍යාමලී විජේසේකර මහත්මියගේ ප්‍රධානත්වයෙන් මුල්ලේරියාව ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනයේ වාට්ටු අංක 05 හි නේවාසිකව ප්‍රතිකාර ලබන කාන්තා රෝගීන් 34 දෙනකු සහ කාර්ය මණ්ඩලය සඳහා විශේෂ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 26 වන දින පවත්වන ලදී. එහිදී, රෝහල් සංචාරයේ නිරතවූ සභාපතිතුමිය විසින් නේවාසිකව ප්‍රතිකාර ලබන කාන්තා රෝගීන් සහ කාර්ය මණ්ඩලයෙහි සුවදුක් විමසන ලද අතර ඔවුන් සඳහා විශේෂ සංගීත වැඩසටහනක් සහ තේ පැන් සංග්‍රහයක් ද පිරිනමන ලදී.

තවද, ආරක්ෂක සේනා (බටහිර) ආඥාපතිගේ මඟපෙන්වීමෙන් රෝහලට අයත් වතුර ටැංකිය ඉංජිනේරු සේවා රෙජිමේන්තුවට අයත් සෙනින්ගේ දායකත්වය මත අලුත්වැඩියා කරදීමටද කටයුතු යෙදිණ. මෙම සමාජ සත්කාරය සඳහා සේවා වනිතා ශාඛාවේ සභාපතිතුමිය ඇතුළු සාමාජිකාවන් රැසක් සහභාගී වූ අතර, වැඩසටහන අවසානයේ එම වාට්ටුව වෙත සහ රෝගීන් සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය රැසක්ද ප්‍රදානය කරන ලදී.





# කෘෂි හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය වැඩ භාරගනී

කෘෂි හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස ෂෙහානි ප්‍රනාන්දු මහත්මිය පසුගිය ඔක්තෝබර් 09 වන දින සුබ මොහොතින් වැඩ භාරගත්තාය.





# මරණ පරීක්ෂණ

මළවුන්ගේ ලෝකය අසිරිමත්ය. සමහර මළගිය ඇත්තෝ නැගිට්ති. මේ නිසා ජීවත්ව සිටින ඇත්තෝ බියවෙති. එවැනි අවස්ථා බොහෝය. මෙම පරීක්ෂණ සඳහා රජය මගින් විශේෂ පරීක්ෂකවරු පත්කර ඇති අතර, ඔවුන්ගේ සාධාරණ හා අපක්ෂපාතී පරීක්ෂණ හමුවේ මළගිය ඇත්තෝ නිදහසේ අවසන් ගමන් යති.

අවසන් ගමන් යන නැනැත්තාට ඒ සඳහා නිශ්චිත සහතිකයක් අවශ්‍ය වේ. මේවා ලබාගැනීම ළඟම ඥාතියාගේ/භාරකරුගේ වගකීමයි. ජීවත්ව සිටින වගකිවයුතු පුරවැසියන් ලෙස ඉහත සඳහන් ක්‍රියාදාමවලින් එකකට හෝ වැඩි ගණනකට සහභාගීවීමට අපට සිදුවෙයි. මේ නිසා එකී ක්‍රියාදාමයන් පිළිබඳව මූලික අවබෝධයක් අප සියලු දෙනාටම තිබිය යුතුයි.

## මරණ පරීක්ෂණ ඉතිහාසය

හදිසි මරණ හා අස්වාභාවික හේතූන් මත සිදුවන මරණ පිළිබඳ පරීක්ෂා කිරීමේ ක්‍රමයක් සෑම සමාජයකම පාහේ අතීතයේ සිටම පැවතුනි. සිංහල රජ දවස මරණ පරීක්ෂණ සඳහා රජු විසින් කෝරලේවරුන් සහ විදානේවරුන් පත්කරන ලදී. එදා එම පරීක්ෂණ ක්‍රියාවලිය හැඳින්වූයේ සාක්ෂි බලන්න  යනුවෙනි.

## මරණ පරීක්ෂණ ව්‍යාප්තිය

හදිසි මරණ පරීක්ෂක තනතුර ඉතා සම්භාවනීය වූත් ඉතා වගකීමෙන් යුක්ත වූත් තනතුරකි. හදිසි මරණ පිළිබඳ කඩිනම් එහෙත් පරිපූර්ණ සාධාරණ හා අපක්‍ෂපාති පරීක්ෂණයන් පවත්වා අධිකරණයට ආධාරවීමද, මිය ගිය අයගේ ඥාතීන්ට දේහය ඉක්මනින් භාරදීමද හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ ප්‍රධාන කාර්යයකි.

## මියයාම

පුද්ගලයකු මිය ගොස් ඇති බව ස්ථිර කිරීමට බොහෝ අවස්ථාවලදී කිසිදු විශේෂ වෛද්‍ය විද්‍යාත්මක දැනුමක් අවශ්‍ය නොවන අතර, සාමාන්‍ය දැනුමක් ඇති ඕනෑම අයකුට මරණය සිදුවී ඇති බව පහසුවෙන් හඳුනාගත හැක. එසේ වුවද පුද්ගලයකු මරණයට පත්වූ බව හඳුනා ගැනීමට වෛද්‍යවරයකුට වුවද අපහසු වන අවස්ථා නැතුවාම නොවේ. අප රටේ මරණ සහතික කිරීම පිළිබඳ නීතිමය අර්ථකථනය 1987 අවයව බද්ධ කිරීමේ පනත (Transplantation Act) යටතේ සිදුකර ඇත.

"දීර්ඝ කාලීනව ස්වයංක්‍රීය ආස්වාස ප්‍රාශ්වාස කිරීමේ හැකියාව නැතිවී ගිය

යම් පුද්ගලයකුගේ මොළයේ සියළුම කොටස්වල ක්‍රියාකාරීත්වය නැවත පණ ගැන්විය නොහැකි පරිදි අක්‍රිය වීම මියගිය මොහොත ලෙස සැළකේ"

## මරණය සිදුවූ වහාම දැකිය හැකි ලක්ෂණයන්

- ➤ සංවේදිතාවය සම්පූර්ණයෙන්ම නැතිවන අතර, බාහිර උත්තේජනයන්ට කිසිදු ප්‍රතිචාරයක් නොදක්වයි.
- ➤ සියලුම මාංශ පේශිවල ආතතිය ගිලිහී යාම හෙවත් ශිථිලතාව.
- ➤ ඇසේ කර්ණිකාව විශාල වන අතර, ආලෝක ධාරිතාවයකට ප්‍රතික්‍රියා නොදක්වයි.
- ➤ ශරීරයේ උෂ්ණත්වය පහත වැටීම (මරණය සිදුවී පළමු පැය 2 තුළ ශරීරයේ උෂ්ණත්වය ස්ථාවර මට්ටමක පවතින අතර, ඉන්පසු ක්‍රමක්‍රමයෙන් බාහිර පරිසරයේ උෂ්ණත්වය දක්වා පහත වැටේ.
- ➤ මෘත කාඨින්‍යය හෙවත් මරණයෙන් පසුව, වර්ධනය වන මාංශ පේශිවල තදවීම. (මියගිය වහාම මෘදු නම්‍යශීලී ස්භාවයක් ගත් සන්ධි පියවරෙන් පියවර තදවීමක් සිදුවේ.)
- ➤ පශ්චාත් මරණ අධෝස්ථිය - මිය යාමෙන් පසු රුධිර නාලිකා තුළ ඇති රුධිරය ගුරුත්වාකර්ශනය හේතු කොටගෙන සිරුරේ පොළවට ආසන්නව පහතින් පිහිටා ඇති ස්ථරවල සමට යටින් පිහිටා ඇති රුධිර නාලිකා තුළ එකරාශිවීම මෙලෙස හඳුන්වයි. මෙය හෘද ස්පන්ධනය නතර වුනු වහාම ඇරඹෙන්නකි.

## හදිසි මරණ

නිරෝගීව සිටින පුද්ගලයකු කිසිදු රෝග ලක්ෂණයක් නොමැතිව හෝ ලක්ෂණ මතුවී පැය 24 ක් තුළ මරණයට ලක්වීම හදිසි මරණයක් ලෙස හඳුන්වයි.

## මරණයක් සිදුවීමෙන් අනතුරුව රෝහලේ දී අනුගමනය කළ යුතු කාර්යයන්

රෝහලකදී මරණයක් සිදුවූ විට රෝගියා භාර වෛද්‍යවරයා විසින්, රෝගියා මියගිය වාට්ටුවේම එම මෘත ශරීරය පැය 02 ක කාලයක් තබාගනු ලැබේ. සමහර අවස්ථාවලදී රෝගියා මියගිය බව සෑම අතින්ම පෙනුනද සත්‍ය වශයෙන් ඔහු/ඇය මියනොගිය නොමැති අවස්ථා ඇත. එය තහවුරු තහවුරු කර ගැනීමට එසේ පැය දෙකක් වාට්ටුවේම තබා ගනී.

## පහත සඳහන් අවස්ථාවලදී එකනෙහිම පුද්ගලයකු මියගොස් ඇති බව තීරණය කිරීමට අපහසුය

1. සාමාන්‍ය නිර්වින්දනය.
2. දියෙහි ගිලීම.
3. විදුලි සැර වැදීම.
4. අසාමාන්‍ය හෝමෝන ක්‍රියාකාරීත්වය.
5. අධික සීතල.
6. මීමැස් මොරය සහ මොළයේ අසාමාන්‍ය විද්‍යුත් ක්‍රියාකාරීත්වය.
7. මත්ද්‍රව්‍ය හා සමහර ඖෂධ ශරීර ගත වීමෙන්.

ආදාළ මරණයට හේතුව වෛද්‍යවරයා දන්නා විටකදී ඔහු විසින් මරණ ප්‍රකාශ පෝරමය (Declaration of Death Form) නිසි ලෙස පුරවා ඥාතීන් වෙත නිකුත් කරනු ලැබේ. මෙහි මරණකරුගේ පුද්ගලික විස්තර සමග මරණයට හේතුව සඳහන් කරයි.

පුද්ගලික රෝහල් සහ පුද්ගලික වෛද්‍ය වෘත්තිකයන් මේ සම්බන්ධව නිකුත් කරනු ලබන්නේ මරණයට අදාළ වෛද්‍යමය හේතුව දැක්වෙන සහතිකයකි.(Certificate of the medical case of death) මරණයට හේතුව නොදන්නා අවස්ථාවලදී සහ යම්කිසි මරණයක් හදිසි මරණ පරික්ෂකවරයා හෝ මහේස්ත්‍රාත්වරයා වෙත අනිවාර්යෙන්ම යොමු කළ යුතුය.

පුද්ගලික රෝහලකදී පහත සඳහන් කරුණු සපුරන්නේනම් මරණකරුගේ අවසාන රෝගී තත්වයට ප්‍රතිකාර කළ වෛද්‍යවරයාට මරණයට අදාළ වෛද්‍යමය හේතුව සඳහන් පෝරමය නිකුත් කළ හැක.

1. මරණයට හේතුව දැන සිටිය යුතුය.
2. මරණය ස්භාවික එකක් විය යුතුය.
3. එම වෛද්‍යවරයා මරණකරුගේ අවසාන රෝගී තත්වයට ප්‍රතිකාර කළ වෛද්‍යවරයා විය යුතුය.
4. එම වෛද්‍යවරයා විසින් මෘත ශරීරය නිසි පරික්ෂාවට ලක්කර මියගිය ආකාරය පිළිබඳ (එනම්, හදිසි අනතුරක්/සියදිවි නසා ගැනීමක්/මිනීමැරුමක් නොවන බවට) සෑහීමකට පත්විය යුතුය.
5. මේ සඳහා මුදලක් අය නොකළ යුතුය.

ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලීමට නොහැකිනම් මරණය පිළිබඳ එම ප්‍රදේශය භාර පොලිස් ස්ථානාධිපතිවරයාට දැනුම් දිය යුතුය. ඔහු විසින් හදිසි මරණ පරික්ෂණයක් සඳහා අවස්ථානුකූලව එය හදිසි මරණ පරික්ෂකවරයාට/මහේස්ත්‍රාත්වරයාට දැනුම් දීමට පියවර ගත යුතුය.

රජයේ රෝහලකදී සිදුවන මරණ ලියාපදිංචිය සඳහා අදාල විස්තර ලබාදීම රෝහලභාර නිලධාරියාගේ වගකීමක් ලෙස සලකනු ලැබේ. පුද්ගලික රෝහලකදී සිදුවන මරණයක් නිවසක සිදුවන මරණයක් ලෙසට සලකන බැවින්, එය ලියාපදිංචි කිරීම සඳහා අදාල විස්තර ලබාදීම මියගිය තැනත්තාගේ ඥාතීන්ගේ වගකීම ලෙස සලකනු ලැබේ.

## රෝහලින් බාහිර ස්ථානයකදී සිදුවන මරණ

එනම් නිවසක, වෙනත් ගොඩනැගිල්ලක, පොදු ස්ථානයක හෝ වෙනත් එළිමහන් ස්ථානයක ආදී වශයෙන් සිදුවන මරණ මෙයට ඇතුළත් වේ.

## හදිසි මරණ පරීක්ෂණ

ඉහතින් සඳහන් කළ හදිසි මරණය යන නිර්වචනයට අනුව හදිසි මරණයකදී මරණයට හේතුව කිසිවකු නොදනී. හදිසි මරණ පරීක්ෂණයක මූලික අරමුණ වන්නේ අදාළ මරණයට හේතුව සොයා ගැනීමයි. මීට අමතරව, පහත සඳහන් කාරණා ගැටළු සහගත වන අවස්ථාවන්වලදී ඒවා හෙළිදරව් කරගැනීමද අරමුණු කෙරේ.

1. මිය ගිය පුද්ගලයාගේ අනන්‍යතාවය.
2. කවර ස්ථානයකදී මරණයට පත්ව ඇද්ද යන්න.
3. කවර වේලාවකදී මරණයට පත්ව ඇද්ද යන්න.

4. මරණය ස්භාවික හෝ සියදිවි නසා ගැනීමක් හෝ හදිසි අනතුරක් හෝ මිනී මැරුමක්ද යන්න.

ඇතැම් අවස්ථාවකදී හදිසි, අස්වාභාවික හෝ යම් සාහසික අපරාධයකින් සිදුවූ මරණ හෝ සැක කටයුතු අවස්ථාගත කරුණු යටතේ වූ මරණ හෝ එවැනි මෘත ශරීර හමුවීම පිළිබඳ තොරතුරු පමාවට සැහෙන හේතුවක් නොමැති විට නොපමාව ළඟම පිහිටි මහේස්ත්‍රාත් අධිකරණය වෙත දැනුම් දිය යුතුය. ඒ සඳහා බලය තිබෙන්නේ හදිසි මරණ පරීක්ෂකවරයකුට හෝ මහේස්ත්‍රාත්වරයාට හට පමණි. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 370 වගන්තියට අනුව යම් තැනැත්තකු

1. සිය දිවි නසාගෙන ඇති බවට හෝ

2. යම් සතකු විසින් මරණයටපත් කරනු ලැබ ඇති බවට හෝ යම් යන්ත්‍රෝපකරණයක් නිසා නැතහොත් යම් අනතුරක් නිසා මරණයට පත්වී ඇති බවට හෝ

3. හදිසියේ හෝ නොදන්නා හේතුවකින් හෝ මියගොස් ඇති බවට

තොරතුරක් ලැබුණු විට, සෑම මරණ පරීක්ෂකවරයකුම එසේ මිය ගිය තැනැත්තාගේ සිරුර තිබෙන ස්ථානයට වහාම ගොස් එහිදී පරීක්ෂණය පැවැත්විය යුතුය. එහිදී, සිරුරේ දක්නට ඇති තුවාල, කැඩුම්, බිඳුම්, සීරීම් සහ වෙනත් තුවාල ලකුණු ද තමාගේ මතය අනුව මරණයට හේතුව හා සම්බන්ධ විය හැකි ලකුණු විස්තර කරමින් සහ පෙනී යන අන්දමට ඒ ලකුණු ඇතිවී තිබෙන්නේ කවර ආකාරයකින්ද යන වග සඳහන් කළ යුතුය. පසුව මරණය පිළිබඳ දෘශ්‍යමාන හේතුව දැක්වෙන වාර්තාවක් සකස් කළ යුතුය. එම වාර්තාව එම මරණ පරීක්ෂකවරයා විසින්ම අත්සන්කර බල ප්‍රදේශයේ මහේස්ත්‍රාත්වරයා වෙත නොපමාව ඉදිරිපත් කළ යුතුය.

මරණ පරීක්ෂණය සිදුකරන අවස්ථාවේදී මරණ පරීක්ෂණයට අදාල යම් කිසි සාක්ෂි කරුවෙකු තමා ඉදිරියේ සාක්ෂිදීම හෝ යම් ලියවිල්ලක් හෝ වෙනත් යමක් ඉදිරිපත් කිරීමට යෝග්‍ය යැයි සිතන්නේ නම්, එසේ පැමිණීම සඳහා බලකර සිටීම පිණිස සිතාසි නිකුත් කිරීමට හදිසි මරණ පරීක්ෂකවරයාට පිළිවන.

(අ.න.වි.ස) (370(5), (370(6) උප වගන්තිය) එලෙස කැඳවනු ලැබූ යම් තැනැත්තකු එහි සිතාසියේ සඳහන් දිනයට, වේලාවට සඳහන් ස්ථානයට පැමිණීම පැහැර හැරියහොත් ඔහු භාරයට ගෙන මරණ පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කරන ලෙසට වරෙන්තුවක් නිකුත් කළ හැකිය.

මරණ පරීක්ෂණ පවත්වන ස්ථානයක් මහජනයාට විවෘත විය යුතුය. එහෙත් යෝග්‍ය යැයි සිතනු ලබන විශේෂ අවස්ථා හේතු කොටගෙන පරීක්ෂණය ඕනෑම අවස්ථාවකදී මහජනතාවගෙන් බැහැර කිරීමට පුළුවන.

හදිසි මරණ පරීක්ෂකවරයා/ මහේස්ත්‍රාත්වරයා විසින් ඇතැම් අවස්ථාවලදී මියගිය තැනැත්තා අදාළ වෛද්‍ය වාර්තාව, මරණයට අදාළ අනෙකුත් ලියවිලි (උදාහරණ ලෙස සියදිවි නසා ගැනීමකදී ලියා තබන ලිපි හෝ වෙනත් අදාළ ද්‍රව්‍ය, වස පානය කළේ නම් අදාළ භාජනය, භාවිතා කළ ඖෂධ, ගෙල වැළලා ගැනීමකදී නම් ඊට අදාළ තොණ්ඩුව) ගෙන්වා ගනී. තමා යෝග්‍ය යැයි සිතනු ලබන අවස්ථාවලදී පශ්චාත් මරණ පරීක්ෂණයක් පවත්වා මරණයට හේතුව වාර්තා කරනු පිණිස මෙම සාක්ෂි ඉදිරිපත් ඉදිරිපත් කළ හැකිය.

සිය ප්‍රථම පරීක්ෂණයේදී විවිධ හේතූන් නිසා මරණයට හේතුව හෝ එය ස්භාවික හේතුවක්, හදිසි අනතුරක් සියදිවි නසා ගැනීමක් හෝ මිනී මැරුමක් නිසාද යන්න තීරණය කිරීමට නොහැකි වීමට පිළිවන. මෙවැනි අවස්ථාවකදී හදිසි මරණ පරීක්ෂකවරයා/මහේස්ත්‍රාත්වරයා විසින් මරණ පරීක්ෂණයේ තීන්දුව "විවෘත තීන්දුවක්" ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ. පසු කාලීනව සියලු සාක්ෂි ප්‍රමාණවත් ලෙස ලැබුණු විටදී සිය අවසාන තීන්දුව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

## හදිසි මරණ පරීක්ෂකවරයකුට දැනුම් දිය යුතු මරණ මොනවාද ?

1. මරණයට හේතුව ස්ථිරවම නොදන්නා අවස්ථාවකදී.

2. මරණයෙන් පසුව රජයේ/පෞද්ගලික රෝහලකට ඇතුළත් කළ අවස්ථාවකදී.

3. රෝහලක සැලකිය යුතු ප්‍රතිකාර සිදුකරන අවස්ථාවක මිය ගිය විටකදී.

4. ප්‍රතිකාර කිරීම සම්බන්ධයෙන් යම් කිසි නොසැලකිල්ලක් ඇති විටදී හෝ එවැනි චෝදනා ඇති අවස්ථාවකදී.

5. අධික උෂ්ණත්වය හෝ සීතල නිසා සිදුවන මරණ.

6. නිරාහාරව හෝ නොසැලකිල්ල නිසා සිදුවන මරණ.

7. අනතුරු නිසා සිදුවන මරණ (රිය අනතුරු, දියේ ගිලීම, පිළිස්සීම්, විදුලි සැර වැදීම්, සර්ප දෂ්ටන,යන්ත්‍රෝපකරණ මගින් සිදුවන අනතුරු)

8. වස විෂ ශරීරගත වීම නිසා සිදුවන මරණ.

9. මත්ද්‍රව්‍යය/මත්පැන් ශරීරගතවීම නිසා සිදුවන මරණ.

10. ගබ්සා සිදුකිරීමක් නිසා සිදුවන මරණ.

11. සියලු මාතෘ මරණ.

12. පොදු මහජනතාවට බලපෑමක් ඇතිවිය හැකි අන්දමේ මරණ (වසංගතරෝග, ආහාර විෂවීම)

13. ස්භාවික විපත් (ගංවතුර, සුනාමි)

## මහේස්ත්‍රාත්වරයකුට යොමුකළ යුතු මරණ මොනවාද?

1. පොලිස් අත්අඩංගුවේ, රිමාන්ඩ් බන්ධනාගාරයේ හෝ බන්ධනාගාරයේදී සිදුවන මරණ.

2. මානසික හෝ ලාදුරු රෝහලකදී සිදුවන මරණ.

3. සියලු මිනීමැරුම්.

ඉහත සඳහන් කළ ආකාරයට ඕනෑම පුද්ගලයකුගේ මරණයක් හදිසි මරණ පරීක්ෂකවරයකුගේ හෝ මහේස්ත්‍රාත්වරයකුගේ පරීක්ෂණයට භාජනය විය යුතු අතර, එය සාධාරණ හා අපක්ෂපාතී පරීක්ෂණයක් විය යුතුය.



සෙ/704477
කෝප්‍රල් බණ්ඩාර එච්එම්එම්එන්
මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය



# තැනැත්තන් වෙළඳාම හා නීතිය (Human Trafficking and Law)

මිනිස් වෙළඳාම (Human Trafficking) අද ලෝකයේ වේගයෙන්ම ව්‍යාප්ත වන අපරාධ වැරදි අතරින් ඉතා අමානුෂික ස්වභාවයේ වරදක් වශයෙන් හඳුනාගෙන තිබේ. විශේෂයෙන්ම මෙය සංවිධානාත්මක වරදක් වශයෙන් සැලකෙන අතර කාන්තාවන් හා දරුවන් වැඩිප්‍රතිශතයක් වින්දිතයන් බවට පත්වන ස්වභාවයක් ලෝකය පුරාම දක්නට ලැබේ. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මිනිසුන් විවිධ අරමුණු සඳහා විකිණීම මෙහිදී සිදුවන අතර, ස්ත්‍රී-පුරුෂ හා දරුවන්-වැඩිහිටියන් යන කිසිදු භේදයකින් තොරව මුදලට හුවමාරුවීමක් මෙහිදී සිදුවෙයි. තවද, මෙය දේශීය හා අන්තර්ජාතික වශයෙන්ද මෙම වරදේ ව්‍යාප්තියක් දක්නට ලැබෙන අතර සමස්ත ලෝක ප්‍රජාවටම මෙය මහත් තර්ජනයක් ගෙන දෙන අපරාධයක් බවට පත්වී ඇත්තේ එය සමස්ත මානව වර්ගයාගේ මූලික මිනිස් අයිතිවාසිකම් පවා ඉතා කණගාටුදායක ලෙස උල්ලංඝනය කරන මානව නිදහස මුදලට අලෙවිකරන බරපතල ගණයේ අපරාධයක් නිසා බව අපරාධ විද්‍යාව පිළිබඳ විශේෂඥයන් අවධාරණය කර ඇත.

**තැනැත්තන් වෙළඳාම හා අන්තර්ජාතික නීතිය**

එක්සත් ජාතීන්ගේ සංවිධානාත්මක අපරාධවලට එරෙහි අන්තර්ජාතික සම්මුතිය (United Nation Convention Against Transnational Organized Crimes) ලෝකයේ සංවිධානාත්මක අපරාධ මැඩලීම සම්බන්ධයෙන් ආදර්ශවත් නෛතික රාමුවක් හඳුන්වාදෙන අතර, මෙම සම්මුතියට ගෙන එන ලද ප්‍රෝටකෝලය (Palermo Protocol) මගින් විශේෂයෙන්ම මිනිස් වෙළඳාම වැළැක්වීම, මැඩලීම හා අපරාධකරුවන්ට නීතියෙන් දඬුවම් පැමිණවීම සම්බන්ධයෙන් ආදර්ශ නීති පද්ධතියක් හඳුන්වා දී ඇත. ශ්‍රී ලංකාවද මෙම අන්තර්ජාතික සම්මුතියට අත්සන් තබා හා අපරානුමත කර ඇති රාජ්‍යයක් ලෙස මිනිස් වෙළඳාමට එරෙහිව ශක්තිමත් නීති රාමුවක් දේශීයව සැකසීමටත් මිනිස් වෙළඳාම පිටුදැකීමට සියලු ක්‍රියාමාර්ග ගැනීමටත් වගකීමෙන් බැඳී ඇත.

පැලමෝර් ප්‍රෝටකෝලයේ 3(a) ව්‍යවස්ථාව මගින් මිනිස් වෙළඳාම පහත දැක්වෙන අයුරින් අර්ථ නිරූපණය කර ඇත.

*"Trafficking in Persons shall mean the act of recruitment, transportation,*

*transfers, habouring or receipt or persons, by means of the threat or use of force or other forms of coercion, of abduction, of fraud, of deception, of the abuse of power of a position of vulnerability or of the giving or receiving of payments or benefits to achieve the consent of a person having control over another person for the purpose of exploitation. Exploitation shall include at a minimum, the exploitation of the prostitution of others or other forms of sexual exploitation, forced labour or services, slavery or practices similar to slavery, servitude or the removal of organs".*

එනම්, යම් තැනැත්තකු සූරාකෑමකට ලක්කිරීමේ අරමුණ ඇතිව තර්ජනයෙන්, බලපෑම් කිරීමෙන්, පැහැරගෙන යාමෙන්, වංචාවෙන්, රැවටීමෙන්, පෙලඹවීමෙන් හෝ එවන් පුද්ගලයකු මුහුණදෙන පීඩාවක් අයුතු ලෙස අවභාවිතකර එවන් තැනැත්තකුගේ කැමැත්තෙන් තොරව හෝ යම් තැනැත්තකුගේ පාලනය යටතේ සිටින වෙනත් යම් පුද්ලගලයකු එසේ සූරාකෑමට ලක්කිරීම සඳහා මුල්‍යමය හෝ වෙනත් වරප්‍රසාද දීමෙන් කැමැත්ත ලබාගෙන බඳවාගැනීම, ප්‍රවාහනය කිරීම, යම් ස්ථානයකින් වෙනත් ස්ථානයකට මාරුකිරීම, රඳවා තබාගැනීම හෝ තැනැත්තන් භාරගැනීම මිනිස් වෙළඳාම යනුවෙන් විග්‍රහ කර ඇති අතර සූරාකෑම යන්නට ගණිකා වෘත්තියේ යෙදවීම, වෙනත් යම් ලිංගික සූරාකෑම්, වහල්භාවය හා ඒ හා සමාන බලහත්කාරයෙන් සේවාවන්වල යෙදවීම, බලෙන් වැඩ ගැනීම, පරවශ්‍යතාවයන් හා ශරීරාංග ඉවත්කිරීම් යනාදියද අන්තර්ගත වේ.

## තැනැත්තන් වෙළඳාම හා ශ්‍රී ලංකා නීතිය

ශ්‍රී ලංකාව ද්විත්ව න්‍යාය (Dualism Legal System) අනුගමනය කරන රාජ්‍යක් ලෙස මෙම අන්තර්ජාතික නීතිය දේශීය නීති පද්ධතියට හඳුන්වාදී බලගැන්වීම සඳහා 2006 අංක 16 දරණ සංශෝධිත පනතේ 360(ඇ)(1) වගන්තිය මගින් කටයුතු කර ඇත. එනම්, මෙය "තැනැත්තන් වෙළඳාම" යනුවෙන් ලංකා නීතිය හඳුනාගනී.

මෙම වගන්තියෙන් විග්‍රහ කරන ආකාරයට මූල්‍යමය හෝ වෙනත් යම් ප්‍රතිෂ්ඨාවක් ලබාගෙන තැනැත්තකු තර්ජනයෙන්, බලපෑම් කිරීමෙන්, වංචාවෙන්, රැවටීමෙන්, පෙලඹවීමෙන් හෝ එවන් පුද්ගලයකු මුහුණදෙන පීඩාවක් අයුතු ලෙස අවභාවිත කර එවන් තැනැත්තකුගේ කැමැත්තෙන් තොරව හෝ ළමයකු නම් කැමැත්ත ඇතිව හෝ නැතිව, බලහත්කරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩගැනීම හෝ සේවය ලබාගැනීම, වෛශ්‍ය වෘත්තියේ යෙදවීම සඳහා, වහල්භාවයේ යෙදවීම හෝ පරවශ්‍යතාවයක් ක්‍රියාත්මක කිරීම සඳහා, වෙනත් යම් ආකාරයක අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම සඳහා හෝ වෙනත් යම් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන්නා වූ වෙනත් යම් ක්‍රියාවක් සඳහා යොදාගැනීමේ අරමුණ ඇතිව;

- විකුණන/මිලදීගනු ලබන/හුවමාරු කරන
- තැනැත්තකු විකිණීමට, මිලදීගැනීමට හෝ හුවමාරු කරගැනීමට පොළඹවන
- තැනැත්තකු විකිණීම, මිලදීගැනීම හෝ හුවමාරු කරගැනීම ප්‍රවර්ධනය කරන
- ඉහත කී කාර්යයන් සඳහා පහසුකම් සැලැස්වීම
- එවැනි සූරාකෑමක් සඳහා බඳවා ගැනීම,
- ඉහත කී කාර්යයන් සඳහා ප්‍රවාහනය කිරීම,
- ඉහත කී කාර්යයන් සඳහා ස්ථාන මාරු කිරීම
- ඉහත කී කාර්යයන් සඳහා රඳවා තබාගැනීම
- ඉහත කී කාර්යයන් සඳහා තැනැත්තන් භාරගැනීම

සිදුකරන ඕනෑම පුද්ගලයකු තැනැත්තන් වෙළඳාම යන වරද සිදුකරනු ලබන බවයි.

එනම්, මෙම තැනැත්තන් වෙළඳාම සංස්ථාපනය වීම සඳහා ප්‍රධාන මූලිකාංග තුනක් තෘප්තවිය යුතුවේ. එනම් ක්‍රියාව, ක්‍රමවේදය හා අරමුණයි. මෙය සරළව පහත දැක්වෙන වගුව ඇසුරෙන් අධ්‍යනය කළ හැකියි.

| ක්‍රියාව | ක්‍රමවේදයන් | අරමුණ |
|---|---|---|
| විකිණීම/මිලදීගැනීම,<br>හුවමාරුකිරීම,<br>බඳවාගැනීම,<br>ප්‍රවාහනය,<br>රඳවා තබාගැනීම,<br>ප්‍රවර්ධනය. | තර්ජනයෙන්,<br>බලපෑම් කිරීමෙන්,<br>වංචාවෙන්,<br>රැවටීමෙන්,<br>පෙලඹවීමෙන්,<br>පුද්ගලයකුගේ මුහුණදෙන පීඩාවක් අයුතු ලෙස අවභාවිත කිරීම,<br>පැහැරගෙන යාම,<br>බලය අයුතු ලෙස භාවිත කිරීම. | අනිවාර්යයෙන් වැඩගැනීම හෝ සේවය ලබාගැනීම, වෛශ්‍ය වෘත්තියේ, යෙදවීම සඳහා වහල්භාවයේ යෙදවීම හෝ පරවශ්‍යතාවයක් ක්‍රියාත්මක කිරීම සඳහා,<br>වෙනත් යම් ආකාරයක අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම සඳහා වෙනත් යම් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන්නා වූ වෙනත් යම් ක්‍රියාවක් සඳහා යොදා ගැනීම, ශරීර අවයව ඉවත්කිරීම සඳහා. |

මෙහිදී, විශේෂයෙන්ම සැලකිය යුතු කාරණයක් වන්නේ තැනැත්තන් වෙළඳාමේ වින්දිතයකු ලෙස දරුවකු හඳුනාගන්නා අවස්ථාවකදී එම දරුවාගේ කැමැත්ත යන්න අධිකරණය විසින් වරද ඔප්පු කිරීමේදී සලකා බලන කාරණයක් නොවීමයි. එමෙන්ම, විකුණුම්කරු හා ගැණුම්කරු අතර මුදල් හුවමාරුවීමක්ම සලකා බැලීම අවශ්‍ය නොවන අතර ඒ වෙනුවෙන් යම් සැලකිය යුතු ප්‍රතිෂ්ඨාවක් හුවමාරුවී තිබේද යන්න සලකා බැලිය යුතුවේ.

මෙම වරද බරපතල ගණයේ වරදක් වශයෙන් ජාත්‍යන්තර මෙන්ම ශ්‍රී ලංකා නීතියද හඳුනාගන්නා අතර, අපරාධ නඩුවිධාන සංග්‍රහ පනතේ ප්‍රතිපාදන අනුව ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහ පනතේ 360 වගන්තිය යටතේ කියවන වැරදි,

- සංඥෙය වැරදි (Cognizable offences),
- ඇප දිය නොහැකි වැරදි (None- bailable offences)
- සමතකළ නොහැකි වැරදි (Not compoundable offences)

ලෙස හඳුනාගන්නා අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලබන අයකුට වසර 2-20 දක්වා සිරදඬුවමකින් දඬුයම් කළ හැකි අතර, දඩයකට යටත් කළ හැකිය. වින්දිතයා දරුවකු වන අවස්ථාවකදී අවම සිරදඬුවම වසර 3 වන අතර, එය වසර 20 දකවා දීර්ඝ වියහැකි අතර දඩයකටද යටත්විය හැකියි.

පහත සඳහන් නිදර්ශන අධ්‍යනය තුළින් මෙම වරද පිළිබඳව මනා ප්‍රායෝගික අවබෝධයක් ලබාගැනීමට හැකිය.

1. හම්බන්තොට උන්න කමලා බලෙන් රැගෙන යන සිරිපාල පුත්තලමේ කරවල වාඩියක කරවල වේලන්න එම කරවල වාඩියේ හිමියාට විකුණනවා. කරවල වාඩියේ අයිතිකාරයා කමලාට කන්න බොන්න අඳින්න දෙනවා. ඒත් කමලාට වාඩියෙන් පිට වෙන්න දෙන්නෙ නෑ. කමලා බයට එතන වැඩකරනවා.

2. උසස් පෙළ විභාගේ ප්‍රතිඵල එනකම් බලන් ඉන්න යමුනා ගෙදර තියෙන අගහිගකම් නිසා රැකියාවක් හොයනවා. කොළඹ නිතර යන එන ගමේ ඉන්න සිල්වා මහත්තයා පොරොන්දු වෙනවා යමුනට කොළඹ ආයුර්වේද මධ්‍යස්ථානයක කවුන්ටරයක රැකියාවක් හොයා දෙන්න. ඒ අනුව යමුණා සිල්වා මහත්තයා එක්ක සිය මව සමඟ එම රැකියා ස්ථානයට යනවා. ආයුර්වේද මධ්‍යස්ථානයේ සිටින එහි හිමිකාරිය, ලිසී නෝනා එය ආයුර්වේද මධ්‍යස්ථානයක් බව පවසමින් යමුනාව එහි නතරකර ගන්නවා. ඒත් පසුව යමුනාට දැනගන්න ලැබෙන්නෙත් එය මුදලට පුරුෂයින් සම්භාහනය කරන ස්ථානයක් බවත් එහිදී පැමිණෙන පුද්ගලයින් හට අයුතු ලිංගික සන්තර්පනයන් කිරීමට ඔවුන්ට සිදුවන බව. සිල්වා මහතාගේ ව්‍යාපාරය වන්නේ ගම්බද තරුණියන් මෙවැනි ස්ථානවලට විකිණීමයි.

3. ඇල්ෆඩ් මහත්තයා රහසිගතව කන්සා හේනක් වවනවා. මේකේ වැඩට මිනිස්සු සපයන්නේ ගමේ පෝරිසාදයෙක් වන ඩන්කන්. සියදෝරිස් ගමේ ඉන්න අහිංසක මනුස්සයෙක්. ඩන්කන් සිරිමල් එක්ක කථාකරගෙන සිරිමල්ගේ වාහනෙන් සියදෝරිස්ව බලෙන්ම රැගෙන ගොස් ඇල්ෆඩ් මහතාට රුපියල් ලක්ෂයකට විකුණලා සල්ලි බෙදා ගන්නව. නැවත එම ස්ථානයෙන් පලා එන්න පාරක්වත් දන්නෙ නැති සියදෝරිස් කංසා වගාව කරමින් එතන ඉන්නවා.

4. වවුමේ වාසය කරන ප්‍රනාන්දු ගමේ වාසය කරන නීල්ට පවසන්නේ තමාගේ නිවසේ මෙහෙකාර සේවයට ගමෙන් කොල්ලකු ගෙනත් දුනහොත් ගමේ තමන්ගේ නමින් ඇති කුඹුරු ඉඩම නීල්ගේ නමට ලියාදෙන බවයි. ඒ අනුව වයස අවුරුදු 17 වන සමන්ත හා ඔවුන්ගේ දෙමාපියන් රවටන නීල් සමන්ත ගෙනවිත් ප්‍රනාන්දුට භාරදී ඉඩම තමන්ගේ නමට ලියා ගනී.

5. විදේශ ආයතන සමග ගණුදෙණු කරන පුද්ගලයකු වන ඩයස් හට විදේශිකයකු පවසන්නේ අසාධ්‍ය තත්ත්වයේ පසුවන රෝගීන් කිපදෙනකු වෙනුවෙන් වකුගඩු කිහිපයක් අවශ්‍යවී ඇති බැවින් මෙහෙකාර සේවය සඳහා පුද්ගලයින් එවන ලෙසට අඟවා කාන්තාවන් 10 දෙනකු විදේශගත කරන ලෙසත්, ඒ වෙනුවෙන් ඩයස් මහතා සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් හට විදේශ රටක පුරවැසිභාවය ලබාදිය හැකි බවයි. ඒ අනුව ඩයස් විසින් කාන්තාවන් රවටා විදේශගත කරවයි.

6. රහසිගතව ගණිකා නිවාසයක් පවත්වාගෙන යන කුමාරි විදේශ රටක එවැනිම ව්‍යාපාරයක් පවත්වාගෙන යන ඇල්ෆඩ් සමග ගිවිසුමකට එළඹෙන්නේ විදේශ කාන්තාවන් 10 දෙනකු සඳහා මෙරට කාන්තාවන් සිය ව්‍යාපාරය කටයුතු වෙනුවෙන් හුවමාරු කරගැනීමටයි. ඒ අනුව එම කාන්තාවන්ට විදේශ රැකියා සොයාදෙන බව පවසා ඔවුන්ව රවටා විදේශගත කරවයි.

7. ටෙලිනාට්‍යයක රඟපෑමට අවස්ථාව ලබාදෙන බව පවසා තරුණියන් රවටා ගෙනවිත් පුහුණු වැඩමුළුවක් පවත්වන අයුරින් ඔවුන් රවටා රඳවා තබාගෙන සිටින ප්‍රසිද්ධ නළුවකු වන විදුර එම කාන්තාවන් මුදලට විකිණීම සඳහා වෙබ් අඩවියක් මාර්ගයෙන් ප්‍රසිද්ධව පත්කරයි.

8. ජනප්‍රිය රූපවාහිනී රියැලිටි වැඩසටහනක් බව අඟවා ළමුන් එක් රැස්කර පුහුණු වැඩමුළුවක් පවත්වන අයුරින් ඔවුන් රවටා රඳවා තබාගෙන සිටින ප්‍රසිද්ධ රූපවාහිනී වැඩසටහන් අධ්‍යක්ෂවරයකු වන ලයනල් එම දරුවන්ගේ ඡායාරූප විකිණීම සඳහා වෙබ් අඩවියක් මාර්ගයෙන් ප්‍රසිද්ධියට පත්කරන අතරතුර ලයනල්ගේ මිතුරියක වන අම්ෂා විසින් එම වෙබ් අඩවියේ එම අදාළ දැන්වීම තවදුරටත් ප්‍රසිද්ධ කිරීමේ අරමුණ ඇතිව විවිධ සමාජ මාධ්‍යජාල හරහා එය තවදුරටත් ප්‍රවර්ධනය කරනු ලබයි.

9. ටෙලිනාට්‍යයක රඟපෑමට අවස්ථාව ලබාදෙන බව පවසා තරුණියන් රවටා ගෙනවිත් පුහුණු වැඩමුළුවක් පවත්වන අයුරින් ඔවුන් රවටා රඳවා තබාගෙන සිටින ප්‍රසිද්ධ නළුවකු වන විදුර එම කාන්තාවන් මුදලට විකිණීම සඳහා වෙබ් අඩවියක් මාර්ගයෙන් ප්‍රසිද්ධියට පත් කරයි. එම වෙබ් අඩවිය ඔස්සේ කරනු ලබන ඉල්ලීම්වලට අනුව තෝරාගනු ලැබූ කාන්තාවන් රංගන අවස්ථාවක් ලබාදෙන අයුරින් තවදුරටත් රවටා ලිංගික ක්‍රියාකාරකම්වල යෙදවීම සඳහා රූපවාහිනී ලෙස රංගන ස්ථානයක් ලෙස සකසා ඇති ගොඩනැගිලි පරිශ්‍රයක් හා කාමර ලබාදීමට අනුර කටයුතු කරයි.

10. දෙමාපියන් අහිමි අනාථ නිවාසයක සිටින දරුවන් ලිංගික සන්තර්පනය සඳහා විදේශිකයින්ට විකිණීමට රොඩ්රිගෝ අනාථ නිවාසයේ පාලිකාව වන ලුසියා පෙළඹවීමට ඇයට අති සුඛෝපභෝගී කාර් රථයක් ලබාදෙයි. ඒ අනුව ලුසියා විසින් දරුවන්ගේ ඡායාරූප එකී අරමුණ උදෙසා සමාජ මාධ්‍යජාලා වෙත මුදාහැරීමට රොඩ්රිගෝ වෙත ලබාදෙයි.

11. වයෝවෘද්ධ සුමනා හට හොඳින් කෑම පිළියෙල කිරීමට හැකියාව ඇත. ගමේ තේ කඩේට හැලප හදා විකුණා ජීවත්වන ඇය හුදෙකලාව ගමේ පන්සලට අයත් ඉඩමක පැලක් සකසාගෙන ජීවත් වෙයි. ඩැනිසන් විසින් සුමනාට ඇස් කන්නාඩියක් අරන් දෙන බවට පොරොන්දු වී ඇය කොළඹට රැගෙන විත් ශාන්ත නම් හෝටල් හිමියකුට ඇය ලබාදෙයි. සුමනා හට ඉන්න හිටින්නට තැනක් ලැබෙන නමුත් දිනපතා හෝටලයේ ආහාර පිසීමට, පිඟන් කෝප්ප පිරිසිදු කිරීමට සිදුවන අතර, ඒ වෙනුවෙන් මාසයකට රුපියල් 10,000 මුදලක්

ඩැනිසන් ලබාගනී. මාසෙ පෝයට සිල් අරගෙන ගමට වී සිටීම සුමනාගේ කැමැත්ත වුවද ඇයට ගමට යාමට හැකියාවක් නොමැති බැවින් ඇය එම ස්ථානයේ වැඩ කරමින් සිටියි.

ඉහත කී නිදර්ශනවල සිටින සිරිපාල, සිල්වා, ප්‍රනාන්දු  අනිල්, ඩයස්, කුමාරි, ඇල්ෆඩ්, විදුර, ලයනල්, අම්ෂා, අනුර, රොඩ්රිගෝ, ලුසියා, ශාන්ත හා ඩැනිසන් යන සියලු පුද්ගලයින් තැනැත්තන් වෙළඳාම් කිරීම (Trafficking) කියන වරද සිදුකරන පුද්ගලයින් හා ඊට ආධාර අනුබල දෙන පුද්ගලයින් වශයෙන් නීතියෙන් හඳුනාගනී.

## මිනිස් ජාවාරම (Human smuggling) හා තැනැත්තන් වෙළඳාම (Human Trafficking)

බොහෝ අවස්ථාවලදී මෙම වැරදි එකම වැරදි ලෙස වරදවා ගනිමින් කටයුතු කිරීමට පෙළඹෙන අවස්ථා නිරීක්ෂණය වන අතර මෙය පැහැදිලිවම වැරදි දෙකක් ලෙස අවබෝධ කරගත යුතුවේ.

මිනිස් ජාවාරම අන්තර්ජාතික මට්ටමෙන් පමණක් සිදුවන වරදක් වන අතර, එහිදී එක් රටකින් තවත් රටකට නීති විරෝධී ලෙස සංක්‍රමණය වීමක් සිදුවිය යුතු අතර එසේ සංක්‍රමණය කරන පුද්ගලයා තමා විසින් නීති විරෝධී ක්‍රියාවක් සිදුකරන බව දැනුවත්ම එම ක්‍රියාවේ නිරත වන අතර, ඒ අනුව නීතිය ඉදිරියේ අපරාධකරුවකු ලෙස හඳුනාගනී. යම් අවස්ථාවලදී කූට ලේඛණ සකස් කිරීම වැනි අපරාධද එම තැනැත්තා විසින් සිදුකර තිබිය හැකියි. එහිදී, ඔහු/ඇය වින්දිතයකු ලෙස නීතිය විසින් හඳුනාගන්නේද නැත.

ගොඩබිමෙන්, මුහුදෙන් හා ගුවනින් සංක්‍රමණයිකයින් ජාවාරමට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රෝටකෝලය (United Nation Protocol against the Smuggling of Migrants by Land, Sea and Air) මගින් මිනිස් ජාවාරමට එරෙහිව ජාත්‍යන්තර ආදර්ශ නීති පද්ධතියක් හඳුන්වාදී ඇත.

මිනිස් ජාවාරම සම්බන්ධයෙන් අන්තර්ජාතික නෛතික ප්‍රතිපාදනවල ප්‍රමිතිය ආවරණය වන පරිදිම සුවිශේෂී නීතියක් දැනට ලංකාවේ හඳුනාගෙන නැති නමුත් 1948 අංක 20 දරණ ආගමන ii විගමන පනතේ 45 වන වගන්තිය ප්‍රකාරව අපරාධකරුවන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කරනු ලබයි.

| මිනිස් වෙළදාම (Human Trafficking) | මිනිස් ජාවාරම (Human smuggling) |
|---|---|
| දේශීයව හා විදේශීයව සිදුවිය හැකියි. රටකින් රටකට සංක්‍රමණයක්වීම අත්‍යවශ්‍ය නොවේ. සංක්‍රමණය නීත්‍යානුකූල විය හැකියි. | අනිවාර්යයෙන්ම රටකින් තවත් රටකට නීතිවිරෝධී සංක්‍රමණයක් පැවතිය යුතුයි. |
| දේශ සීමාව තරණය කරන තැනැත්තා වින්දිතයකු ලෙස නීතිය හඳුනා ගනී. | දේශ සීමාව තරණය කරන තැනැත්තා අපරාධකරුවකු ලෙස නීතිය හඳුනා ගනී. |
| රැවටීමට, තර්ජනයකට, පෙළඹවීමකට, වංචාවකට හෝ එකී තැනැත්තා මුහුණදුන් පීඩාවක් අවභාවිතා කර ඇත. | තමා නීතිවිරෝධී සංක්‍රමණයක් සිදුකරන බව දැනුවත්ව එක රටකින් තවත් රටකට සංක්‍රමණය සිදුකරයි. |
| කැමැත්තෙන් තොරව (දරුවකු නම් කැමැත්ත සලකා නොබලයි) | කැමැත්ත ඇතිව සිදුකරයි. |
| නීතියේ රැකවරණයට ලක්විය යුතුයි. | නීතියෙන් දඬුවම් කළ යුතුයි. |
| පුද්ගලයකුට එරෙහිව සිදුකරන අපරාධයකි. | රාජ්‍යයකට එරෙහිව සිදුකරන අපරාධයකි. |
| අපරාධයක වින්දිතයෙකි. | අපරාධයක කොටස් කරුවෙකි. |

මිනිස් ජාවාරම හා මිනිස් වෙළඳාම අතර පැහැදිලි වෙනස්කම් පහත වගුව ආශ්‍රයෙන් සරලව අවබෝධකර ගත හැකිය.


## තැනැත්තන් වෙළඳාම සමාජයේ පැතිරයාමට හේතු.

- ➢ නොදැනුවත් බව
- ➢ අනාරක්ෂිත බව
- ➢ දුප්පත්කම හා බැඳුන අසරණකම
- ➢ බියගැන්වීම හා බලපෑම් කිරීම
- ➢ මත්ද්‍රව්‍ය හා දුම්පානයට ඇබ්බැහිවීම
- ➢ අවිධිමත් සමාජ මාධ්‍යජාලා භාවිතය
- ➢ ආර්ථික අර්බුදයත් හමුවේ විදේශ රැකියාවලට ඇති ඉල්ලුම
- ➢ දූෂණය

## තැනැත්තන් වෙළඳාම සම්බන්ධ සිදුවීම් දැනුම් දියයුතු රාජ්‍ය ආයතන

- ◆ තැනැත්තන් වෙළදාම සම්බන්ධ ඕනෑම සිදුවීමක් - අපරාධ විමර්ශන දෙපාර්තුමේන්තුව - 0112514374
- ◆ ළමයින් හා කාන්තාවන් වින්දිතයින් බවට පත්වන සිදුවීමක් - ළමා හා කාන්තා කාර්යංශය - 0112 444 444
- ◆ ළමයින් වින්දිතයින් බවට පත්ව ඇති අවස්ථා - ළමා ආරක්ෂණ අධිකාරිය - 1929
- ◆ මිනිසුන් රට යවන ඒජන්සිවල අක්‍රමිකතා - විදේශ සේවා නියුක්ති කාර්යංශය - 1989/0112 864 241/ 0112 864 241
- ◆ ආගමන හා විගමන වැරදි - 0112101500
- ◆ තැනැත්තන් වෙළදාමට එරෙහි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම් යම් රාජ්‍ය ආයතනයක් විසින් පැහැර හැර තිබේනම් හෝ අසාධාරණ ප්‍රමාදයකට ලක්වේනම් - තැනැත්තන් වෙළදාමට එරෙහි ජාතික කාර්යසාධක බලකාය - 076 844 7700

*නීතිඥ මේජර් සදුන් ගුණවර්ධන*
*LL.B (Colombo), LL.M (KDU), Attorney at Law*
*තැනැත්තන් වෙළදාමට එරෙහි ජාතික කාර්යසාධක බලකාය*
*නීති අංශය, ආරක්ෂක අමාත්‍යංශය*



# මහා පරාක්‍රමබාහු රජුටත් අභියෝග කළ සුගලා දේවිය

මෙරට එක්සේසත් කිරීම සඳහා පරාක්‍රමබාහු රජු විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග, ඔහුගේ කාර්යශූරත්වය, රණකාමීත්වය ආදිය පිළිබඳව ඇතැම් අවස්ථාවලදී වංශකතාවේ අතිශයෝක්තියෙන් වර්ණනා වී තිබුණත් රට, ජාතිය හා බුද්ධාගමේ අභිවෘද්ධිය සඳහා පරාක්‍රමබාහු රජු අති විශිෂ්ට සේවාවක් ඉටුකර ඇති බව දැනට පවතින වාරි කර්මාන්ත, ආගමික ගොඩනැගිලි ආදි පුරාවිද්‍යාත්මක අවශේෂ හා ඓතිහාසික මූලාශ්‍ර පිළිබඳ අවධානය යොමු කිරීමේදී ප්‍රත්‍යක්ෂ වේ. දේශය වෙනුවෙන් ඉටුකරන ලද විශාල කාර්යභාරය නිසා මහා (Great) යන ගෞරව පූර්වක විශේෂණයක් සමගින් කීර්තිමත් පාලකයකු ලෙස මහාපරාක්‍රමබාහු රජු ඉතිහාසගත වේ. ඔහුට අමතරව ලක්දිව රජවරුන් අතරින් මහා යන විශේෂ ගෞරව නාමයක් ලබන්නේ මහා විජයබාහු රජතුමා පමණි. එබැවින් ලක්දිව පාලකයින්ගෙන් මහා යන විරුදාවලිය ලබන්නේ මහා විජයබාහු රජතුමා හා මහා පරාක්‍රමබාහු රජු පමණක් බැව් නිශ්චය කිරීම නිදොස්ය. වංශකතාවේ මහා පරාක්‍රමබාහු පිළිබඳව සාකච්ඡා කිරීමට පරිච්ඡේද 18 ක් වෙන් කර ඇති අතර මහා විජයබාහු රජු සඳහා වෙන් වී ඇත්තේ පරිච්ඡේද 4 ක් පමණි. එබැවින් මේ රජවරුන්ගේ කාර්යය සාඵල්‍ය තුලනාත්මකව අධ්‍යයනය කරන විට විජයබාහු රජුට මහාවංශයේ අඩු පරිච්ඡේද ප්‍රමාණයකුත් පරාක්‍රමබාහු රජුට වැඩි ඉඩකඩකුත් වෙන් කොට ඇති බව නොකිවමනාය. ඒ අනුව චූලවංශ කතුවරයා පරාක්‍රමබාහු රජුට විශේෂ අනුග්‍රහයක් දක්වා ඇති බව පහසුවෙන් නිගමනය කළ හැක.

ලක්දිව එක්සත් කොට එහි අගරජු බවට පත්වීම තරුණ පරාක්‍රමබාහුගේ අභිප්‍රාය වූ අතර මුල සිටම ඒ සඳහා සැලසුම් කරමින් ක්‍රියා කළේය. රජරට අත්පත් කර ගැනීම සඳහා පරාක්‍රමබාහු රජු හා දීර්ඝ කාලයක් සටන් කළ මානාභරණ රජු රුහුණේදී මියගිය අතර ඔහුගෙන් පසු රෝහණයේ බලයට පත්වූ එම රජුගේ මෑණියන් වූ සුගලා දේවිය පරාක්‍රමබාහු රජුගේ පාලනයට විරුද්ධව නැගී සිටියාය. රජරට ඇතුළු දිවයිනේ විශාල ප්‍රදේශයක බලය තහවුරු කර ගනිමින් සිටි ශක්තිමත් යුද්ධ සේනාවක් සහිත වූ පරාක්‍රමබාහු රජුට එරෙහිව සටන් කිරීම සඳහා ධෛර්යවන්ත වූ සුගලා දේවිය පිළිබඳ වංශකතාකරුගේ දෘෂ්ටිය ඇය අණුවන කාර්යයක යෙදුන බවයි.

මේ වනවිට දන්ත ධාතූන් වහන්සේ හා පාත්‍රා ධාතූන් වහන්සේ සුගලා දේවිය භාරයේ තිබුණි. ධාතූන් වහන්සේලාගේ භාරකාරත්වය රාජ්‍ය උරුමය තහවුරු කිරීමට අනිවාර්ය වූ හෙයින් ධාතූන් වහන්සේලා අත්පත් කරගැනීමට පරාක්‍රමබාහු රෝහණය ආක්‍රමණය කරන්නට යෙදුනේය. මෙම පූජා වස්තූන් තමා සන්තකයේ නොතිබීම සිය ආධිපත්‍ය සම්පූර්ණ වීමට තිබූ අඩුවක් බව අවබෝධ කරගත් පරාක්‍රමබාහු රජු ඒවා වහාම ලබාගැනීමේ අරමුණින් රුහුණට සේනා මෙහෙය වූවේය. මේ වනවිට සුගලා දේවිය රුහුණේ රත්මලේකන්ද ප්‍රදේශයහි තම ප්‍රධාන බලකොටුව ස්ථාපිත කර තිබුණි. විජයබාහු රජුගේ ළමා කාලය ගෙවෙන මේ කඳුවැටිය මහාවංසයේ හිරනමලය ලෙසත් සුවර්ණමලය ලෙසත් හඳුන්වා ඇති අතර මෙය උරුබොක්ක සමීපයේ පිහිටා තිබේ. ඊට අමතරව සුගලා රැජිණගේ මෙහෙයවීමෙන් රුහුණු වැසියන් බොහෝ ස්ථානවල ශක්ති සම්පන්න බලකොටු ඉදිකොට ඒ වටා අගල් බිඳුවා එහි යකඩ බඳු තියුනු කටු අතුරවා කපා හෙලන ලද ගස්වලින් මාර්ගය දුර්ගම කොට නොයෙක් දහස් ගණන් යෝධයන් යුද පිණිස ආයුධ සන්නාහ ඇතිව අතිශයින් සාහසිකව මගබලා සිටි බව මහාවංසයේ විස්තර වේ.

රුහුණ ආක්‍රමණය සඳහා පරාක්‍රමබාහු රජු විසින් දෙමළ අධිකාරි රක්ඛ සහ කන්චුකී රක්ඛ යන ප්‍රධාන

සෙන්පතින් දෙදෙනා පත්කර යවා තිබේ. රුහුණේ කැරැල්ල මැඩපැවැත්වීම සඳහා එහි යවන ලද රක්ඛ සෙනෙවියාට බරබ්බල ප්‍රදේශයේදී (මහියංගණය අසල) අපේක්ෂා නොකළ යුද්ධයකට මුහුණ දෙන්නට සිදුවිය. එහිදී, රුහුණු වැසියන් හා මහා සේනාව සමග යුද්ධයට පිවිසි ආකාරය වංසකතාවේ දක්වා ඇත්තේ මෙසේය.

"අපි ජීවත් වන්නමෝ අපගේ රාජ්‍ය සීමාව පැන ගෙන මෙහි එන්ට නොදෙම්හයි මහත් බලාත්කාර ක්‍රියා ඇත්තෝ ස්වකීය ජීවිතයේ අපේක්ෂා රහිතව යුද්ධාරම්භයෙහි ඉතා කැමතිව එතැනට පැමිණියහ" (මහාවංසය, 74; 54-56)

කෙසේ වුවද, රක්ඛ සේනාපති මහත් සටනක් කොට එහිදී ජයගත්තේය. අනතුරුව රුහුණ දෙසට ඇදුනු රක්ඛ සේනා විසින් සුගලා දේවියගේ රන්මලේ බලකොටුව ස්ථාපිත ප්‍රදේශය (වර්තමාන කටුවන බලකොටුව ප්‍රදේශය), අම්බලම ආදී ස්ථානවල පිහිටි සතුරු බලකොටු අල්ලාගැනීම සඳහා තවදුරටත් ඉදිරියට ගමන් කළහ.

මිනිස් වාසයෙන් තොර සැතපුම් දෙකේ සිට හතරක් පමණ දක්වා දිගැති වනගත නිම්නයක් වූ මේ ස්ථානය දෙපස මහා පර්වත විය. එහි පිළිවෙළට ඉදිකොට තිබූ බලකොටු අල්ලා ගැනීමට මාස කිහිපයක් තිස්සේ සටන් කළද රක්ඛගේ උත්සාහය ප්‍රතිඵල රහිත විය. මේ ප්‍රමාදය පිළිබඳ නොසතුටු වූ රජු වහාම රක්ඛට ආධාර පිණිස භූත අධිකාරී සමග තවත් සේනාවක් එහි යැව්වේය. ඒ අනුව තම සේනා මෙහෙයවමින් ඉදිරියට ගමන් කළ මේ සෙන්පතින් දෙදෙනා බිබිලේ ප්‍රදේශයට පිවිසියහ. ඉනික්බිති මොනරාගල මාර්ගයේ පිහිටි මජ්ඣිම ගම (මැදගම), කණ්ටකද්වාරවාන (කටුපැලැල්ල) ආදී ස්ථාන ගණනාවක තියුණු සටන් කොට සුගලා බිසවගේ වාසභවනය වූ උදුන්දොරට ළඟා වූ බවත් එහිදී සුගලා බිසව දන්ත ධාතුව හා පාත්‍රා ධාතු රැගෙන මොනරාගලට සැතපුම් අටක් පමණ ගිනිකොන දෙසින් පිහිටි උරුවෙලාවට ගොස් සැඟවුණු බවත් වාර්තා වේ.

මීට සමගාමීව දීඝවාපී ප්‍රදේශයේද සුගලාගේ කඳවුරු ස්ථාපිත කොට තිබූ අතර ඊට පහරදීමට පරාක්‍රමබාහු විසින් වෙනම සේනාංකයක් යොදවන ලදී. මඩකලපුවට සැතපුම් පහක් පමණ උතුරින් පිහිටි එරාවූරයෙන් දීඝවාපී රටට ඇතුළු වූ එම සේනාව සුගලාගේ කඳවුරු වෙත පහර දීමට පටන් ගත්හ. තවද, සුගලා රැජින ධාතූන් වහන්සේලා රැගෙන මෙරටින් පැනයාමට සැලසුමක් ඇති බවද පරාක්‍රමබාහු රජුට ආරංචි විය. සිංහාසනයේ ආධිපත්‍ය ශක්තිමත්වීමට නම් අනිවාර්යයෙන්ම ධාතූන්වහන්සේලා අත්‍යවශ්‍ය වූ හෙයින් එම පූජ්‍ය වස්තූන් පිටරටකට රැගෙන යාම වැළැක්වීම සඳහා රජු වහා ක්‍රියාත්මක විය යුතු බව කල්පනා කළේය. මේ වාතාවරණය යටතේ සුගලා බිසව අත්අඩංගුවට ගැනීමට උරුවේලාව වටකොට සිටින රක්ඛ හා භූත අධිකාරී ද මේ පිළිබඳව දැනුම්වත් කොට එම සේනා ඒකාබද්ධ වී සතුරන් මැදි කරගන්නා ලෙස දීඝවාපි සේනාවේ නායකයා වූ කීර්ති අධිකාරිට උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව පරාක්‍රමබාහුගේ රුහුණේ සිටි සියලුම සේනා ධාතූන්වහන්සේලා රැකගැනීමේ පරම අධිෂ්ඨානයෙන් උරුවේලාව වට කළහ.

තවද, ධාතූන් වහන්සේලා රැගෙන සුගලා මෙරටින් පැනයාමට සැබැවටම සැලසුම් කළා දැයි දැනගන්නට නොමැත. එහෙත් එවැනි දෙයකට රටවාසී සියල්ලෝම විරුද්ධව නැඟීසිටින බව දන්නා පරාක්‍රමබාහු රජු විසින් මෙවැනි ප්‍රචාරයක් කොට සුගලා රැජිණ භාරයේ තිබූ ධාතූන් වහන්සේලා ඉක්මනින් තමා වෙත ලබාගැනීමට මනෝවිද්‍යාත්මක මෙහෙයුමක් ක්‍රියාවට නැංවූයේදැයි අනුමාන කළ හැක. ප්‍රථමයෙන්ම

**ලක්දිව එක්සත් කොට එහි අගරජු බවට පත්වීම තරුණ පරාක්‍රමබාහුගේ අභිප්‍රාය වූ අතර මුල සිටම ඒ සඳහා සැලසුම් කරමින් ක්‍රියා කළේය. රජරට අත්පත් කර ගැනීම සඳහා පරාක්‍රමබාහු රජු හා දීර්ඝ කාලයක් සටන් කළ මානාභරණ රජු රුහුණේදී මියගිය අතර ඔහුගෙන් පසු රෝහණයේ බලයට පත්වූ එම රජුගේ මෑණියන් වූ සුගලා දේවිය පරාක්‍රමබාහු රජුගේ පාලනයට විරුද්ධව නැඟී සිටියාය. රජරට ඇතුළු දිවයිනේ විශාල ප්‍රදේශයක බලය තහවුරු කර ගනිමින් සිටි ශක්තිමත් යුද්ධ සේනාවක් සහිත වූ පරාක්‍රමබාහු රජුට එරෙහිව සටන් කිරීම සඳහා ධෛර්යවන්ත වූ සුගලා දේවිය පිළිබඳ වංශකතාකරුගේ දෘෂ්ටිය ඇය අණුවන කාර්යයක යෙදුන බවයි.**

ධාතූන්වහන්සේලා රටින් බැහැරව ගෙනයාම වැළැක්වීම සඳහා ඔවුන් උරුවෙලාව වටකරන ලදී. එහිදී, එක් සතුරකුටවත් මිදෙන්නට ඒකාන්තයෙන්ම අවසර නොදී සතුරන් පලායන මාර්ගයන්හි ද බලකොටු බන්දවා දෙතුන් ගව් පමණ දුර තැන මාර්ගද යා නොමහැකි කොට සතුරන් වසන ප්‍රදේශයට ආහාර ධාන්‍ය ප්‍රවේශය ද වළකා සියලු සතුරු සේනාවම දුර්වලකොට ඔවුන් විනාශ කිරීමට පහරදෙන ලද බව වංසකතාවේ දැක්වේ. මෙලෙස පරාක්‍රමබාහු රජුගේ සේනා සුගලා සේනා සමග සටන් කොට අවසානයේදී ධාතූන් වහන්සේලා අත්පත් කරගන්නා ලදී. එසේ වුවද, එහිදී සුගලා රැජිණ පලා ගියාය.

මේ අතර මීටපෙර යුද්ධයේදී අත්අඩංගුවට ගෙන සිටි මානාභරණ රජුගේ සූකරභූතදේව නම් සෙනවියා පොළොන්නරුව සිරගෙයින් පලා ගොස් රුහුණේ සපත්ගමුවට වැදී තම පැරණි හමුදා සගයින් සමග එක්වෙමින් කැරැල්ලට නැවත ජීවය ලබා දුන්නේය. මේ සමග රෝහණ හමුදා ධෛර්යයෙන් හා උනන්දුවෙන් සටන් කරන්නට වූයෙන් තත්වය බරපතළ වන බව තේරුම් ගත් පරාක්‍රමබාහු රජ විසින් මංජු අධිකාරී යටතේ තවත් සේනාවක් පොළොන්නරුවෙන් පිටත්කර යවන

ලදුව ඔවුහු සපත්ගමුවට (බදුල්ලෙන් සැතපුම් අටක් පමණ වයඹ දෙසින් පිහිටි හපත්ගමුව) ළගා වී රුහුණු සේනාවන් පලවා හරින ලදී. එහෙත් සූකරහුතදේව අල්ලා ගැනීමට නොහැකි විය. සුගලා රැජිණගේ හමුදා දැන් සූකරහුතදේව විසින් මෙහෙයවන ලද අතර, ධාතූන් වහන්සේලා නැවත ලබාගැනීමේ පරමාර්ථයෙන් ඔවුහු සටන් කළහ. ප්‍රතිසංවිධානය වූ රුහුණු සේනා පරාක්‍රමබාහු සේනාවන්ට තදින් පහර දෙන්නට වූහ. රක්ඛ සේනාපති, භූත අධිකාරි හා කිත්ති අධිකාරි සේනා හස්තසූපයේදී (මොනරාගලට බටහිරෙන්) රෝහණ සේනාවල දැඩි ප්‍රහාරවලට ගොදුරු වූ හෙයින් පරාක්‍රමබාහු සේනා ධාතූන් වහන්සේලා රැගෙන ඔක්කම්පිටිය ප්‍රදේශයට පසුබසින්නට වූහ. රක්ඛ සේනාපති එහිදී රෝගාතුරව මිය ගියේය.

මේ වනවිට ප්‍රබල මට්ටමක සිටි රුහුණු සේනාව සූකරදේව ගේ නායකත්වයෙන් යුතුව ගුප්තහාල ප්‍රදේශයේදී (බුත්තල) පරාක්‍රමබාහුගේ සේනා සමග යුද කළද, ඔවුනට මහාගාම ප්‍රදේශය (තිස්සමහාරාමය) දෙසට පසුබසින්නට සිදුවිය. මේ අයුරින් ධාතූන් වහන්සේලා සටන් බිමේ තැනින් තැනට රැගෙනයාම ආරක්ෂාවට තර්ජනයක් වියහැකි බව කල්පනා කළ පරාක්‍රමබාහු රජු විසින් ධාතූන් වහන්සේලා වහාම පොළොන්නරුවට එවන ලෙස දන්වා යවන ලදී. ඒ අනුව එක් සාමන්තයෙක් භාරයේ පූජා වස්තූන් පොළොන්නරුවට යැවීමට පියවර ගන්නා ලද අතර, රජු මහවැලි ගංතෙරට පැමිණ ධාතූන් වහන්සේලා අගනුවරට වැඩම කරවා දළදා මැදුරේ තැන්පත් කරවූයේය.

ධාතූන් වහන්සේලාගේ සුරක්ෂිතභාවය තහවුරු කරමින් පරාක්‍රමබාහු රජු යුද බිමේ වත්මන් තත්වය හා ඉදිරි යුද සැලසුම් පිළිබඳව හමුදා නායකයින් සමග සාකච්ඡා කරන්නට විය. එහිදී, සතුරන් විසින් අනුගමනය කරන ලද යුද උපක්‍රමාදිය කෙරෙහි විශේෂ අවධානයට යොමු විය. මේ වනවිට සතුරාගේ භූමියට ගොස් සටන් කරන බැවින් තම සේනාවන්ට අවාසිදායක බව අවබෝධ කරගෙන ඒ අනුව සටන් මෙහෙයවන ලදී. යටත් කරගත් ප්‍රදේශවල නැවත කැරලි හටගත් නිසා ඒවා මැඩපැවැත්වීමට භටපිරිස් ස්ථානගත කිරීමත් අත්පත්කරගත් ප්‍රදේශවල බලය තහවුරු කරගැනීම සඳහා මෙන්ම එම ප්‍රදේශවලට සතුරාට නැවත ඇතුල්වීමට නොහැකි අයුරින් අවැසි ආරක්ෂක පියවර ගන්නා ලදී.

මේ අතරතුර කැරලිකරුවන් දීඝවාපි ප්‍රදේශයේ ත්‍රස්ත ක්‍රියාකාරකම් නිර්මාණය කිරීම නිසා එම පෙදෙස ස්වකීය අණසකට ගැනීම සඳහා පරාක්‍රමබාහු සේනාවන්ට දරුණු ලෙස යුද කරන්නට සිදුවිය. එසේ, රුහුණේ නැගෙනහිර ප්‍රදේශය (අටදහස්රට) හා බටහිර පෙදෙස එනම් දොළොස්දහස් රට අල්ලාගැනීම සඳහාද බොහෝ සටන් කළහ. ඉදිරියට ගමන් ගන්නා හමුදා විසින් අත්පත්කර ගන්නා ලද ප්‍රදේශවල බලය පවත්වා ගැනීම සඳහා ඒ ඒ ප්‍රදේශ භාරව නිලධාරීන් පත්කරන ලදී. මේ වනවිට සියලු සේනා ඒකාබද්ධව සටන් පෙරමුණු වශයෙන් ඉදිරියට ඇදෙමින් සතුරා පරාජය කරමින් මහානාගහුල යටත් කරගත් අතර ඉනික්බිතිව මාගම ප්‍රදේශයේ සතුරු කඳවුරු විනාශ කරමින් පහර දෙන්නට වූහ. එහිදී, සුගලා දේවියගේ ප්‍රධාන සෙන්පතියා වූ සූකරභාතුදේව ජීවිතක්ෂයට පත්විය.

පරාක්‍රමබාහු රජුගේ සෙන්පතීන් විසින් තවදුරටත් කැරලිකරුවන් මර්දනය කිරීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කරන ලද අතර, දොළොස්දහස්රටේ බෝධිආවාටකය, මධුත්ථලය (ඌරුබොක්ක අසල මීගොඩ) ආදී ස්ථානවලද ගිරුවාපත්තුවේ හා මාගම්පත්තුවේ සෑම ප්‍රදේශයකම සිටි සතුරන් පරාජය කොට ස්වකීය බලය තහවුරු කොට ඒ බැව් පරාක්‍රමබාහු රජුට දැන්වූහ. ඉන් පසුව සුගලා රැජින අල්ලාගැනීමේ මෙහෙයුම විය. ඒ අනුව දොඹගහවෙල බැද්දේගම (වනගාමය) ප්‍රදේශයේදී පලායමින් සිටි සුගලා දේවිය හා ඇයගේ සේනා සමග තියුණු සටනක් කොට එම දේවිය හා ඇගේ සෙබළුන් අත්අඩංගුවට ගන්නා ලදී. තවද, පලාගිය සුගලා දේවියගේ අනුගාමිකයින් උදුන්දොරිදී අල්ලා ගන්නා ලද අතර ඔවුනට දරුණු වධහිංසා දී ජීවිතක්ෂයට පත් කළ බවත් වාර්තා වේ.

මෙම සටන්වලින් පසුව තවදුරටත් බලය තහවුරු කිරීම සඳහා ඒ ඒ ප්‍රදේශවල හමුදා බළඇණි ස්ථානගත කොට ප්‍රදේශ පාලනය කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් ද රජු විසින් පත්කරන ලදී. තවද, ජීවග්‍රහයෙන් අල්ලා ගන්නා ලද සුගලා දේවි හා ඇයගේ ඇමතින්ද කැටුව ජයග්‍රාහී පරාක්‍රමබාහු සේනා පොළොන්නරුවට පැමිණි අතර රෝහණයේ පාලනය සඳහා භූතඅධිකාරි සෙන්පතියා පත් කරන ලදී.

- *මේජර් සරත් ජයවර්ධන විසින් රචිත "ලක්දිව සංග්‍රාම ඉතිහාසය" ග්‍රන්ථයෙනි.*




## ඔබේ ලිපි/නිර්මාණ අප වෙත එවන්න...

විශේෂාංග රාශියකින් සමන්විත නව මුහුණුවරකින් එළිදක්වන රණවිරුවාහි ඔබගේ ලිපි, නිර්මාණ වෙනුවෙන් වැඩි ඉඩකඩක් වෙන් කෙරේ. ඔබ ඇසූ දුටු අත්විඳි ඕනෑම දෙයක් නිර්මාණශීලීව අප වෙත ලියා එවන්න. එසේ එවනු ලබන කවි, නිසඳැස්, කෙටිකතා, ලිපි හා ඡායාරූප ආදිය (සුදුසු ඒවා) අප්‍රමාදව රණවිරුවාහි පළකිරීමට කටයුතු යොදා ඇත. ඔබේ නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක
"රණවිරුවා"
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.
විද්‍යුත් තැපැල් ලිපිනය - ranaviruwa@yahoo.com



# පාතාල ලෝකයට අවි පතුරොම් ලබාදීම

මෑත කාලයේදී පාතාල ලෝකයේ මැර කල්ලි සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් ඉතාමත් බිහිසුණු සාහසික ක්‍රියාවන් සිදුකරමින් ඇති බව අප කවුරුත් දන්නා සත්‍යයකි. මිනිස් ඝාතන, පැහැර ගැනීම්, මංකොල්ලකෑම්, කප්පම් ගැනීම් හා නීති විරෝධී ජාවාරම් (මත්ද්‍රව්‍ය) වැනි දෑ මින් ප්‍රධානය. දිවයිනේ සිදුවූ මෙවැනි බිහිසුණු අපරාධ පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමේදී ඉන් සැලකිය යුතු ගණනකට ආරක්ෂක හමුදාවෙන් පැනගිය සෙබළුන් සම්බන්ධව ඇති බව අකමැත්තෙන් වුවද පිළිගැනීමට සිදුව ඇත.

එසේම, මෙම අපරාධ සඳහා යොදාගත් අවි ආයුධ හා බෝම්බ වැනි දෑ වැඩි ප්‍රමාණයක් ආරක්ෂක හමුදාවන් භාවිතා කරන ඒවා බවද පරීක්ෂණවලදී හෙළිවී ඇත. එසේනම්, අපට නිගමනය කළ හැක්කේ මෙවැනි දෑ ආරක්ෂක හමුදා සේවයේ නියුතු හෝ සේවයේ යෙදී සිටි ඇතැමුන් විසින් පාතාලය වෙත ලබාදී ඇති බවයි. සමහර විට පාතාල කල්ලි සාමාජිකයින් තම අරමුණ ඉටුකරගැනීමේ අපේක්ෂාවෙන් හමුදා සේවයට එක්වී අරමුණ ඉටුකරගත් පසු සේවය හැර යනවාදැයි සැකයක් හටගනී. එසේ නොවුවද පාතාලය අවි ආයුධවල අවශ්‍යතාවය තදින්ම බලපායි. සමහරවිට මෙම අවි ආයුධවල වටිනාකම මෙන් කිහිප ගුණයක් ගෙවා හෝ ඔවුන් ඒවා ලබාගැනීමට වෙහෙසෙයි. එනිසා තම මාසික වැටුපෙන් කිහිප ගුණයක් එකවර ලබාගත හැකි බව දකින ඇතමෙකු මෙවැනි විනය විරෝධී අපරාධ ක්‍රියාවන්ට යොමුවීමේ ඉඩකඩ පවතී.

එහෙත් තම සුළු වාසිය තකා පාතාලයට මෙවැනි අවි ආයුධ සැපයීමෙන් මුළු මහත් සමාජයටම සිදුවන අනර්ථය පිළිබඳව ඔවුන්ට කිසිදු වැටහීමක් නැත. පාතාල මැර කල්ලි මංකොල්ලකෑම් සඳහා මෙන්ම තම විරුද්ධවාදීන් ඝාතනයටද මෙම අවි ආයුධ යොදා ගනී. ඔවුන්ට ඒ සඳහා තැනක් නොතැනක් වෙලාවක් කලාවක් අවශ්‍ය නැත. කෙසේ හෝ තම අරමුණ ඉටුකර ගැනීමට උත්සාහ දරයි. සමහරවිට ජනාකීර්ණ නගරයකදී වුවද තම විරුද්ධවාදීන් දුටුවිට වෙඩි තබයි. නැතිනම් බෝම්බ ගසයි. මෙහිදී, තුවාල ලබන්නේ මරණයට පත්වන්නේ ඔවුන්ගේ විරුද්ධවාදීන්ම පමණක් නොවේ. ඒ අසල සිටින අහිංසකයින්, හයක් හතරක් නොදන්නා කිරිදරුවන් පවා මිය යා හැක. නැතිනම් සදාකාලික ආබාධිතයින් බවට පත්විය හැක. සමහරවිට පාතාල කල්ලි වෙත මෙම අවි ආයුධ ලබාදුන් පුද්ගලයාගේ ඥාතියකු, සොහොයුරකු හෝ එම පුද්ගලයා වුවද ඒ අවස්ථාවේ ඒ අසල සිටිය හැක. එසේ නම්, ඔහුටද සිදුවන්නේ ඊට ගොදුරුවීමය. එසේම, සමහරවිට මෙම අපරාධ වැළැක්වීමට යන ආරක්ෂක අංශවලට එරෙහිවද පාතාලය විසින් මෙම අවි ආයුධ යොදාගනු නිසැකය. එනිසා සිහි තබාගන්න. සුළු වාසි තකා පහත් ක්‍රියාවන්ට යොමු නොවී දුරදර්ශීව සිතන්න. එසේම, එවැනි වරදකට හසුවුවහොත් දීර්ඝකාලීන සිර දඬුවම් විඳිමින් ඔබගේ ජීවිතය ද ඔබගේ සමස්ත පවුලම ද අනාථභාවයට පත්වන බව සිහි තබාගන්න.

එසේ සිදුකරන පහත් ක්‍රියාවන්ගෙන් මුළු මහත් සමාජයටම සිදුවන හානිය පිළිබඳව ගැඹුරින් සිතන්න. සමාජය යහමගට ගැනීම තනි පුද්ගලයකුට කළ නොහැක. එහෙත්, තමා පාලනය කර ගැනීම අසීරු නොවේ. තම තමන් තනි තනිව යහමගට පෙළඹුනහොත් සමාජයද නොදැනුවත්ම යහමගට යොමුවනු ඇත. එනිසා ඔබ කුමන සමාජ, ආර්ථික පසුබිමක සිටියද නිල ඇඳුමේ විනය පිරිහෙන්නට නොදී හමුදාවේ ගෞරවය රැකීම ඔබ සතු පරම යුතුකම හා වගකීම බව සිහි තබාගන්න.

■ සටහන :
සෙ/13394 ඩී/සැරයන් ප්‍රීතිකුමාර ජේඊආර්
6 ශ්‍රීලපාහ




## අපි ආ මග...

සුව යහනින් බැස කුමරකු
රජ බොජුනකි වලඳන්නේ
රසඳ බලනවද කුමරුනී
නුඹ ගැන සිත වැළපෙන්නේ
නෙතග කඳුළු කැට තෙරපෙයි
හදින් නැගෙන මැසිවිල්ලේ
මිනිසුනි මේ අපේ ලොවද
මනුස්සකම හිනැහෙන්නේ
පාට පාට හීන ලෝක
හදවත ගැඹුරින්ම ලියා
ගාට ගාට නුඹ යන හැටි
දෙනෙතට කඳුලකුත් උනා
ආදරයට සඳ වලියට
කවි ගී පද ලියුව මෙමා
සියක් වරක් හැරී බැලුවේ
අපි ආ මග හරිද කියා

මේජර් ගිහාන් හේවානායක
ප්‍රමානි 11 මව්මෙ
ආසේමු (වන්නි)

## මව්පිය සිහිනය...

තාත්තා කොටන් අඳින අලියකු මස
දළ ඇතකු නොවන හින්දා...
අම්මගේ ඇවැද්දේ වංගෙඩි මිරිස්ගල් මස
ගොඩ මඩ අක්කර නොතිබ්බව හින්දා...
අපිව ඉස්කෝලෙ නොකඩවා යවා
ටයි සාර් උපාධිවල හීන දැක්කා...
ඉන්නවා නම් යම් තැනක අද මා ඒ
නුඹලාගේ සිහිනේම හින්දා...

සෙ/ශු101290
ලා/කෝ අබේරත්න පිපිවම්පේ

## මතකය...

මේ ජීවතේදී බොහෝ දෙනා
හමුවෙති ලංවෙති එක්වෙති
ඇතමුන් සමුගනිති රැඳෙති
ඈතට යති...
ඒත් දිනෙක එන්නෝද
යන්නෝද හමුවෙන්නෝද
දිනෙක යන්නම යති...
අවසානයේ මේ දිවියට
ඉතිරි වන්නේ මතකයන්
ගොන්නකි...

සෙ/531616
සාසෙ කුමාර එන්වම්සි
4 විපාරෙ

## සැනසීම...

සතුට නොව සැනසීම හොයන්න
මන්ද, සතුට කරන දෙයකින් පවා
ලබාගත හැකි උවද,
සැනසීම ලැබෙන්නේ යහපත් දෙයින් පමණි

සෙ/516160
කෝප්‍රල් රණසිංහ ආර්පියුවස්

## අම්මා...

පහන් තරුව මත
සෙනෙහස් ඔරුවක
සසර දියඹ මැද
සුසුම් සසැලෙන...
සිලිලාරය ඔබ
දිය දාරාවක
සසර කරන මැද
දුක් හේතු සනසන
කඳුළු පලස මම
පෙම් යහන වසා ඉකිලෙන හදවත
සිහින සතපවන
අඳුරු වලාවක
වැහිදිය බිඳ ඔබ
මොහොතක් ලග හිඳ
සිහිනෙන් වියැකෙන...

සෙ/526151
කෝප්‍රල් චමින්ද කුමාර පේ
4 විපාරෙ

## නපුරුකම් ඉවසුවා ඇති තරම්...

හිනෙකින්වත් නුඹට වරදක් නොකළත්
හැමදාම නුඹ මාව සැකකරා
ආදරේ ඉස්සරහ නුඹේ සැර වචන
මාව හැමදාමත් අසරණ කළා
ඒ හැමදේම ඉවසන හිත දවසක නවතියි
නුඹෙ නපුරුකම් ඉවසන්න බැරි නිසා
ගානක්ම නැතිවෙයි නුඹට මං නෑ කියා
නවතියි වෙන හිතක් ලග
මට වඩා හොඳ යැයි සිතා
දෙන්නම් එක අවවාදයක්
එපා කවදාවත් කරන්න ඔහුට නපුරුකම්
ඉවසන එකක් නෑ කවුරුත්
මං තරම් නුඹේ බැනුම්...

සෙ/21ඕ00470
කෝප්‍රල් පතිරණ පිවන්ජ්
17(සෙව) ශ්‍රීලපාහ

## යහලුකම්...

කැමති අය කොපමණ මුණ ගැහුණත්
අපිව තේරුම් ගන්න අය
හමුවන්නේ කලාතුරකින්
මඩගොඩැලි නැති සුන්දර නැති
යාලුකම් හරි කම්මැලි
රණ්ඩු සරුවල් නැති ගහ ගැනිලි නැති
දාට උන් හරි දුර වගේ
ඇසුත් රතුවෙන විහිළු තහලුත්
ජීවිතයට ඕනමයි
මොනදේ උනත් අතැර නොයන
යාලුකම් හරි සුන්දරයි...

සෙ/528828
පාසෙ ධනපාල ඩීවම්ඩිකේ

## රණවිරු පුත්තු...

රටක් රකින්නට රන් වැටක් උනේ
කැපකර මුළු දිවියම තුරුනු වියේ
බෝම්බයට ගිනි අවියට කිසිම දිනේ
නසින්නට බෑ මගේ පුතා කිසිම දිනේ...

කුසින් වදා මෙලොවට නුඹ ජනිත කළේ
රටට ලොවට බරක් වෙන්න නොවේ
තමන් නසා අනුන් රකින් පුතුන් ලොවේ
ජාති ජාතිත් පතනවා අම්මා නුඹේ...

සෙ/100069
කෝප්‍රල් චතුරංග ඒඩබ්ලිවබ්
7 ශ්‍රීලසසබ

## පින...

පින කුඩා යැයි නොසිතන්න
එක් මලක් පූජාකළ අය පවා
තවමත් දෙව්ලොව සිටි
එනිසා සුවවෙන් හෝ පිං කරන්න

සෙ/516636
කෝප්‍රල් පුෂ්පකුමාර ඒවම්සි

## ඇත්තු වගේ පුත්තු...

අදත් ආවේ තනියම මම - නොගෙන බැරි හින්දා බෙහෙත් ටික
වෙලාවට උඹ මෙතන උන්නේ - ඇවිද යන්නත් වාරු නෑ මට
අනේ ඔහොමම අතින් අල්ලන් - එක්ක පලයං පුතේ එළියට
වාරු දෙන්නට කෙනෙක් නෑ මට - ගෙදර ඉන්නේ මමත් තනියම

නිල ඇඳුම් ඇඳ ඇත් පැටව් දැක - ආදරේ මගෙ හිතේ පිරුණා
පුතේ කාලෙක පටන් හංගපු - කතාවක් මගෙ ළඟත් තිබුණා
මමත් ඇත් පැටවකුගෙ අම්මෙක් - ඌත් නිල ඇඳුමක් පැලැන්දූ
ඌ වගේ හැඩ උස මහත රුව - උඹේ ඇතුළෙත් ඌව පෙනුණා

නැතත් සුදු නෙලුමක් හොඬය අග - සුදුපාට පොඩි ඇතෙක් දැක්කා
දකුණු ඇලයෙන් කුසට වැදිලා - පුතේ ඌ මට අම්මා කිව්වා
සත් නෙලුම් සල් උයන් නැතුවට - උගෙ පිනට මගෙ පපුව පිරුණා
හුගක් ලස්සන දළ ඇතෙක් මගෙ - තුරුල්ලට එක් දිනක වැඩියා

යාල් පානම් බිමේ සැරටම - යුද්ධ ගින්දර ඇවිලිච්ච කල
උසස් පෙල ලිව් විගස ඌටත් - ඕන උනෙ බං රට රකින්නට
පුතේ ඌ මගෙ එකම දරුවා - වෙන මොකෙක්වත් හිටියෙ නෑ මට
ඒත් මම හිත හදාගත්තා - ආම් යන්නම ඕනේ කිව්වා

ඉතිං ඉල්මහ උදේ වරුවක - මගේ දෙපයම නැමදලා
අම්මෙ එහෙනම් ගිහින් එන්නං - කියා ඌ යන්නම ගියා
උජාරුව පපු ගැඹුරෙ පුරවං - නිල ඇඳුම ඇඳ අවි දරා
උතුරුකරයට පය තියන්නැති - බයක් නොදැනෙන හිත නිසා

ඉස්කෝලෙ හිටි දඟම කොල්ලා - ඒත් උගෙ හිත හරි හොඳයි
ටිවලා ලොකු සර්ලා හෙම - ඌට හරියට ආදරෙයි
පුතා යුද්දෙට ගියා කිව්වම - උන්දැලාටත් හරි දුකයි
මටත් ලියුමක් උගෙන් ආවේ - මාස තුනකට එකවරයි

දෙතුන් වටයක් නිවාඩුවකට - ආව ඌ මං බලා යන්නට
කලු ගැහී හරි කෙට්ටුවීලා - අඳුර ගන්නත් බැරිම තරමට
තුරුලු කරගෙන ළඟට අරගෙන - බත් කටක් මං රසට කැව්වම
මාත් එක්කලා ඌත් ඇඬුවේ - මාව අත්හැර යන්න බැරිකොට

එදා අවුරුදු දෙකත් පිරුණා - එතරමයි හමුදාවෙ ගෙවිලා
උගේ අන්තිම ලියුමෙ තිබුණේ - තාම මුලතිව් බවක් කියලා
මාස පහ හය බොඳකරන් ඇස් - තොරතුරක් මඟබලන් ඉඳලා
අනේ ඌ රැකදෙන්න කියලයි - හැමදාම මම බුදුන් වැන්දේ

වෙසක් පෝයට දවස් හතරක් - තියා හෙණ මැද අහස ඇඬුවා
මමත් නොහිතුව ගොම්මනේ ඌ - ඇත්තමයි බං ගෙදර ආවා
සිංහ කොඩියක් වැහුණු පෙට්ටියෙ - ලස්සනට ඌ නිදා සිටියා
උගේ පපුවේ වම් පැත්ත මැද - නිල ඇඳුම යට මහලා තිබුණා

හෙටට ඌ සුරලොව ගිහිල්ලත් - වසර විස්සක් පිරෙනවා
නේන බව දැන දැනම තවමත් - මං තවම මඟ බලනවා
පුතේ අහපං පොඩි කතාවක් - මටත් ඇහිලා තියෙනවා
ඇත්තු වාගේ පුත්තු හැදුවම - අම්මලාට පිං පිරෙනවා

ලුතිනන් කර්නල් ඩබ්ලිව්එස්ඩී ප්‍රනාන්දු ඊටීඩී එල්එස්සී
සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය - යුහමු

## අවංක මිතුරා...

මචං... සමහර වෙලාවට
මට උඹව ඉන්න තැනින්
උඩට ගන්න බැරි වෙන්න පුලුවන්...
ඒත්, මන් උඹව
වැටෙන්න දෙන්නෙ නෑ
ඒ... උඹ මගෙ යාලුවා හින්දා

සෙ/522342
කෝප්‍රල් විතානගේ කේවීඩීවල්වව

## සිතන්න...

දවසක් ඒව උඹ ආදරය කරන
දෙමාපියන් බිරිඳ සමඟ දරුවන්
මිතුරු හිතවතුන් අසල්වැසියන්
උඹේ කැමැත්තෙන් නොවුනත් දාල යන

අජන්ත හේරත්
අයවැය හා මූපඅම

## මුර කුටිය...

පියාසලා නිල් අහසේ ඉගිලී යන
කුරුල්ලන් දෙසයි මගෙ සිත ඇදීගෙන
නිදහස කියන දේ නැත මා අහලක
සිත බැඳ තබා ඇත වටකර කම්බි වැට
ජීවිතේ සුන්දර වටිනා යෞවන කාලේ
කැප කරන්නෙමි මව්බිම ජාතිය වෙනුවෙන් අපගේ
රැගෙන ගිණි අවි රැගෙන ඇතින්
දිවා රැයේ ටික ටික ජීවිතේ ගෙවිලා යයි මුර කුටියේ

සෙ/159453
මා/සැරයන් රුවන් කුමාර එච්පීඅයි
10 ශ්‍රීලකාහ

## ජීවිතය...

වටිනාම ළමා කාලේ වටිනාකම දැනෙන්නේ
ඒ කාලෙන් අපි හුගක් ඈතට ආවට පස්සේ...
තරුණ කාලෙ කොයිතරම් සුන්දරද කියලා දැනෙන්නේ
ඒ කාලේ ගෙවිල ඉවරයි කියල තේරුම් ගියාට පස්සේ...
ජීවිතේ කොයිතරම් වටිනවද කියලා තේරෙන්නේ
ජීවිතේ ගෙවිල ඉවරවෙන්න ලංවුනාට පස්සේ...
මොන දේක උනත් වටිනාකම තදින්ම දැනෙන්නේ
ඒ දේවල් අපෙන් සදහටම ඈතට ගියාට පස්සේ...

සෙ/167000
තුසෙ සූරියආරච්චි කේබී
11 ශ්‍රීලකාහ (ආධාරක)

## මතක සැමරුම්...

අතීතය මත ලියූ හිතක දුක සටහන්
පරණ වූ පෙම් හීන ගොඩගද්දී කඳුලින්
නාඬන්න කියා මගෙ හිස සෙමින් සිඹිමින්
කියද්දී හැඳින්නෙමි නුඹේ පෙම මැනවින්

උරහිසේ හිස තියා ඉකිලද්දී ශෝකෙන්
පරණ පෙම් කතන්දර මත ඇන්ද සටහන්
වළලන්න ඒ කඳුළු කියා නුඹ සෙනෙහෙන්
කියූ එක ප්‍රේමයයි හිත නිවන ගැඹුරින්

ඇතැම් විට රිදවද්දී මතකවල සටහන්
කඳුළු මත ලියවෙද්දී ඒ මතක සැමරුම්
නිහඬවම සුසුමකට තියා එක හැඟුමක්
හිස සිඹින නුඹ තරම් හිඳිවිද කවුරුත්

සෙ/369738
කෝප්‍රල් දිවශාන්ත ඩබ්ලිව්එම්යූ ආර්එස්පී



# කෙළිබිමේ

## පැ විරු හපන්කම්





## ආසියානු ක්‍රීඩා උළෙලේදී යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ලෝකඩ පදක්කම් දිනාගනිමින් නව වාර්තා අතරට එක්විය



චීනයේ පැවති ආසියානු ක්‍රීඩා උළෙලට සහභාගි වූ ශ්‍රී ලංකා යුද හමුදා කාන්තා බලකායේ සැරයන් නදීෂා රාමනායක ඉකුත් ඔක්තෝබර් 04 වන දින පස්වරුවේ පැවැති මීටර් 4 X 400 සහය දිවීමේ කාන්තා ඉසව්වෙන් ලෝකඩ පදක්කමක් දිනා ගැනීමට සමත් වූවාය.

සැරයන් නදීෂා රාමනායක සෙසු ක්‍රීඩිකාවන්ට ප්‍රබල අභියෝගයක් එල්ල කරමින් මිනිත්තු 3.30.88 ක් ගත කරමින් වට හතරකින් සමන්විත සහය දිවීමේ ඉසව්ව අවසන් කරමින් තෙවැනි ස්ථානය ලබා ගත්තාය. සහය දිවීමේ තරගයට ශ්‍රී ලංකාවෙන් ජයේෂි උත්තරා, ලක්ෂිමා මෙන්ඩිස් සහ තරුෂි කරුණාරත්න එක්ව සිටියහ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මාණ්ඩලික සැරයන් කාලිංග කුමාරගේ, සැරයන් අරුණ දර්ශන, කෝප්‍රල් රාජිත රාජකරුණා සහ ලාන්ස් බොම්බාඩියර් පබසර නිකු "ආසියානු ක්‍රීඩා උළෙලේ" මීටර් 4 X 400 පිරිමි සහය දිවීමේ ඉසව්ව මිනිත්තු 3.02.55 කින් නිමා කර ලෝකඩ පදක්කමක් දිනා ගනිමින් ශ්‍රී ලංකාවට තවත් නව වාර්තාවක් ගෙන දුන්හ.

## යුද්ධ හමුදා මලල ක්‍රීඩිකාවට හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන්

# රිදී පදක්කමක්

චීනයේ *Hangzhou* හි පැවැත්වුනු ආසියානු ක්‍රීඩා උළෙලේදී වසර 17කට පසු නව ශ්‍රී ලංකා වාර්තාවක් තබමින් 2 (සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ සැරයන් නදීෂා ලේකම්ගේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ මීටර් 61.57 ක දුරක් වාර්තා කරමින් රිදී පදක්කම දිනා ගැනීමට සමත් වූවාය. ආසියානු ඔලිම්පික් කවුන්සිලයේ සාමාජික රටවල් 45 ක් නියෝජනය කරමින් 19 වැනි ආසියානු ක්‍රීඩා උළෙල ක්‍රීඩක ක්‍රීඩිකාවන් 12,000 කට වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් චීනයේ හැංෂෝ *'Hangzhou'* නගරයේ පැවැත්විණ.









# ලේටන් කුසලාන බොක්සිං තරගාවලියේදී යුද්ධ හමුදාවට රන් පදක්කම් 11

සුගතදාස, ශාහස්ර ක්‍රීඩාංගණයේදී පසුගියදා පැවති ලේටන් කුසලාන බොක්සිං තරගාවලිය සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා බොක්සිං ක්‍රීඩක ක්‍රීඩිකාවෝ රන් පදක්කම් 11 ක්, රිදී පදක්කම් 06ක් සහ ලෝකඩ පදක්කම් 15 ක් දිනා ගනිමින් ජයග්‍රාහී ලෙස තරගාවලිය අවසන් කළහ. ත්‍රිවිධ හමුදා බොක්සිං කණ්ඩායම් ඇතුළුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ බොක්සිං ක්‍රීඩා සමාජවල සහභාගිත්වයෙන් තරගාවලිය ඔක්තෝබර් මස 01 දින සිට 04 දින දක්වා පැවැත්විණි.

ලේටන් කුසලාන බොක්සිං තරගාවලිය ශ්‍රී ලංකා බොක්සිං සංගමය මගින් සංවිධානය කරනු ලබන ප්‍රධානතම ජාතික බොක්සිං තරගාවලියකි. යුද්ධ හමුදාව නියෝජනය කරමින් බොක්සිං ක්‍රීඩක ක්‍රීඩිකාවන් 44 දෙනකු ඊට සහභාගී වූ අතර, එහිදී බොක්සිං ක්‍රීඩකයින් රන් පදක්කම් 08 ක්, රිදී පදක්කම් 04 ක් සහ ලෝකඩ පදක්කම් 13 ක් දිනාගත් අතර, බොක්සිං ක්‍රීඩිකාවන් අවසන් මහා තරගයේදී රන් පදක්කම් 03 ක්, රිදී පදක්කම් 02 ක් සහ ලෝකඩ පදක්කම් 02 ක් දිනා ගැනීමට සමත් වූහ. කාන්තා අංශයේ දක්ෂතම ක්‍රීඩිකාව ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කාන්තා සෙබළ පෙරේරා එච්කේඑන්එම් සම්මාන ලැබුවාය.



# *'National Masters Snooker'* තරගාවලිය - 2023 ශූරතාවය යුද්ධ හමුදාවට



*'National Masters Snooker'* තරගාවලිය - 2023, කොළඹ ශාහස්ර බිලියඩ් සහ ස්නූකර් ක්‍රීඩා පිටියේදී ඉකුත් ඔක්තෝබර් මස 14 වන දින පැවැත්විණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා බිලියඩ් සහ ස්නූකර් සංගමය විසින් සංවිධානය කරන ලද මෙම තරගාවලියේ ශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ලාන්ස් කෝප්‍රල් මුබින් එම්එම් විසින් හිමිකර ගැනීමට සමත්විය.

# Thunder Strike Katukurunda - 2023





ශ්‍රී ලංකා මෝටර් රථ හා යතුරුපැදි ධාවකයන්ගේ සංගමය මගින් සංවිධානය කරනු ලැබූ **'Thunder Strike Katukurunda - 2023'** තරගාවලිය ඉකුත් සැප්තැම්බර් මස 24 වන දින කටුකුරුන්ද මෝටර් රථ ධාවන පථයේදී පැවැත්විණ. එම තරගාවලියේ **Supermotard 250/450 cc** විවෘත කාණ්ඩය සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ කෝප්‍රල් මදුරංග බීඅයි ප්‍රථම ස්ථානය දිනාගැනීමට සමත්විය. ත්‍රිවිධ හමුදාව නියෝජනය කරන තරඟකරුවන් සහ දිවයිනේ විවිධ ක්‍රීඩා සමාජ නියෝජනය කරන ධාවකයින් 60 කට අධික පිරිසක් මේ සඳහා සහභාගී වූහ.

# අන්තර් රෙජිමේන්තු නෙට්බෝල් කණ්ඩායම් ශූරතාවය - 2023





අන්තර් රෙජිමේන්තු නෙට්බෝල් කණ්ඩායම් ශූරතාවලිය - 2023 අවසන් මහා තරගය ඉකුත් සැප්තැම්බර් මස 22 වන දින පනාගොඩ යුද හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. මෙම ශූරතා තරගාවලිය සඳහා සංඥා බලකාය, යුද්ධ හමුදා වෛද්‍ය බලකාය, යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය, යුද්ධ හමුදා පොදු සේවා බලකා කණ්ඩායම් සහ යුද්ධ හමුදා කාන්තා බලකායේ කණ්ඩායම් දෙකක් ඇතුළුව කණ්ඩායම් 6 ක් තරග වැදුණි. ශූරතාවය ලබාගත් කණ්ඩායම සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති විසින් සිය සුභ පැතුම් පිරිනැමූ අතර එහිදී ජයග්‍රාහී කණ්ඩායම් සඳහා ශූරතා කුසලානය සහ අනෙකුත් කුසලතා සම්මාන ද ප්‍රදානය කෙරිණ.

## 22 වන පාබල සේනාංක අත්පන්දු අභියෝගතා කුසලානය - 2023

22 වන පාබල සේනාංක මූලස්ථානය හා ඒ යටතේ පාලනය වන සේනාංක/ඒකක අතර, අත්පන්දු අභියෝගතා කුසලානය පසුගිය ඔක්තෝබර් මස 10 වන දින 5 (සෙව්) ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා කඳවුරු අත්පන්දු පිටියේදී පැවැත්විණ.




22 වන පාබල සේනාංකය වෙතින් පවත්වන ලද මෙම තරගාවලිය සඳහා එම සේනාංකය, 221, 222 හා 223 වන පාබල බලසේනා, 6 ශ්‍රීලසසබ, 15 ශ්‍රීලපාහ, 20 ගරෙ, 9 විපාරෙ, 5 (සෙව්) ශ්‍රීලකාහ හා 2 (සෙව්) ගරෙ වෙතින් කණ්ඩායම් සහභාගී වූහ. තෙදිනක් පුරා පවත්වන ලද මෙම තරගාවලියෙහි අවසන් වටය සඳහා 6 ශ්‍රීලසසබ හා 5 (සෙව්) ශ්‍රීලකාහ යන ඒකක කණ්ඩායම් තේරීපත් වූ අතර, එහිදී 3 - 2 ලෙස, 5 (සෙව්) ශ්‍රීලකාහ කණ්ඩායම ජයග්‍රහණය හිමිකර ගත්තේය. එම තරගාවලියෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් 22 පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී සහභාගී විය.

## සංචාරයක මතක සටහන්





74 වන යුද්ධ හමුදා සංවත්සර දිනයට සමගාමීව අභිමංසල 2 සුවසහන නිකේතනයෙහි රණසිහිනයට පත් රණවිරුවන්ගේ සුවදුක් විමසීම සඳහා 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ජ්පේඑන් රණසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියු, 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් සීඑස් මුණසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිජී, 613 වන පාබල බලසේනාධිපති කර්නල් කේජ්ඩීඑන්ආර් කංනන්ගර ආර්එස්පී අයිජී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිපදෙනකු ඉකුත් සැප්තැම්බර් 27 වන දින සංචාරයක නිරතවූහ. එහිදී රණසිහිනයට පත් එම රණවිරුවන් හට තෑගි පාර්සල් ලබාදීමටද කටයුතු කෙරිණ.

## සුහද හමුවක මතක සටහන්

61 වන පාබල සේනාංක බලප්‍රදේශයේ ස්ථානගත දකුණු නාවික විධානයේ ආඥාපති රියර් අද්මිරාල් ඩබ්ලිව්ඩීසියු කුමාරසිංහ ආර්එස්පී" යූඑස්පී එන්ඩීසී පීඑස්ඩී ඉකුත් සැප්තැම්බර් 19 වන දින 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ජ්පේඑන් රණසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී හමුවිය.



# රණවිරුවා





**අධීක්ෂණය**

මේජර් ජෙනරාල්
කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී



**උපදේශකත්වය**

කර්නල්
ආර්එම්එච්පීකේ රත්නායක



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්එල්යූ ලක්ෂිකා

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**
සෙ/752158 බනි II සේනාරත්න ජීසී 3 ඉසෙරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑම් 11 ඉසෙරෙ

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**
රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර

**ඊමේල්**
dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**
011 2993076


**යුහ දිගුව**
51445/51446

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය

# දිගුදුර මුර සංචාර පාඨමාලා අංක - 18

# විසිරයාමේ පෙළපාලිය



3 වන කමාන්ඩෝ රෙජිමේන්තුව හා කරෙව්සංපපුපා අධීක්ෂණය යටතේ පුහුණුව ලද දිගුදුර මුර සංචාර පාඨමාලා අංක 18 හි විසිරයාමේ පෙළපාලිය ඉකුත් ඔක්තෝබර් 03 වන දින 3 වන කමාන්ඩෝ රෙජිමේන්තු සරබ භූමියේදී පැවැත්විණ. එම විසිරයාමේ පෙළපාලියට 53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති හා කමාන්ඩෝ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ප්‍රධානත්වය දැරීය.

මෙහිදී දිගුදුර මුර සංචාර පාඨමාලා අංක 18 සාර්ථකව හැදෑරූ නිලධාරීන් 02 ක් සහ සෙසුනිලයින් 109 ක් දිගුදුර මුර සංචාර නිල ලාංඡන පැළඳ විසිර ගියහ. පාඨමාලාවේ හොඳම මංපෙත් සොයන්නා සහ සෑම අතින්ම අතිශූර දිගුදුර මුර සංචාර සෙබළාට හිමි සම්මානය නි/71877 ලුතිනන් එම්එස් ඉසුරංග විසින් හිමිකරගත් අතර, හොඳම අවදෙනාගේ ඛණ්ඩය ලෙස 104 - **A** ඛණ්ඩය කුසලතාවය හිමිකරගන්නා ලදී. මෙම අවස්ථාවට කමාන්ඩෝ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු රෙජිමේන්තු නිලධාරීන් සහ සෙසුනිලයෝ රැසක් සහභාගී වූහ.





## "විශේෂ බලකා මූලික පුහුණු පාඨමාලා අංක - 54"

# විසිරගිය අභිමානය





මාදුරුඔය විශේෂ බලකා පුහුණු පාසල් පරිශ්‍රයේ පැවති "විශේෂ බලකා මූලික පුහුණු පාඨමාලා අංක - 54" සාර්ථකව හැදෑරූ නිලධාරීන් 7 දෙනෙක් සහ සෙසුනිලයෝ 113 දෙනක් පසුගිය ඔක්තෝබර් මස 21 වන දින එම පුහුණු පාසල් පරිශ්‍රයේදී විසිරයනු ලැබූහ. විශේෂ බලකා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ආර්පීඑස් ප්‍රසාද් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විශේෂ බලකා පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් ඩීඑස් හොරවලවිතාන ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස විශේෂ බලකායේ බලකාධිපති සහ 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී සහභාගී විය.

විසිරගිය පාඨමාලාවේ හොඳම ශාරීරික යෝග්‍යතාවයෙන් හෙබි සෙබලා සහ හොඳම ශිෂ්‍යයා ලෙස දෙවන ලුතිනන් අයිකේජීඑස්ඩී බණ්ඩාර සම්මාන දිනාගත්තේය. එමෙන්ම, දක්ෂතම වෙඩික්කරු ලෙස දෙවන ලුතිනන් එච්එම්එස් තුෂාන් ද පාඨමාලා අංක - 54 හි දක්ෂතම ශිෂ්‍යයාට හිමි සම්මානය දෙවන ලුතිනන් ආර්ඩබ්ලිව්ඩීඑස් වලිකුඹුර ද හිමිකරගත්හ. 11, 23 හා 58 වන පාබල සේනාංකයන්හි සේනාංකාධිපතිවරුන්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සේනාවිධායක, ගමන් පාලන අධ්‍යක්ෂ, විශේෂ බලකා බලසේනාවේ බලසේනාධිපති සහභාගී වූහ.

# මේ අභිමානයේ පිවිසුමෙන් එතෙර වන්න

මේ පිවිසුමෙන් හිස ඔසවන කිසිවකුත් දිවි හිමියෙන් මේ රට සුරකින බවට දුන් පොරොන්දු කඩ නොකළේය. එය ඉතිහාසයට සේම අද දා හෙට දා වලංගුය. ඔබත් මේ ගෞරවනීය පිවිසුමෙන් එතෙර වන ජවබල පිරි තාරුණ්‍යයේ ආඩම්බරකාර කොටස්කරුවකු වන්න.

